ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 2024

වාර්ෂික වාර්තාව 2024

පටුන

- **සම්බන්ධීකරණ තොරතුරු 02**
- **දැක්ම සහ මෙහෙවර** 03
- **සංස්ථාමය තොරතුරු** ..... 04 – 07
- **සභාපතිතුමාගේ සමාලෝචනය** ..... 08 – 10
- **සංස්ථාපිත පසුබිම** ..... 11 – 36
- **සංස්ථා තේ** ..... 37 – 39
- **රබර් නිෂ්පාදනය** 40
- **භාණ්ඩාගාර ප්‍රතිපාදන / වෙන් කිරීම්** 41
- **සංසන්දනාත්මක මූල්‍ය කාර්ය සාධනය (2023 – 2024)** 42
- **මානව සම්පත් කළමනාකරණය** 43-46
- **මූල්‍ය වාර්තා** 47
- **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය** 48
- **ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ආදායම් වාර්තාව)** 49
- **හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය** 50
- **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** 51
- **ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්** ..... 52 –69
- **විගණකාධිපති වාර්තාව** ..... 70 – 79
- **විගණන පිළිතුරු** 80-93



ප්‍රධාන කාර්යාලය
අංක 257, ශ්‍රී ධම්ම මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන: 011 5757539

(ෆැක්ස්): 011 2438635

ප්‍රාදේශීය කාර්යාලය

හුන්නස්ගිරිය, ඇල්කඩුව.

දුරකථන: 0547285353 විද්‍යුත් තැපෑල:
regionalofficegp@gmail.com

විගණකවරුන්
විඟණකාධිපති නොා. 306/72,
පොල්දූව පාර, බත්තරමුල්ල.

දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රබලතම වාණිජ ව්‍යවසායකත්ව ආයතනය බවට පත්වීම.

මෙහෙවර

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක සහභාගීත්වයෙන් නිසි කළමනාකරණය කරමින් රටේ දේශීය නිෂ්පාදනයට සහ වතු සේවක පවුල්වල සහ අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට උපරිම දායකත්වය ලබා දීම.



අධ්‍යක්ෂ මණ්ඩලය - 2024




කළමණාකරණය කාර්ය මණ්ඩලය - ප්‍රධාන කාර්යාලය 2024

අංකය	නම	තනතුර
1	නීතිඥ ඩබ්.ආර්.ජී.සනත් බණ්ඩාර මහතා	සභාපති (2024.03.04 සිට 2024.09.06 දක්වා)
2	එච්.එන්.පී.ජිනසේන මහතා	සාමාන්‍යාධිකාරී
3	ජේ.එම්.අමාන් මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන/මානව සම්පත්)
4	එස්.අයි.එම්.හසන් මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
5	ජේ.පී.කේ.නීලවතුර මහතා	කළමණාකරු (පාලන/මානව සම්පත්)
6	කේ.ඒ.එච්.ඩී.පෙරේරා මිය	කළමණාකාරිනී (ප්‍රසම්පාදන)
7	ඩබ්.පෙරේරා මිය	කළමණාකාරිනී (නීති)
8	බී.වී.එල්.සී.බෙනරගම මිය	කළමණාකාරිනී (ඉඩම්)
9	ආර්.ඒ.අමල් සංජය මහතා	අභ්‍යන්තර විගණක
11	සී.එස්.බණ්ඩාර මිය	ගණකාධිකාරී
12	පී.සී.ජේ.පනාගොඩ මහතා	සහකාර ගණකාධිකාරී
13	ජී.බී.සී.ෆොන්සේකා මහතා	පරිපාලන නිලධාරී
14	ආර්.වයි.ජී.එස්.යාපා මහතා	සහකාර කළමණාකරු (මූල්‍ය)
15	පී.වී.ප්‍රදීප් මහතා	සහකාර කළමණාකරු (අළෙවි)
16	එස්.එල්.කේ.රන්වල මිය	සහකාර කළමණාකරු (වැවිලි)
17	පී.ටී.ඩී.ගුණවර්ධන මිය	සහකාර කළමණාකරු (ඉඩම්)
18	ඩබ්.සී.විතාන මයා	තොරතුරු තාක්ෂණ නිලධාරී
19	ඩබ්.ඩී.ඩබ්.කීර්ති මහතා	කළමණාකරු (ප්‍රවාහන) - වැඩ තහනමට ලක්වූ
20	එම්.ටී.ටී.මොරහැල මිය	සහකාර ගණකාධිකාරී (ප්‍රාදේශීය කාර්යාලය)

වතු කළමනාකරණය කාර්ය මණ්ඩලය - 2024

අංකය	නම	තනතුර
1	ටී.එම්.පී.අයි.කේ.තෙන්නකෝන් මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැවිලි)
2	එච්.ඩී.වී.ගුණසේකර මහතා	කළමණාකරු (වැවිලි)
3	අයි.ඩබ්.ආර්.ජයවර්ධන මහතා	ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී , අලකොල්ල රාජ්‍ය වතුයාය
4	ආර්.ඒ.ආර්.එම්.රණවක මහතා	ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී, කැලැබොක්ක රාජ්‍ය වතුයාය
5	ටී.ආර්.එච්.හේවගේ මහතා	ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී, ගෝමර රාජ්‍ය වතුයාය
6	ආර්.ඒ.එම්.දයාරත්න මහතා	ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී, මිඩ්ලන්ඩ් රාජ්‍ය වතුයාය
7	ඩබ්.ටී.කේ.සමරතුංග මහතා	ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී, රංගල රාජ්‍ය වතුයාය
8	එස්.වයි.ලියනගේ මහතා	ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී, භාගල රාජ්‍ය වතුයාය
9	ඩී.ඩබ්.ටී.සී.දන්තසිංහ මහතා	වතු අධිකාරී,ඕපල්ගල රාජ්‍ය වතුයාය
11	ආර්.සී.කහවිට මහතා	වතු අධිකාරී, කොටගහ රාජ්‍ය වතුයාය
12	කේ.ඩී.එම්.පී.වීරසිංහ මහතා	වතු අධිකාරී, වයිතලාව රාජ්‍ය වතුයාය
13	සී.එච්.එච්.කේ.ජී.ලක්රුවිර මහතා	වතු අධිකාරී, හෙයාපාර්ක් රාජ්‍ය වතුයාය
14	ඩබ්.ඒ.ඩී.පී.විජේසිංහ මහතා	වතු අධිකාරී, වුඩ්සයිඩ් රාජ්‍ය වතුයාය
15	ඒ.ඩී.කේ.ඒ.පී.සෙනරත් මහතා	වැ.ඛ.වතු අධිකාරී, විහාරගල රාජ්‍ය වතුයාය
16	එස්.ඩබ්.එම්.සී.එස්.අලදෙනිය මහතා	වැ.ඛ වතු අධිකාරී, නිකොළොය රාජ්‍ය වතුයාය
1	ඩබ්.බී.ඩබ්.එම්.ආර්.යූ.ඩබ්.එල්.කේ. අලුවිහාරේ මහතා	වැ.ඛ.වතු අධිකාරී, හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය
18	ජේ.ආර්.මරියානු මහතා	වැ.ඛ.වතු අධිකාරී, වලහන්දුව රාජ්‍ය වතුයාය
19	ජී.ඩබ්.ජී.විජේරත්න මහතා	වතු අධිකාරී (වැඩ තහනමට ලක්වූ)

සංවිධාන ව්‍යුහය



රූපය 01

සභාපතිතුමාගේ සමාලෝචනය 2024



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාව සඳහා මාගේ සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම භාග්‍යක් ලෙස සලකමි. රට තුළ පවත්නා විවිධ ආර්ථික ප්‍රතිසංස්කරණ සමඟ වැවිලි ක්ෂේත්‍රය අභියෝගාත්මක පරිසරයක ක්‍රියාත්මක වුවද නව රජයේ ප්‍රතිපත්තිය පෙරදැරිව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව තිරසාර වැවිලි කළමනාකරන ප්‍රතිපත්තියක් යටතේ ආර්ථිකමය වශයෙන් ශක්තිමත් ආයතනයක් බවට පත් කිරීම සඳහා සාර්ථකව මෙහෙයවීම මාගේ අරමුණයි. 2025 වර්ෂයේ දී අභිනවයෙන් මා සභාපතිවරයා ලෙස වැඩ භාර ගැනීමෙන් පසු 2023 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු ගත කිරීමට ක්‍රියා කල අතර 2024 වාර්ෂික වාර්තාවද මෙලෙස කඩිනමින් පාර්ලිමේන්තු ගත කිරීමට අවශ්‍ය උපදෙස් මා විසින් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව විගණකාධිපති වාර්තාව තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාව රු. මි. 68.64 අලාභයක් වාර්තා කර ඇති අතර එය 2023 වර්ෂයේදී වාර්තා කරන ලද අලාභය වූ රු. මි. 92.67 හා සැසඳීමේදී රු. මි. 24.03 ක අඩු වීමකි. මෙලෙස මෙහෙයුම් අලාභයක් වාර්තා කිරීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ තේ දළු වලින් ලබන ආදායම අඩුවීම, 2024 වර්ෂය තුළදී වතු කම්කරු වැටුප් 30% කින් පමණ ඉහළ යාම එනසාල්, කරාඹුනැටි වැනි සුළු භෝග වලින් ලැබෙන ආදායම අඩුවීම සහ මූල්‍ය ව්‍යදම් වල වැඩිවීමත් බව නිරීක්ෂණය විය.

පසුගිය වර්ෂ කිහිපය තුළදී රසායනික පොහොරවල මිල ගණන් අධික ලෙස වැඩී වූ බැවින්, සංස්ථාවේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් නිසි කෘෂිකාර්මික ක්‍රමවේදයන් යටතේ තේ වගාව සඳහා අවශ්‍ය පොහොර යෙදීම අඩාල වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස තේ දළු අස්වැන්න පහත වැටීම නිසා තේ වගා ක්ෂේත්‍රයන්හි ඵලදායිතාවය අඩු වීමක් නිරීක්ෂණය විය. සංස්ථාව විසින් 2024 වර්ෂය තුළ නෙලාගන්නා ලද අමු තේ දළු අස්වැන්න කිලෝ ග්‍රෑම් 4,754,368 දක්වා අඩු වූ බව නිරීක්ෂණය වේ.එය 2023 වර්ෂය තුළදී නෙළාගත් තේ දළු කිලෝග්‍රෑම් 5,176,834 ට සාපේක්ෂව කිලෝ ග්‍රෑම් 422,466 ක අඩුවීමකි. තවද, 2024 වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 1,027,277 ක් ලෙස වාර්තා වේ. එය 2023 වර්ෂයේදී නිෂ්පාදනය කළ නිමි තේ කිලෝග්‍රෑම් 1,134,951 ට වඩා කිලෝ ග්‍රෑම් 107,674 ක අඩු වීමකි. ඒ අනුව 2024 වර්ෂයේදී අමු තේ දළු සහ නිමි තේ නිෂ්පාදනය පිළිවෙලින් 8.16% හා 9.49% කින් පහල වැටී ඇත බව වාර්තා දෙස බැලීමේදී නිරීක්ෂණය වේ. සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන සංස්ථා තේ විකුණුම් ආදායමද 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී 34.32% අඩුවී ඇත. වාර්තාවේ ඉහත සඳහන් කරුණු අනුව තේ නිෂ්පාදනයෙන් ලබන සමස්ත ආදායම අඩු වී ඇති අතර මෙයට බලපෑ ප්‍රධානතම හේතුව

වන්නේ වතුයායන්ට අවශ්‍ය පොහොර නිසි පරිදි යෙදීමට නොහැකි වීම තුළින් තේ දළු අසවැන්න අඩුවීම බව නිරීක්ෂණය වේ.

සංස්ථාව විසින් තේ නිෂ්පාදනය තුළින් ලබා ගන්නා ආදායම ඉහළ නංවා ගැනීම ප්‍රමුඛතම ඉලක්කය ලෙස සලකා කටයුතු කළ යුතු අතර අපගේ අනෙකුත් ප්‍රධානතම ආදායම් මාර්ග වන දැව, රබර්, සුළු භෝග, බදු කුලී වැනි ආදායම් ඉහල නංවා ගැනීමටද ක්‍රියා කළ යුතුය. මීට අමතරව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් කිහිපයක්ම ලෝක උරුමයක් වන නකල්ස් රක්ෂිතය වටා පිහිටා ඇති බැවින් ඉතා සුන්දර ස්ථාන රාශියක් අප වතුයායන් තුළ පිහිටා ඇත. රිවස්ටන් පිවිසුම් මාර්ගය, දන්කන්ද වැව හා කඳවුරු භූමිය, 360° දර්ශන පථය, තැලීය වැටුන ඇල්ල, ජෝඩු ඇල්ල, සාරි ඇල්ල, වැවතැන්න කඳවුරු භූමිය හා ජලාශය ඇතුළු අලංකාර භූ දර්ශන රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් තුළ පිහිටා ඇත. දැනට මෙම ස්ථාන නැරඹීමට දේශීය හා විදේශීය සංචාරකයින් විශාල පිරිසක් පැමිණෙන අතර ඔවුන්ට අවශ්‍ය පහසුකම් වලින් ඉතා සීමිත පහසුකම් පමණක් සැපයීමෙන් දැනට යම් ආදායමක් සංස්ථාව උපයා ගනු ලබයි. නමුත් එම ස්ථාන වලට ලහා වීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සහ එම ස්ථාන වල පවතින පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ඉදිරියේ දී වැඩි සංචාරකයින් ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමටත් ඒ තුලින් ඉහළ ආදායමක් ලබා ගත හැකි බවත් මාගේ නිරීක්ෂණයයි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මුහුණ පා ඇති විශාලතම අභියෝගයක් වන්නේ සංස්ථාවේ පැවැති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2000 වර්ෂයේ සිට නිසි පරිදි ගෙවීමට නොහැකි වූ හිඟ සේවක ව්‍යවස්ථාපිත දීමනා ගෙවා දැමීමයි. 2024.12.31 දිනට ගෙවීමට තිබූ හිඟ සේවක ව්‍යවස්ථාපිත දීමනාවල අගය රු. මි. 1,411.72 ක් විය. ඉහත සඳහන් කළ හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් තුළ සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා රු.මි. 670.46 ක්, සේවක භාරකාර අරමුදල (ETF) සඳහා රු. මි. 41.24 ක්, වතු සේවක අර්ථසාධක සංගමය (ESPS) සඳහා රු.මි. 89.79 ක්, ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය (CPPS) සඳහා රු.මි. 21.98 ක් සහ පාරිතෝෂික දීමනා සඳහා රු. මි. 588.22 ක් ද ඇතුලත් විය. මෙයට අමතරව හිඟ ව්‍යවස්ථාපිත දීමනා නොගවීම හේතුවෙන් ගෙවිය යුතු අධිභාර වටිනාකම රු. මි. 588.21 ඇතුළත්ව 2024.12.31 දිනට ගෙවිය යුතු සමස්ත ව්‍යවස්ථාපිත දීමනා රු. මි. 1999.93 ක් විය. අපගේ රේඛීය අමාත්‍යාංශය සමඟ නිරන්තරයෙන් කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන්, මේ සම්බන්ධයෙන් සංස්ථාවට එරෙහිව අධිකරණයේ ගොනුකර ඇති නඩු වාරික මුදල් ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව 2023 සැප්තැම්බර් මාසයේ සිට මාසිකව රු. මි. 21.3 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබා දීම ආරම්භ කෙරිණි. නමුත් ඉදිරියේ දී සංස්ථාවේ ආදායම ඉහළ නංවා ගැනීම තුළින් සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි පරිදි සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. 2024 වර්ෂය තුළ ව්‍යවස්ථාපිත දීමනා නොගෙවීම මත අලුතින් නඩු 230 ක් සංස්ථාවට එරෙහිව පවරා ඇත. හිඟ සේවක ව්‍යවස්ථාපිත දීමනා කඩිනමින් බෙරුම් කර අවසන් කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කිරීමට මේ වන විට අප පියවර ගෙන ඇත.

සංස්ථාවේ තේ දළු අස්වැන්නේ හා නිමි තේ නිෂ්පාදනයෙන් ලාභයක් ඵාර්තා කිරීම සඳහා අමු දළු අස්වැන්න වැඩි කර ගත යුතුව ඇත. එසේම අමු දළු හා නිමි තේ විකිණීමෙන් ලැබෙන ආදායම සමස්ත වියදම ඉක්මවා යන ආදායමක් බවට පරිවර්තනය කළ යුතුව ඇත. ඒ සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව නිරීක්ෂණය වේ. එසේම සංස්ථාවේ දැනට පවතින වගකීම් වලින් නිදහස් වීම, වතුයායන්හි හා කර්මාන්තශාලා මගින් වැඩි ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා කර්මාන්තශාලා නිසි නඩත්තුවක් සහිතව නවීන තාක්ෂණය එකතු කිරීමක් සිදුකිරීමට හැකි වන පරිදි ප්‍රාග්ධන ආයෝජනයන් සිදු කල යුතු බව මාගේ නිරීක්ෂණයයි.

පෙර වර්ෂයන්හිදී සිදු කරන ලද කර්මාන්තශාලා නවීකරණය වැනි අනෙකුත් ප්‍රාග්ධන වියදම් මීට වඩා ඵලදායී ලෙස සිදු කිරීමට හැකියාව තිබූ බව මා හට නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන්හි පවතින තේ වගාව වසර පනහකට වඩා පැරණි බැවින්, 2022/2023 වර්ෂවලදී අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ආරම්භ කරන ලද හෙක්ටයාර් 160ක තේ නැවත වගා කිරීමේ වැඩසටහන අපේක්ෂිත ආයෝජන ප්‍රතිලාභ (Return on Investment) ලබා ගැනීමට අපොහොසත් වී ඇත. එබැවින් මෙම ආයෝජනයන් තිරසාර කර ගැනීම සඳහා අප විසින් කඩිනම් පියවර ගත යුතුව තිබේ. 1992 වර්ෂයේදී ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත වසර 53ක බදු පදනම මත පවරා දුන් වතුයායන් හැර, දැනට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සෘජුව පාලනය කරනු ලබන්නේ වතුයායන් 16ක් පමණි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මුළු භූමි ප්‍රමාණය ගැසට් අනුව හෙක්ටයාර 11,352.95 බව සඳහන්වේ.මෙම ඉඩම තුළ පවතින ඌන උපයෝජිත ඉඩම් හඳුනාගෙන ඒවා වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා නව ව්‍යාපෘති ආරම්භ කිරීම, නව තාක්ෂණය භාවිතයෙන් ඵලදායිතාවය වැඩි කිරීම, අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම, ගුණාත්මකත්වය තහවුරු කිරීම සඳහා ප්‍රමිතිකරණය සහ ISO සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් මා විසින් ලබා දී ඇත.

අනාගතයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ආයතනීය කාර්යක්ෂමතාවය හා ස්ථාවරත්වය තවදුරටත් ඉහළ නංවාගෙන පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීමට මා අදිටන් කරගෙන ඇති අතර සංස්ථාව ලාභදායී රාජ්‍ය ආයතනයක් ලෙස පවත්වාගෙන යාම මාගේ අරමුණයි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාව කඩිනමින් සකස් කිරීම සම්බන්ධයෙන් සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ප්‍රමුඛ සියලුම කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද කැපකිරීම මා අගය කරන අතර, ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට කැමත්තෙමි.

ආචාර්ය සිසිර රණතුංග
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

සංස්ථාපිත පසුබිම

නීතිමය පිහිටුවීම

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 දී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත අංක 4 යටතේ පිහිටුවන ලද අතර පසුව 1962 අංක 12 සහ 1979 අංක 49 දරන පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඓතිහාසික පසුබිම

1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවා ඇති අතර, ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පවරා දෙනු ලැබූ වතුයායන් සහ රජය සතු වගාකල බිම් සංවර්ධනය කර නගා සිටුවීමත්, වගාව මනා ලෙස කළමනාකරණය කිරීමත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය. තවද, ඉඩම් කොමසාරිස් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරා ගන්නා ලද වතුයායන් කළමනාකරණය කර පවත්වාගෙන යාමට පවරාදීම ද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ තවත් අරමුණක් විය.ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ආරම්භයේ සිටම ක්‍රියාත්මක වූයේ රජයට පවරා ඇති වතු කිහිපයක් සමඟ බැවින්, සංස්ථාව පිහිටුවීමේ අරමුණ ඉතා හොඳින් ක්‍රියාත්මක විය. එබැවින් කෙටි කාලයක් තුළ හෙක්ටයාර 15,000 ක පමණ වතු මිලදී ගැනීමට හැකි විය. ශක්තිමත් පනතක් මගින් ස්ථාපිත කිරීම සහ ඒ අනුව නිසි කළමනාකරණය මෙම වර්ධනයට හේතු විය.

1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ සහ 1975 සංශෝධිත පනත යටතේ ජනසතු කරන ලද වතුවලින් වතු 250ක් පමණ සහ පවතින භාරයන් අවලංගු කිරීම නිසා අත්පත් කරගත් වතුවලින් වතු 250ක් පමණ එතෙක් හිමිව තිබූ වතු 25ක් පමණ පවත්වාගෙන ගිය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සංවර්ධනය හා නගාසිටුවීමේ අරමුණ පෙරදැරිව හිමිකර දෙන ලදි. එලෙසම අත්පත් කරගත් අනෙකුත් වතු ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පිහිටුවීමෙන් පසු එම ආයතනය වෙත පවරාදී ඇත.
විශාල වශයෙන් පුළුල් කළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වැඩිදියුණු කිරීමට කළමනාකරණ ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය විය. එමනිසා වතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා 1977 දී බලයට පත් රජය විසින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇත. ඒ අනුව වතු පරිපාලනය විමධ්‍යගත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත 1979 අංක 4 දරන පනත මගින් සංශෝධනය කර ඇත. එම පනතේ 2 වැනි වගන්තියට අනුව ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යන නම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ලෙස සංශෝධනය විය.

තවද, 1979 අංක 49 (සංශෝධිත) පනතේ අංක 6 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගමේ අරමුණු පහත පරිදි පුළුල් වී ඇත.

අ) නිසි කෘෂිකාර්මික කළමනාකරණයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා වතු ඉඩම් ප්‍රවර්ධනය කිරීම.

ආ) ඉඩම්වල පවතින වගාවන් ප්‍රතිසංස්කරණය කිරීමෙන් නිසි කළමනාකරණයක් සහ සම්බන්ධීකරණයක් ඇතිව කෘෂිකාර්මික වගාවන් විවිධාංගීකරණය කිරීම.

ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම සහ විකිණීම.

ඈ) වතුවල සත්ව පාලනය සංවර්ධනය.

ඉ) වතුවල කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ ස්ථාපිත කිරීම සහ හොඳින් නඩත්තු කිරීම.

ඊ) වැවිලි සංස්ථාවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය සියලුම ක්‍රියා පටිපාටි සහ ක්‍රියාකාරකම් සිදු කිරීම.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කළමනාකරණය සහ විමධ්‍යගත ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා 1980 වර්ෂය තුළ බොහෝ පියවර ගන්නා ලදී. ඒ අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතට පත්ව ඇත. 1980 පෙබරවාරි මාසයේදී ප්‍රාදේශීය කාර්යාලවල කාර්යසාධනය වැඩි කිරීම සඳහා වැඩි බලතල සහිත ප්‍රාදේශීය මණ්ඩල හතරක් පිහිටුවන ලදී. ඒවා SLSPC I, II, III සහ IV ලෙස නම් කර ඇත. 1984 දී මෙම ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කරමින් බලංගොඩ සහ මාතලේ අවට වතු නිසිලෙස කළමනාකරණය කිරීම සඳහා SLSPC V සහ VI ලෙස නම් කරමින් තවත් මණ්ඩල දෙකක් ස්ථාපිතකර ඇත. මේ ආකාරයට වතු කළමනාකරණය විමධ්‍යගත කළද ප්‍රතිපත්ති සම්පාදනය, අලෙවිකරණය, ගබඩාකරණය සහ මූල්‍ය කටයුතු කොළඹ පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මධ්‍යම මණ්ඩලය මගින් සිදු කරන ලදී.

මෙම ප්‍රතිසංස්කරණවල අකාර්යක්ෂමතාවය සහ අඩු ඵලදායිතාව අවබෝධ කර ගැනීමෙන් පසුව රජය 1992 දී රාජ්‍ය සංස්ථා සහ දේපළ පෞද්ගලික සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ වැවිලි සමාගම් 22ක් පිහිටුවන ලදී. එම ප්‍රාදේශීය වැවිලි සමාගම් 22 වෙත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලාභදායී සහ ඉහළ කෘෂිකාර්මික ඵලදායිතාවයක් සහිත වතු 402 දිගුකාලීන බදු පදනම යටතේ පවරා දී ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ඉතිරිව තිබුණේ දිගුකාලීන පාඩු ලබන උඩරට සහ පහතරට තේ වල ඇති ලාක්ෂණික ගුණාංග නොමැතිකම හේතුවෙන් අඩු විකුණුම් මිලක් සහිත මැදරට තේ නිෂ්පාදනය කරන වතුයායන් 55ක් පමණි. මෙම වතු 55 න් වතු 32 ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් විය. මෙම වතු 32 න් වතු 11 ක් 1993 දී සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමට පවරා දී ඇත. ඒ අනුව, ඉතිරි වතු 11 ක් ඒකාබද්ධ කර වතු 16 ක් පිහිටුවා ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට යටත් කර ඇත. මෙම වතුවල විශාල ප්‍රදේශයක් පැරණි බීජ තේ වලින් සමන්විත වන අතර මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල නකල්ස් කඳුවැටිය අවට ඉඩම් දුර්වල පස් තට්ටුවකින් සමන්විත වේ. එම නිසා මෙම මැදරට වතුවල ස්වභාවිකව කොළ පැහැති දළු අස්වැන්න ඉතා අඩු මට්ටමක පවතී. වෙළෙඳ පොළ මිල පහළ මට්ටමක පැවතීම සහ අස්වැන්න අඩු මට්ටමක පවතින බැවින් මෙම වතු දිගුකාලීන පාඩු සහිත වතු ලෙස සැලකේ.

එසේම 1992 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සියලුම කාර්ය මණ්ඩලයම විශ්‍රාම ගැන්වීමෙන් සියලු කටයුතු නවතා දමා තිබුණි.1994 දී නව කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් මෙහෙයුම් නැවත ආරම්භ කර ඇත. එදා සිට 2006 වර්ෂය දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයට යටත් කර තිබුණි. 2001 සිට 2004 දක්වා කාලය තුළ පාඩු ලබන මෙම සංස්ථාව රජයට බරක් ලෙස සැලකේ. එබැවින් රජයට බරක් වීම අවම කර ගැනීමේ අරමුණින් සමහර වතු සහ වත්කම් දිගුකාලීන බදු පදනම මත ලබා දී ඇත.

ආයෝජන මණ්ඩලයේ නිර්දේශය යටතේ ඇතැම් ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයට බදු දී තිබූ වෛතලාව, වුඩ්සයිඩ්, හෙයාර්පාර්ක්, කොටගහ කර්මාන්තශාලාව වැනි වතු එම ව්‍යාපෘති අසාර්ථක වීම නිසා බදු දුන් පාර්ශව විසින් අත්හැර දමා ඇත. පසුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හෙයාර්පාර්ක් වත්ත සහ කොටගහ කර්මාන්තශාලාව වගකීම් රැසක් සමඟ පවරා ගැනීමට සිදු විය. අයහපත් කළමනාකරණය හේතුවෙන් අනවසර අත්පත් කර ගැනීම් සහ නඩත්තු නොකිරීම හේතුවෙන් වතුයාය වඩ වඩාත් පාඩු ලබන ආකාරය අත්හැර දැමූ හෙයාර්පාර්ක් වත්තෙන් මනාව පිළිබිඹු විය. පසුව වෛතලාව සහ වුඩ්සයිඩ් වතු වෙනත් පෞද්ගලික සමාගමකට පවරා දුන් අතර නිසි කළමනාකාරිත්වය නොමැතිකම හේතුවෙන් එම සමාගම වුඩ්සයිඩ් වත්ත අතහැර වෛතලාව වත්ත පමණක් තම පාලනය යටතේ තබාගෙන ඇත.
2006 දී රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව රාජ්‍ය ව්‍යවසායක ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයෙන් බැහැර කර උපාය මාර්ගික ව්‍යවසායකයින්ගේ ආයතනයේ විෂය පථයට යටත් කරමින් රජයේ උපායමාර්ගික සංවිධානයක් ලෙස කළමනාකරණය කිරීමට නව

ප්‍රතිපත්තියක් හදුන්වා දී ඇත. කළමනාකරණ උපාය මාර්ගික ව්‍යවසායක කළමනාකරණ ආයතනයේ මැදිහත්වීම යටතේ තේ වගාවන් වෙනස් වූවා සේම මෙම වතු පරිපාලනය කිරීමේ ක්‍රමවේදයද වෙනස් විය. ඒ අනුව, වතුයායේ වත්කම් කළමනාකරණය පිළිබඳ නව සංකල්පයක් හදුන්වා දී ඇත.

සංස්ථාවේ විවිධ වත්කම් එනම්, දැව සම්පත රු. මිලියන 3000ක් වන අතර, කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකිරීමට ශක්‍යතාවක් ඇති ස්ථාන, කාබන් තිරකිරීම ගණනය කිරීම මගින් අලෙවි කිරීම සහ පාඩු ලබන වතුවල බෝග විවිධාංගීකරණය කිරීම මෙම නව සංකල්පය යටතේ හඳුනාගෙන ඇත.

2007 වසරේ නකල්ස් ලෝක උරුම ගැසට් පත්‍රය සමඟින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත්ව තිබූ ඉඩම් ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ලෝක උරුමයට නතුවිය. ඒ අනුව වාණිජ වනවගාව, එනසාල් වගාව ඇති ඉඩම් මෙන්ම තේ වගාව ඇති ඉඩම් ද නකල්ස් රක්ෂිතය යටතට පත්ව ඇත. කෙසේවෙතත්, ඉඩම් ප්‍රමාණය රක්ෂිතය යටතට පත් වූ නිසාත් මායිම් අවිනිශ්චිත වූ නිසාත් වතු කළමනාකරණය මෙන්ම රක්ෂිතය කළමනාකරණය කිරීම ගැටලු සහගත විය.



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වඩාත් ආකර්ෂණීය ස්ථාන

කැලෑබොක්ක **360˚**දර්ශන පථය (වීවී පොයින්ට්)



මුහුදු මට්ටමේ සිට මීටර් 1,175ක උසින් පිහිටි කැලෑබොක්ක 360˚ දර්ශන පථය, වර්තමානයේ දෙස් විදෙස් සංචාරකයන් අතර අතිශය ජනප්‍රිය ගමනාන්තයක් බවට පත්ව ඇත. මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්ක මායිමේ පිහිටි මෙම සොඳුරු කඳු මුදුන, හත්ලේ කුඩා ලෝකාන්තය සහ හුන්නස්ගිරිය කඳුවැටිය හා බැඳුණු එකම කඳු පන්තියක කොටසකි. මෙම කඳුවැටිය උතුරු දෙසට විහිදී ගොස් නකල්ස් වනාන්තරයේ බටහිර බෑවුම් හා සම්බන්ධ වේ.

පැහැදිලි අහසක් ඇති දිනයකදී මධ්‍යම කඳුකරය, මහනුවර නගරය, සෙම්බුවත්ත වැව සහ නකල්ස් කඳු පන්තිය මනරම් ලෙස නැරඹිය හැකි සුවිශේෂී ස්ථානයක් ලෙස මෙය හැඳින්විය හැකිය. සංචාරකයන්ගේ නවාතැන් පහසුකම් සඳහා මෙහි ආරක්ෂිත කඳවුරු බිමක් (Camping Site) සහ මනරම් වතු බංගලා දෙකක් (02) පවතී.

බර්න්සයිඩ් බංගලාව




මහනුවර දිස්ත්‍රික්කයේ රංගල ප්‍රදේශයේ පිහිටා ඇති "බර්න්සයිඩ්" (Burnside) බංගලාව, පොල්ගොල්ල ජලාශයේ පිහිටි ජල ගුවන් යානා අංගනයේ (Sea Plane Landing Site) සිට සැතපුම් 13ක දුරින් පිහිටි මනරම් නවාතැනකි. මෙහි යාබද නාන කාමර පහසුකම් සහිත විශාල නිදන කාමර 03ක් පවතින අතර, එකවර පුද්ගලයන් 18 දෙනෙකුට ඉතා සුවපහසු ලෙස නවාතැන් පහසුකම් සැලසීමේ හැකියාව පවතී.

දන්කන්ද වැව - මිඩ්ලන්ඩ්ස්



මධ්‍යම පළාතේ මුහුදු මට්ටමේ සිට මීටර් 957ක උසින් පිහිටි දන්කන්ද වැව, මනරම් ස්වභාව සෞන්දර්යයකින් හෙබි ජලාශයකි. මෙය කිරිමැටියාරන්ද සහ දංකන්ද වත්ත යන ප්‍රදේශවලට ආසන්නව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මිඩ්ලන්ඩ්ස් වතුයායට නුදුරින් පිහිටා ඇත. මාතලේ රිවස්ටන් කලාපයේ පිහිටි මෙම දන්කන්ද වැව ඉස්මත්තෙහි, සොඳුරු කඳවුරු අත්දැකීමක් (Camping Experience) විඳගැනීමට දැන් දේශීය මෙන්ම විදේශීය සංචාරකයන්ට ද අවස්ථාව සලසා ඇත.

වැවතැන්න කඳවුරු භූමිය - වූඩ්සයිඩ්



මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයට අයත් මැදමහනුවර ප්‍රදේශයේ පිහිටි "වූඩ්සයිඩ්" (Woodside) රාජ්‍ය වතුයායෙහි "වැවතැන්න කඳවුරු භූමිය" පිහිටා ඇත. මහනුවර නගරයේ සිට කිලෝමීටර 37.9ක දුරින් පිහිටි මෙම සොඳුරු කඳවුරු භූමිය වෙත ප්‍රවේශ වන මාර්ගය තරමක් දුෂ්කර වුවද, එය ඉතා සුන්දර අත්දැකීම් බහුල සංචාරයකි. මහනුවර සිට වැවතැන්න දක්වා ගමන් ගන්නා අතරමහදී, ලෝක ප්‍රසිද්ධ වික්ටෝරියා වේල්ලේ විස්මිත දර්ශන නැරඹීමට ලැබීම ද මෙම ගමනට එක් කරන්නේ සුවිශේෂී අපූර්වත්වයකි

හුන්නස්ෆෝල්ස් දිය ඇල්ල




මහනුවර නගරයේ සිට කිලෝමීටර 22ක දුරින්, මාතලේ දිස්ත්‍රික්කයේ ඇල්කඩුව ගම්මානයට ආසන්නව පිහිටි නකල්ස් කඳුවැටිය සහ හුන්නස්ගිරිය දිය ඇල්ල (Hunnas Falls), දෙස් විදෙස් සංචාරකයන්ගේ නිරන්තර ආකර්ෂණයට ලක්වූ සුන්දර ස්ථාන වේ. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය මඟින්, මෙම දිය ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දී ඇත

තැලිය වැටුණු ඇල්ල



තැලිය වැටුණු ඇල්ල යනු මධ්‍යම පළාතේ නකල්ස් කඳුවැටිය මායිම්ව පිහිටි "අලකොල්ල" (Alakolla) වතුයායෙහි පිහිටි මනරම් දිය ඇල්ලකි. මෙම දිය ඇල්ල නම් කර ඇත්තේ කොළනි යුගයේදී එහි සේවය කළ "ඇලන් කොලින්" (Allen Collin) නැමති වතු කළමනාකරුගේ අදහසකට අනුව බව පැවසේ.

සාරි ඇල්ල



මහනුවර නගරයේ සිට කිලෝමීටර 30ක් පමණ දුරින් පිහිටි ගෝමර ගම්මානයේ මෙම දිය ඇල්ල පිහිටා ඇත. මහනුවර සිට එහි ළඟාවීම සඳහා පැයකට අධික කාලයක් ගතවන අතර, වාහනයකින්ම දිය ඇල්ල අසලටම ගමන් කිරීමේ පහසුව පවතී. මෙම දිය ඇල්ල ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. එහි ඉහළ කොටස ශ්‍රී ලාංකේය කාන්තාවන්ගේ පාරම්පරික ඇඳුමක් වන "සාරියක" හැඩය ගන්නා බැවින්, මෙය "සාරි ඇල්ල" (Sari Ella) ලෙස හඳුන්වනු ලබයි. දළ වශයෙන් මීටර් 20ක පමණ උසකින් යුත් මෙම දිය ඇල්ල පාමුල ස්වභාවිකව පිහිටි මනරම් ජලාශයක් ද දැකගත හැකිය.

2024 වර්ෂය තුළ රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පාලනය වන වතුයායන්හි තත්ත්වය

වගුව **01-** වතුයායන්හි විස්තර

අංකය	වතුයායෙහි නම	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
1	අල්ලකොල්ල	මහනුවර	පන්විල	819.86
2	කොටගඟ	මහනුවර	මැදදුම්බර	1,059.81
3	ගල්පිල්ල	මහනුවර	පන්විල/කුණ්ඩසාලේ	761.24
4	ගෝමර	මහනුවර	පන්විල	731.13
5	හාගල	මහනුවර	පන්විල	449.49
6	හෙයාපාර්ක්	මහනුවර	උඩුකුඹුර	976.75
7	හුන්නස්ගිරිය	මාතලේ	උකුවෙල	739.72
8	කැලෑබොක්ක	මහනුවර	පන්විල	1,370.36
9	මිඩ්ලන්ඩ්	මාතලේ	රත්තොට	1,221.31
10	නිකොලඔය	මාතලේ	රත්තොට	281.63
11	ඔපල්ගල	මාතලේ	මැදදුම්බර	759.10
12	රංගල	මහනුවර	මැදදුම්බර	630.60
13	වෛතලාව	මහනුවර	මැදදුම්බර	552.05
14	වුඩ්සයිඩ්	බදුල්ල	හල්දුම්මුල්ල	472.75
15	විහාරගල	මහනුවර	මැදදුම්බර	41.90
16	වලහන්දුව	ගාල්ල	අක්මීමණ	71.38
	මුළු එකතුව			**10,939.08**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය

වගුව **02** - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (නුවරඑළිය දිස්ත්‍රික්කය)

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
1	නුවරඑළිය	වෙදමුල්ල	අගලවත්ත වැවිලි සමාගම
2	නුවරඑළිය	නායබැද්ද	ආගරපතන වැවිලි සමාගම
3	නුවරඑළිය	එඩින්බරෝ	කැලණි වැවිලි සමාගම
4	නුවරඑළිය	ග්ලාස්ගෝ	කැලණි වැවිලි සමාගම
5	නුවරඑළිය	මහගස්තොට	කැලණි වැවිලි සමාගම
6	නුවරඑළිය	පේද්‍රෝ	කැලණි වැවිලි සමාගම
7	නුවරඑළිය	උඩරැදැල්ල	කැලණි වැවිලි සමාගම
8	නුවරඑළිය	බිලින්ක්බොනි	කැලණි වැවිලි වැවිලි සමාගම
9	නුවරඑළිය	මවුන්ට්ජීන්	ජනතා වතු සංවර්ධන මණ්ඩලය
10	නුවරඑළිය	බෙයාවේල්	තලවාකැලේ වැවිලි සමාගම
11	නුවරඑළිය	කැල්සි	තලවාකැලේ වැවිලි සමාගම
12	නුවරඑළිය	ක්ලැරෙන්ඩන්	තලවාකැලේ වැවිලි සමාගම
13	නුවරඑළිය	ඩෙස්ෆෝර්ඩ්	තලවාකැලේ වැවිලි සමාගම
14	නුවරඑළිය	මහා-බටහිර	තලවාකැලේ වැවිලි සමාගම
15	නුවරඑළිය	හොලිරූඩ්	තලවාකැලේ වැවිලි සමාගම
16	නුවරඑළිය	ලොගී	තලවාකැලේ වැවිලි සමාගම
17	නුවරඑළිය	මට්ටකැලේ	තලවාකැලේ වැවිලි සමාගම
18	නුවරඑළිය	තල්ගල්	තලවාකැලේ වැවිලි සමාගම
19	නුවරඑළිය	රදැල්ල	තලවාකැලේ වැවිලි සමාගම
20	නුවරඑළිය	සමර්සෙට්	තලවාකැලේ වැවිලි සමාගම
21	නුවරඑළිය	සෝගම	පුස්සැල්ලාව වැවිලි සමාගම
22	නුවරඑළිය	රම්බොඩ	පුස්සැල්ලාව වැවිලි සමාගම
23	නුවරඑළිය	පෙට්‍රොසෝව්	බගවන්තලාව වැවිලි සමාගම
24	නුවරඑළිය	පොයිස්ටෝන්	බගවන්තලාව වැවිලි සමාගම
25	නුවරඑළිය	බෝගවාන	බගවන්තලාව වැවිලි සමාගම
26	නුවරඑළිය	වැල්ලන්	බගවන්තලාව වැවිලි සමාගම
27	නුවරඑළිය	කාසල්රි	බගවන්තලාව වැවිලි සමාගම
28	නුවරඑළිය	එලොෆිට්ස්	බගවන්තලාව වැවිලි සමාගම
29	නුවරඑළිය	බගවන්තලාව	බගවන්තලාව වැවිලි සමාගම
30	නුවරඑළිය	නෝර්වුඩ්	බගවන්තලාව වැවිලි සමාගම
31	නුවරඑළිය	කොටියාගල	බගවන්තලාව වැවිලි සමාගම
32	නුවරඑළිය	ලොයිනෝර්	බගවන්තලාව වැවිලි සමාගම
33	නුවරඑළිය	මීඩ්ෆෝර්ඩ්	බගවන්තලාව වැවිලි සමාගම
34	නුවරඑළිය	ඔස්බෝන් / කැල්වර්ටන්	බගවන්තලාව වැවිලි සමාගම
35	නුවරඑළිය	ටියන්ස්ටින්	බගවන්තලාව වැවිලි සමාගම
36	නුවරඑළිය	කැම්පියන්	බගවන්තලාව වැවිලි සමාගම
37	නුවරඑළිය	ලෙතෙන්ටි	බගවන්තලාව වැවිලි සමාගම

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
38	නුවරඑළිය	මොරර්	මඩුල්සිම පල්න්ටේෂන් සමාගම
39	නුවරඑළිය	වෙන්වර්	මඩුල්සිම වතුයාය සමාගම
40	නුවරඑළිය	ශාන්ත ජෝන් ඩෙලරි	මඩුල්සිම වතුයාය සමාගම
41	නුවරඑළිය	තෙරේසියා	මඩුල්සිම වතුයාය සමාගම
42	නුවරඑළිය	කීව්	මඩුල්සිම වැවිලි සමාගම
43	නුවරඑළිය	මතුරට	මතුරට වැවිලි සමාගම
44	නුවරඑළිය	වෙල්සියා	මල්වත්ත නිම්නය වැවිලි
45	නුවරඑළිය	මස්කෙළිය	මස්කෙළිය වැවිලි සමාගම
46	නුවරඑළිය	ඇඩම්ස්පීක්	මස්කෙළිය වැවිලි සමාගම
47	නුවරඑළිය	බ්‍රවුන්ස්වික්	මස්කෙළිය වැවිලි සමාගම
48	නුවරඑළිය	බ්‍රවුන්ලෝ	මස්කෙළිය වැවිලි සමාගම
49	නුවරඑළිය	ඩීන්සයිඩ්	මස්කෙළිය වැවිලි සමාගම
50	නුවරඑළිය	ග්ලෙනුජී	මස්කෙළිය වැවිලි සමාගම
51	නුවරඑළිය	ලක්ෂපාන	මස්කෙළිය වැවිලි සමාගම
52	නුවරඑළිය	මෝකා	මස්කෙළිය වැවිලි සමාගම
53	නුවරඑළිය	මොරේ	මස්කෙළිය වැවිලි සමාගම
54	නුවරඑළිය	ක්වීන්ස්ලෑන්ඩ්	මස්කෙළිය වැවිලි සමාගම
55	නුවරඑළිය	ස්ට්‍රස්ත්ස්පෙ	මස්කෙළිය වැවිලි සමාගම
56	නුවරඑළිය	ක්රේග්	මස්කෙළිය වැවිලි සමාගම
57	නුවරඑළිය	ෆර්හැම්	මස්කෙළිය වැවිලි සමාගම
58	නුවරඑළිය	ශාන්ත ක්ලෙයාර්	මස්කෙළිය වැවිලි සමාගම
59	නුවරඑළිය	තලවාකැලේ	මස්කෙළිය වැවිලි සමාගම
60	නුවරඑළිය	බින්ඔය	වටවල වැවිලි සමාගම
61	නුවරඑළිය	ෂැනන්	වටවල වැවිලි සමාගම
62	නුවරඑළිය	උවාකැලේ	වටවල වැවිලි සමාගම
63	නුවරඑළිය	තංගකැලේ	වටවල වැවිලි සමාගම
64	නුවරඑළිය	කැරොලිනා	වටවල වැවිලි සමාගම
65	නුවරඑළිය	ශාන්ත හෙලීස්	වටවල වැවිලි සමාගම
66	නුවරඑළිය	හොට්වෙල්	වටවල වැවිලි සමාගම
67	නුවරඑළිය	ඇල්ටන්	හොරණ වැවිලි සමාගම
68	නුවරඑළිය	ෆෙයාලොන්	හොරණ වැවිලි සමාගම
69	නුවරඑළිය	ගවරවිල	හොරණ වැවිලි සමාගම
70	නුවරඑළිය	මහනිල්ලු	හොරණ වැවිලි සමාගම
71	නුවරඑළිය	ස්ටොක්හෝම්	හොරණ වැවිලි සමාගම

වගුව **03 -** වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය **(කළුතර දිස්ත්‍රික්කය)**

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
1	කළුතර	පාර්ට් ඔෆ්ක්ලයිඩ් කොටස	අගලවත්ත වැවිලි සමාගම
2	කළුතර	පයාගල	අගලවත්ත වැවිලි සමාගම
3	කළුතර	ක්ලයිඩ්	අගලවත්ත වැවිලි සමාගම
4	කළුතර	කිරිවන්කැටිය	අගලවත්ත වැවිලි සමාගම
5	කළුතර	මොහොමඩි	අගලවත්ත වැවිලි සමාගම
6	කළුතර	පිඹුර	අගලවත්ත වැවිලි සමාගම
7	කළුතර	දුම්බර	අගලවත්ත වැවිලි සමාගම
8	කළුතර	ලාගෝස්	කොටගල වැවිලි සමාගම
9	කළුතර	අරුපොලකන්ද	කොටගල වැවිලි සමාගම
10	කළුතර	ඩෙල්කීත්	කොටගල වැවිලි සමාගම
11	කළුතර	ඇදුරගල	කොටගල වැවිලි සමාගම
12	කළුතර	ගීකියනකන්ද	කොටගල වැවිලි සමාගම
13	කළුතර	හෑගල්ල	කොටගල වැවිලි සමාගම
14	කළුතර	හැඩිගල්ල	කොටගල වැවිලි සමාගම
15	කළුතර	මිල්ලැව	කොටගල වැවිලි සමාගම
16	කළුතර	පාදුක්ක	කොටගල වැවිලි සමාගම
17	කළුතර	පර්ත්	කොටගල වැවිලි සමාගම
18	කළුතර	රයිගම	කොටගල වැවිලි සමාගම
19	කළුතර	සොරණ	කොටගල වැවිලි සමාගම
20	කළුතර	උස්ක්වැලි	කොටගල වැවිලි සමාගම
21	කළුතර	වෝගන්	කොටගල වැවිලි සමාගම
22	කළුතර	ඩෙල්කිත්	කොටගල වැවිලි සමාගම
23	කළුතර	එලදුව	නමුණුකුල වැවිලි සමාගම
24	කළුතර	මිරිස්වත්ත	නමුණුකුල වැවිලි සමාගම
25	කළුතර	පල්ලේගොඩ	නමුණුකුල වැවිලි සමාගම
26	කළුතර	සිරිකඳුර	නමුණුකුල වැවිලි සමාගම
27	කළුතර	අඹතැන්න	බලංගොඩ වැවිලි සමාගම
29	කළුතර	ෆ්රොසෙස්ටර්	හොරණ වැවිලි සමාගම
30	කළුතර	හල්වතුර	හොරණ වැවිලි සමාගම
31	කළුතර	හිල්ස්ට්රීම්	හොරණ වැවිලි සමාගම
32	කළුතර	කොබෝවැල්ල	හොරණ වැවිලි සමාගම
33	කළුතර	මිල්ලකන්ද	හොරණ වැවිලි සමාගම
34	කළුතර	මිරිස්හේන	හොරණ වැවිලි සමාගම
35	කළුතර	නිවුවැටල්	හොරණ වැවිලි සමාගම

වගුව **04 -** වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය **(රත්නපුර දිස්ත්‍රික්කය)**

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
1	රත්නපුර	දෙල්ගොඩ	අගලවත්ත වැවිලි සමාගම
2	රත්නපුර	දොලොස්වෙල	අගලවත්ත වැවිලි සමාගම
3	රත්නපුර	කිරිබත්ගල	අගලවත්ත වැවිලි සමාගම
4	රත්නපුර	නිරිඇල්ල /නිරිවත්ත	අගලවත්ත වැවිලි සමාගම
5	රත්නපුර	නොරගල	අගලවත්ත වැවිලි සමාගම
6	රත්නපුර	පිංකන්ද	අගලවත්ත වැවිලි සමාගම
7	රත්නපුර	වට්ටපොත	අගලවත්ත වැවිලි සමාගම
8	රත්නපුර	ගලේබොද්ද	ආගරපත්න වැවිලි සමාගම
9	රත්නපුර	මවුස්සා	උඩප්පුස්සැල්ලාව වතුයාය සමාගම
10	රත්නපුර	පැල්මඩුල්ල	කහවත්ත වැවිලි සමාගම
11	රත්නපුර	පොරතුව	කහවත්ත වැවිලි සමාගම
12	රත්නපුර	එකරැල්ල	කහවත්ත වැවිලි සමාගම
13	රත්නපුර	එන්ඩනේ	කහවත්ත වැවිලි සමාගම
14	රත්නපුර	හෝප්	කහවත්ත වැවිලි සමාගම
15	රත්නපුර	හුණුවැල්ල	කහවත්ත වැවිලි සමාගම
16	රත්නපුර	යටදොල	කහවත්ත වැවිලි සමාගම
17	රත්නපුර	ඕපාත	කහවත්ත වැවිලි සමාගම
18	රත්නපුර	රිල්හේන	කහවත්ත වැවිලි සමාගම
19	රත්නපුර	වැල්ලඳුර	කහවත්ත වැවිලි සමාගම
20	රත්නපුර	ඇහැලියගොඩ	පුස්සැල්ලාව වතුයාය සමාගම
21	රත්නපුර	දුරම්පිටිය	පුස්සැල්ලාව වතුයාය සමාගම
22	රත්නපුර	කීරගල	පුස්සැල්ලාව වතුයාය සමාගම
23	රත්නපුර	පුස්සැල්ල	පුස්සැල්ලාව වතුයාය සමාගම
24	රත්නපුර	සන්ඩර්ලන්ඩ්	පුස්සැල්ලාව වතුයාය සමාගම
25	රත්නපුර	ඇහැලියගොඩ	පුස්සැල්ලාව වතුයාය සමාගම
26	රත්නපුර	කැම්පියන්	බගවන්තලාව වැවිලි සමාගම
27	රත්නපුර	ෆාම්ගාඩන් කොටසක්	බලංගොඩ වැවිලි සමාගම
28	රත්නපුර	මහවෙල	බලංගොඩ වැවිලි සමාගම
29	රත්නපුර	රයි	බලංගොඩ වැවිලි සමාගම
30	රත්නපුර	ඊගස්ලන්ඩ්	බලංගොඩ වැවිලි සමාගම
31	රත්නපුර	බලන්ගොඩ	බලංගොඩ වැවිලි සමාගම
32	රත්නපුර	සිසිල්ටන්	බලංගොඩ වැවිලි සමාගම
33	රත්නපුර	ගලතුර	බලංගොඩ වැවිලි සමාගම
34	රත්නපුර	මිල්ලවිටිය	බලංගොඩ වැවිලි සමාගම
35	රත්නපුර	මතුවාගල	බලංගොඩ වැවිලි සමාගම
36	රත්නපුර	තල්වත්ත	බලංගොඩ වැවිලි සමාගම
37	රත්නපුර	පෙතියාගල	බලංගොඩ වැවිලි සමාගම
38	රත්නපුර	රඹුක්කන්ද	බලංගොඩ වැවිලි සමාගම
39	රත්නපුර	වලබොඩ	බලංගොඩ වැවිලි සමාගම
40	රත්නපුර	වාවිල	බලංගොඩ වැවිලි සමාගම

41	රත්නපුර	විකිලිය	බලංගොඩ වැවිලි සමාගම
42	රත්නපුර	රාස්සගල	බලංගොඩ වැවිලි සමාගම
43	රත්නපුර	මද්දකන්ද	බලංගොඩ වැවිලි සමාගම
44	රත්නපුර	සපුමල්කන්ද	බලංගොඩ වැවිලි සමාගම
45	රත්නපුර	පෙරියල් නොවන	පෙරියල් නොවන
46	රත්නපුර	ලංකාබේරිය	මතුරට වැවිලි සමාගම
47	රත්නපුර	පනිල්කන්ද	මතුරට වැවිලි සමාගම
48	රත්නපුර	හේයි	මස්කෙළිය වැවිලි සමාගම
50	රත්නපුර	මාදම්පේ/දිප්දීන්	හපුගස්තැන්න වැවිලි සමාගම
51	රත්නපුර	ඇග්බර්ත්	හපුගස්තැන්න වැවිලි සමාගම
52	රත්නපුර	ඇලර්ටන්	හපුගස්තැන්න වැවිලි සමාගම
53	රත්නපුර	ඩෙපෙඩීන්	හපුගස්තැන්න වැවිලි සමාගම
54	රත්නපුර	හයරි	හපුගස්තැන්න වැවිලි සමාගම
55	රත්නපුර	ලොල්ලුපිටිය	හපුගස්තැන්න වැවිලි සමාගම
56	රත්නපුර	ස්ප්රින්ග්වුඩ්	හපුගස්තැන්න වැවිලි සමාගම
57	රත්නපුර	හපුගස්තැන්න	හපුගස්තැන්න වැවිලි සමාගම
58	රත්නපුර	අළුපොල	හපුගස්තැන්න වැවිලි සමාගම
59	රත්නපුර	ගලබොඩ	හපුගස්තැන්න වැවිලි සමාගම

වගුව **05** - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (ගාල්ල දිස්ත්‍රික්කය)

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
1	ගාල්ල	ලේල්වල	ඇල්පිටිය වැවිලි සමාගම
2	ගාල්ල	ගුලුගහකන්ද	ඇල්පිටිය වැවිලි සමාගම
3	ගාල්ල	දිවිතුර	ඇල්පිටිය වැවිලි සමාගම
4	ගාල්ල	කැටන්දොල	ඇල්පිටිය වැවිලි සමාගම
5	ගාල්ල	නාගොඩ සමූහ	ඇල්පිටිය වැවිලි සමාගම
6	ගාල්ල	රත්නවල සහ නාගොඩ	ඇල්පිටිය වැවිලි සමාගම
7	ගාල්ල	ඇල්පිටිය	ඇල්පිටිය වැවිලි සමාගම
8	ගාල්ල	බෙන්තොට	ඇල්පිටිය වැවිලි සමාගම
9	ගාල්ල	ඉහළකන්ද	ඇල්පිටිය වැවිලි සමාගම
10	ගාල්ල	මාපලගම	ඇල්පිටිය වැවිලි සමාගම
11	ගාල්ල	ඇල්පිටිය	ඇල්පිටිය වැවිලි සමාගම
12	ගාල්ල	මොරගල	තලවාකැලේ වතුයාය සමාගම
13	ගාල්ල	පිටියගොඩ	තලවාකැලේ වතුයාය සමාගම
14	ගාල්ල	වලහන්දුව	තලවාකැලේ වතුයාය සමාගම
15	ගාල්ල	වත්තේගොඩ	තලවාකැලේ වතුයාය සමාගම
16	ගාල්ල	බද්දේගම	නමුණුකුල වැවිලි සමාගම
17	ගාල්ල	වල්පිට	නමුණුකුල වැවිලි සමාගම
18	ගාල්ල	ඇග්රොක්	නමුණුකුල වැවිලි සමාගම
19	ගාල්ල	වැවේගොඩවත්ත	නමුණුකුල වැවිලි සමාගම
20	ගාල්ල	පොල්ගහවිල්ල	නමුණුකුල වැවිලි සමාගම
21	ගාල්ල	පිල්ලගොඩවල්ලි	නමුණුකුල වැවිලි සමාගම
22	ගාල්ල	අඳුන්කැලේ	නමුණුකුල වැවිලි සමාගම
23	ගාල්ල	මොන්රෝවියා	නමුණුකුල වැවිලි සමාගම
24	ගාල්ල	තංගල්ල	වටවල වැවිලි සමාගම
25	ගාල්ල	ඉහළ හෝමදොල	වටවල වැවිලි සමාගම

26	ගාල්ල	නාකියාදෙණිය	වටවල වැවිලි සමාගම
27	ගාල්ල	හෝමදොල	වටවල වැවිලි සමාගම
28	ගාල්ල	නාකියාදෙණිය ආර්.ඊ	වටවල වැවිලි සමාගම

වගුව **06-** වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය **(මාතලේ දිස්ත්‍රික්කය)**

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
1	මාතලේ	නාලන්දාව	ඇල්කඩුව වැවිලි සමාගම
2	මාතලේ	හතමුණගල	ඇල්කඩුව වැවිලි සමාගම
3	මාතලේ	මිල්ලවාන	ඇල්කඩුව වැවිලි සමාගම
4	මාතලේ	බණ්ඩාරපොල	ඇල්කඩුව වැවිලි සමාගම
5	මාතලේ	කන්දේනුවර	ඇල්කඩුව වැවිලි සමාගම
6	මාතලේ	උකුවෙල	ඇල්කඩුව වැවිලි සමාගම
7	මාතලේ	ඕවල	ඇල්කඩුව වැවිලි සමාගම
8	මාතලේ	හපුගස්පිටිය	ඇල්කඩුව වැවිලි සමාගම
9	මාතලේ	පන්සල්තැන්න	ඇල්කඩුව වැවිලි සමාගම
10	මාතලේ	ඇල්කඩුව සමූහ	ඇල්කඩුව වැවිලි සමාගම
11	මාතලේ	හුණුගල	ඇල්කඩුව වැවිලි සමාගම
12	මාතලේ	පිටකන්ද	ඇල්කඩුව වැවිලි සමාගම
13	මාතලේ	රත්වත්ත	ඇල්කඩුව වැවිලි සමාගම
14	මාතලේ	හපුගහලන්ද	ඇල්කඩුව වැවිලි සමාගම
15	මාතලේ	සලාගම	ඇල්කඩුව වැවිලි සමාගම
16	මාතලේ	මහෞසා	උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම
17	මාතලේ	ගම්මඩුව	ගම්මඩුව වැවිලි සමාගමට බදුදී ඇත
18	මාතලේ	ඉන්දෝලා	තලවකල්ලේ වැවිලි සමාගම
19	මාතලේ	ලෙබනන් සමූහය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
20	මාතලේ	ඔපල්ගල	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
21	මාතලේ	දන්කන්ද	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
22	මාතලේ	කතරන්තැන්න	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
23	මාතලේ	මීඩිලන්ඩ්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
24	මාතලේ	නිකොලඔය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
25	මාතලේ	බඹරගල්ල	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
26	මාතලේ	මීඩිකාර්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
28	මාතලේ	බටහිර මාතලේ	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

වගුව **07 -** වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය **(මාතර දිස්ත්‍රික්කය)**

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
1	මාතර	තල්ගස්වෙල	ඇල්පිටිය වැවිලි සමාගම
2	මාතර	ගල්ලින්ද	ඇල්පිටිය වැවිලි සමාගම
3	මාතර	දෙනියාය	තලවාකැලේ වැවිලි සමාගම
4	මාතර	හෑන්ඩ්ෆර්ඩ්	තලවාකැලේ වැවිලි සමාගම
5	මාතර	කිරිවංගඟ	තලවාකැලේ වැවිලි සමාගම
6	මාතර	කොබෝමෙල්ල	තලවාකැලේ වැවිලි සමාගම

7	මාතර	ඉන්දෝලා	තලවාකැලේ වැවිලි සමාගම
8	මාතර	තැන්නහේන	නමුණුකුල වැවිලි සමාගම
9	මාතර	ඇල්ලකන්ද	නමුණුකුල වැවිලි සමාගම
10	මාතර	හුලංදුව	නමුණුකුල වැවිලි සමාගම
11	මාතර	අකුරැස්ස	නමුණුකුල වැවිලි සමාගම
12	මාතර	හලාල්ලා	නමුණුකුල වැවිලි සමාගම
13	මාතර	බෙල්මන්ට්	නමුණුකුල වැවිලි සමාගම
14	මාතර	දකුණු චාලි කන්ද	නමුණුකුල වැවිලි සමාගම
15	මාතර	බෙවර්ලි	මතුරට වැවිලි සමාගම
16	මාතර	එනසල්වත්ත	මතුරට වැවිලි සමාගම
17	මාතර	දිද්දෙනිපොත	මතුරට වැවිලි සමගම
18	මාතර	අනිල්කන්ද	මතුරට වැවිලි සමාගම
19	මාතර	විල්පිට	මතුරට වැවිලි සමාගම
20	මාතර	අණ්ඩපාන	මතුරට වැවිලි සමාගම

වගුව **08** - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (බදුල්ල **දිස්ත්‍රික්කය**)

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
1	බදුල්ල	දඹතැන්න	ආගරපතන වැවිලි සමාගම
2	බදුල්ල	ග්ලෙනෝර්	ආගරපතන වැවිලි සමාගම
3	බදුල්ල	ගෝනමොටුව	ආගරපතන වැවිලි සමාගම
4	බදුල්ල	හපුතලේ	ආගරපතන වැවිලි සමාගම
5	බදුල්ල	පිටරත්මලේ	ආගරපතන වැවිලි සමාගම
6	බදුල්ල	උඩවේරිය	ආගරපතන වැවිලි සමාගම
7	බදුල්ල	උසාවිය	ආගරපතන වැවිලි සමාගම
8	බදුල්ල	රොහ්ම්ප්ටන්	ආගරපත්න වැවිලි සමාගම
9	බදුල්ල	කහගල්ල	ආගරපතන වැවිලි සමාගම
10	බදුල්ල	උද්යානය	උඩපුස්සැල්ලාව වතුයාය සමාගම
11	බදුල්ල	හිඳගල	නමුණුකුල වැවිලි සමාගම
12	බදුල්ල	කිනෙලන්	නමුණුකුල වැවිලි සමාගම
13	බදුල්ල	පිංගරාව	නමුණුකුල වැවිලි සමාගම
14	බදුල්ල	දකුණු මැද්දකුඹුර	බලංගොඩ වැවිලි සමාගම
15	බදුල්ල	අයිස්ලැබ්	මල්වත්ත නිම්නය වැවිලි සමාගම
16	බදුල්ල	අම්පිටියකන්ද	මස්කෙළිය වැවිලි සමාගම
17	බදුල්ල	කොස්ලන්ද	මස්කෙළිය වැවිලි සමාගම
18	බදුල්ල	ලියනගහවැල්ල	මස්කෙළිය වැවිලි සමාගම
19	බදුල්ල	මහකන්ද	මස්කෙළිය වැවිලි සමාගම
20	බදුල්ල	පූනගල්ල	මස්කෙළිය වැවිලි සමාගම
22	බදුල්ල	විහාරගල	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
23	බදුල්ල	නාහවිල	හපුගස්තැන්න වැවිලි සමාගම
24	බදුල්ල	නිව්බර්ග්	හපුගස්තැන්න වැවිලි සමාගම

වගුව **09** - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (මහනුවර දිස්ත්‍රික්කය)

අංකය	දිස්ත්‍රික්කය	වතුයායේ නම	වත්මන් කළමනාකරණ සමාගම
1	මහනුවර	මාවුස්සාකන්ද	ඇල්කඩුව වැවිලි සමාගම
2	මහනුවර	දක්වාරි සමූහය	උඩපුස්සැල්ලාව වතුයාය සමාගම
3	මහනුවර	මඩුල්කැලේ	උඩපුස්සැල්ලාව වතුයාය සමාගම
4	මහනුවර	ග්‍රේට්වැලී	ජනතා වතු සංවර්ධන මණ්ඩලය
5	මහනුවර	ගලහ	ජනතා වතු සංවර්ධන මණ්ඩලය
6	මහනුවර	උඩුවෙල	ජනතා වතු සංවර්ධන මණ්ඩලය
7	මහනුවර	අල්ලකොල්ල	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
8	මහනුවර	හාගල්ල	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
9	මහනුවර	වටකැලේ	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
10	මහනුවර	රංගල සමූහය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
11	මහනුවර	කැලෑබොක්ක	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
12	මහනුවර	කන්දකැටිය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
13	මහනුවර	ෆර්න්ඩේල්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
14	මහනුවර	කොටගහ	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
15	මහනුවර	දෙහිගොල්ල/එනසල්වත්ත/ලූල්වත්ත	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
16	මහනුවර	දෙල්පතනාඔය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
17	මහනුවර	ගූමරා	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
18	මහනුවර	කොබොනිල්ලා	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
19	මහනුවර	ගැරන්ඩියෙල්ලා	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
20	මහනුවර	වයිතලාව සමූහ	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
21	මහනුවර	අඟුරුවැල්ල	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
22	මහනුවර	ගාල්ලකැලේ සමූහ	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
23	මහනුවර	හතලේ	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
24	මහනුවර	හුන්නස්ගිරිය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
25	මහනුවර	ට්‍රැෆර්ඩ්හිල්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
26	මහනුවර	පිළිස්සුම් පැත්ත	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
27	මහනුවර	නකල්ස්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
28	මහනුවර	තුනිස්ගල	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
29	මහනුවර	රක්සාව	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
30	මහනුවර	ගල්පිල්ල	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
31	මහනුවර	හෙයර්පාර්ක්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
32	මහනුවර	වටකැටිය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
33	මහනුවර	ග්‍රීන්වුඩ්/දික්ඔය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
34	මහනුවර	වුඩ්සයිඩ්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මිලදී ගත් වතු පිලිබඳ විස්තර

වගුව 10 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මිලදී ගත් වතු පිලිබඳ විස්තර

අංකය	වතුයායේ නම	දිස්ත්‍රික්කය	මිලදීගත් දිනය	වර්තමාන කළමනාකරණය	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර
1	වෙදමුල්ල	නුවරඑළිය	1973.09.01	අගලවත්ත වැවිලි සමාගම	484.62
2	රොහැම්ටන්	බදුල්ල	1974 .0315	ආගරපතන වැවිලි සමාගම	100.61
3	ගලේබොද්ද	රත්නපුර	1974.07.01	ආගරපතන වැවිලි සමාගම	752.63
4	ඇල්පිටිය	ගාල්ල	1975.06 01	ඇල්පිටිය වැවිලි සමාගම	785.02
5	හල්ගොල්ල **	කෑගල්ල	1974.10.23	කෑගල්ල වැවිලි සමාගම	16006 .88
6	ඩෙල්කිත්	කළුතර	1975.05.19	කොටගල වැවිලි සමාගම	1223.38
7	ගලහ *	මහනුවර	1975.07.01	ජනවසම	694.33
8	මවුන්ට් ජින් *	නුවරඑළිය	1975 .07.01	ජනවසම	456.52
9	ග්‍රේට්වැලි *	මහනුවර	1974.01.01	ජනවසම	320.24
10	උඩුවෙල *	මහනුවර	1973.05 .31	ජනවසම	659 .51
11	රම්බොඩ **	නුවරඑළිය	1973.09.01	පුස්සැල්ලාව වැවිලි සමාගම	765.18
12	සොගම **	නුවරඑළිය	1971.12.30	පුස්සැල්ලාව වැවිලි සමාගම	476.11
13	ඇහැලියගොඩ	රත්නපුර	1975 .08.01	පුස්සැල්ලාව වැවිලි සමාගම	410.93
14	මතුරට **	නුවරඑළිය	1975.05.15	බලංගොඩ වැවිලි සමාගම	278.54
15	සවුත් මැදකුඹුර **	බදුල්ල	1974.02.01	බලංගොඩ වැවිලි සමාගම	505.26
16	සපුමල්කන්ද	රත්නපුර	1975.08.01	බලංගොඩ වැවිලි සමාගම	646.96
17	නන්ජේරියල්	රත්නපුර	1975.0519	බලංගොඩ වැවිලි සමාගම	203.64
18	විකිලිය	රත්නපුර	1974.10.23	බලංගොඩ වැවිලි සමාගම	805.67
19	රාස්සගල	රත්නපුර	1974.10.23	බලංගොඩ වැවිලි සමාගම	776.49
20	මැද්දකන්ද	රතනපුර	1974.10.23	බලංගොඩ වැවිලි සමාගම	676.11
21	කැම්පියන්	රත්නපුර	1975 0 .01	බොගවන්තලාව වැවිලි සමාගම	848.99
22	ලෙතන්ට්	නුවරඑළිය	1974.07.01	බොගවන්තලාව වැවිලි සමාගම	203.24
23	අයිස්ලැබ්	බදුල්ල	1973.11.26	මල්වත්ත වැලි වැවිලි සමාගම	382.59
24	තිස්පනේ	මහනුවර	1972.01.01	මහවැලි ව්‍යාපෘතියට ලබා දී ඇත.	384.62
25	දියදාව	මාතර	1980 වසර	මොරවක්කොරලේ සමුපකාර සමිතිය	13.2258
26	හොට්විල්	නුවරඑළිය	1975.07.01	වටවල වැවිලි සමාගම	412.15
27	සෙන්ට් හේලීස්	නුවරඑළිය	1974.07.01	වටවල වැවිලි සමාගම	172.87
29	හපුගස්තැන්න	රත්නපුර	1971 .12.30	හපුගස්තැන්න වැවිලි සමාගම	1709 .31
30	අලුපොල	රත්නපුර	1972 .12.30	හපුගස්තැන්න වැවිලි සමාගම	1228 .74
31	ගලබොඩ	රත්නපුර	1973 .12.30	හපුගස්තැන්න වැවිලි සමාගම	376.92
32	කැරොලිනා	නුවරඑළිය	1974 .07.01	හපුගස්තැන්න වැවිලි සමාගම	1063.56

*ජනවසම විසින් කළමණාකරණය කරමින් පවති.

** ජනවසම විසින් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු දී ඇත .

හෙක්ටයාර ප්‍රකාශය , ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව -2024

වගුව 11 - හෙක්ටයාර ප්‍රකාශය , ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

හෙක්ටයාර ප්‍රකාශය , ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව -2024

වතුයාය	තේ වගා කළ ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)					රබර් පැරණි (හෙක්ටයාර)	මුළු තේ හා රබර් වගාව (හෙක්ටයාර)	සුළු අපනයන බෝග (හෙක්ටයාර)	දැව වගාව (හෙක්ටයාර)	වතු සේවකයින්ට ලබාදුන් ඉඩම් (හෙක්ටයාර)	නකල්ස් රක්ෂිත කලාපය	වෙනත්- පාරවල් ,ගල් පර්වත, ගොඩනැගිලි (හෙක්ටයාර)	මුළු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)
	ආදායම සහිත තේ		අදායම් ලබන	කොන්ත්‍රාත්	නැවත තේ/රබර් වගාව/ පාළු								
	ඇට තේ	රිකිළි තේ		ඇට තේ									
අලකොළ	137.25	115.95	253.20	129.00	11.00	-	393.20		79.63	-	200.51	146.52	**819.86**
කොටගහ	202.38	35.42	237.80	174.11	29.16	-	441.07	5.85	21.28	-	-	591.61	**1,059.81**
ගල්පිල්ල	10.00	165.01	175.01	3.24	7.04	-	185.29	5.85	91.49	4.65	-	473.96	**761.24**
ගෝමර	65.50	116.73	182.23	152.36	12.00	-	346.59	-	44.50	-	74.80	265.24	**731.13**
හාගල	52.16	79.78	131.94	99.40	13.00	-	244.34	2.00	98.52	-	-	104.63	**449.49**
හෙයාර්පාර්ක්	131.50	-	131.50	186.50	25.00	-	343.00	55.00	1.00	-	-	577.75	**976.75**
හුන්නස්ගිරි	149.14	38.78	187.92	34.21	9.25	-	231.38	51.32	7.00	-	-	450.02	**739.72**
කැලැබොක්ක	90.97	278.24	369.21	284.41	41.00	-	694.62	147.81	15.00	-	-	512.93	**1,370.36**
මීඩ්ලන්ඩ්	60.42	123.91	184.33	65.17	19.50	-	269.00	266.78	215.84	-	-	469.69	**1,221.31**
නිකොළොය	-	47.14	47.14	3.64	2.00	-	52.78	48.32	18.00	-	-	213.31	**332.41**
ඔපල්ගල		48.90	48.90	13.00	7.00	-	68.90	148.00	86.00	-	-	456.20	**759.10**
රංගල	48.35	87.44	135.79	126.95	32.43	-	295.17	7.50	-	-	-	327.93	**630.60**
වෛතලාව	29.00	39.20	68.20	74.69	7.00	-	149.89	61.06	45.89	-	-	293.88	**552.05**
වුඩ්සයිඩ්	-	-	-	185.31	15.00		200.31	2.00	48.43	-	-	222.01	**472.75**
විහාරගල	27.33	0.81	28.14	-		-	28.14		-	-	-	13.76	**41.90**
වලහන්දුව		1.50	1.50		10.00	12.84	24.34	24.00	-	-	-	23.04	**71.38**
එකතුව	**1,004.00**	**1,178.81**	**2,182.81**	**1,531.99**	**240.38**	**12.84**	**3,968.02**	**825.49**	**772.58**	**4.65**	**275.31**	**5,142.48**	**10,989.86**

තේ අමු දළු අස්වැන්න 2014-2024

වගුව 12 - තේ -අමු දළු (කිලෝ ග්‍රෑම්)

	තේ -අමු දළු (කිලෝ ග්‍රෑම්)					
වතුයාය	2019	2020	2021	2022	2023	2024
අලකොළ	617,413	755,844	812,281	680,267	578,619	477,818
කොටගහ	253,262	303,817	298,549	211,277	160,814	150,613
ගල්පීල්ල	681,020	833,568	897,867	641,974	597,572	616,552
ගෝමර	706,865	849,230	920,770	735,007	530,548	523,833
හාගල	412,474	578,153	586,514	450,306	371,874	334,247
හෙයාර්පාර්ක්	252,867	362,826	349,541	254,513	228,510	190,993
හුන්නස්ගිරිය	487,032	544,822	556,800	442,136	364,267	369,536
කැලෑබොක්ක	1,435,669	1,780,625	1,911,748	1,572,439	919,016	903,011
කුඩාඔය	2,581	18,791	20,558	-	-	-
මීඩිලන්ඩ්	494,211	520,382	518,951	424,062	321,430	297,259
නිකොළොය	138,379	191,445	187,163	145,973	111,028	103,130
ඔපල්ගල	263,246	399,514	347,170	312,415	264,534	185,912
රංගල	579,595	662,545	641,661	528,504	431,795	411,349
වෛතලාව	157,356	211,812	249,160	202,098	167,837	142,363
විහාරගල	9,267	20,116	25,471	19,432	**17,451**	23,766
වුඩ්සයිඩ් **	44,463	68,485	60,799	39,320	23,985	16,300
එකතුව	6,535,701	8,101,974	8,385,002	6,659,725	5,089,280	4,746,682


වතුයාය	රබර් ලේටෙක්ස් 2019-2024					
	2019	2020	2021	2022	2023	2024
වලහන්දුව	28,122	29,660	19,063	15,166	3,189	5,363

**** නිකොළොය රාජ්‍ය වතුයාය 2010-2013 සිට මීඩිලන්ඩ්ස් සමග ඒකාබද්ධ කෙරිණි


*** වෛතලාව රාජ්‍ය වතුයාය 2008-2017 සිට මරුනි සමාගම විසින් කළමනාකරණය කෙරේ

** 2018 වර්ෂයට පෙර, වුඩ්සයිඩ් වතුයාය පිටතට පවරා දී තිබුණි

* රබර් කිරිවල DRC අගය කිලෝග්‍රෑම් වලට පරිවර්තනය කර ඇත (Dry Rubber Content)



රූපය **02** - ලබාගත් අමු දළු අස්වැන්න




රූපය **03** - ලබාගත් රබර් ලේටෙක්ස් අස්වැන්න


අමු තේ දළු ප්‍රමාණය 2019-2024

වගුව 13 - අමු දළු තේ දළු ප්‍රමාණය හා රබර් අස්වැන්න - හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම්

අමු තේ දළු ප්‍රමාණය - හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්						
වතුයාය	2019	2020	2021	2022	2023	2024
අලකොළ	2,032	2,513	2,692	2,282	1,974	1,721
කොටගහ	809	1,028	922	751	610	591
ගල්පිහිල්ල	3,362	4,183	5,257	3,765	3,511	3,527
ගෝමර	3,027	3,677	4,359	3,700	2,846	2,893
හාගල	2,241	3,141	3,170	2,590	2,143	1,928
හෙයාපාර්ක්	1,102	1,491	1,506	1,273	1,329	1,115
හුන්නස්ගිරිය	2,548	2,844	2,900	2,302	1,948	1,965
කැලෑබොක්ක	2,553	3,617	3,986	3,480	2,071	2,216
කුඩාඔය	70	488	571			
මිඩ්ලන්ඩ්	2,204	2,334	2,321	2,321	1,738	1,632
නිකොළොය	2,860	3,715	3,901	3,053	2,338	2,181
ඔපල්ගල	2,999	4,317	4,021	2,546	2,216	1,509
රංගල	2,660	2,723	2,869	2,372	3,020	2,915
වෛතලාව	2,093	2,894	3,132	2,443	2,220	2,015
විහාරගල	223	480	608	464	417	567
සාමාන්‍ය	2,282	2,768	2,949	2,486	2,040	1,959
වතුයාය	රබර් (ලේටෙක්ස්) - හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්					
	2019	2020	2021	2022	2023	2024
වලහන්දුව	430	474	457	363	162	272



රූපය **04** - හෙක්ටයාරයකට ලබාගත් අමු දළු අස්වැන්න



රූපය **05** - හෙක්ටයාරයකට ලබාගත් රබර් (ලේටෙක්ස්) අස්වැන්න

වාර්ෂික වර්ෂාපතනය

වගුව 14 - වාර්ෂික වර්ෂාපතනය 2024

වාර්ෂික වර්ෂාපතනය - 2024	
වතුයාය	**වර්ෂාපතනය (මී.මී.)**
අලකොළ	2159
කොටගහ	2660
ගල්පිල්ල	2068
ගෝමර	2748
හාගල	3046
හෙයාර්පාර්ක්	3681
හූන්නස්ගිරිය	1450
කැලැබොක්ක	3600
මිඩ්ලන්ඩ්	2945
නිකොළොය	2255
ඔපල්ගල	2025
රංගල	4635
වෛතලාව	2953
වුඩ්සයිඩ්	374



පසුගිය වර්ෂ 03 සඳහා පොහොර භාවිතය

වගුව 15 - භාවිතා කළ පොහොර ප්‍රමාණය (මෙ.ටොන්)

භාවිතා කල පොහොර , වල් නාශක ප්‍රමාණය හා පිරිවැය 2022-2024

වර්ෂය	භාවිතා කළ පොහොර ප්‍රමාණය (මෙ.ටොන්)	පොහොර පිරිවැය (රු.)	භාවිත කළ වල් නාශක ප්‍රමාණය (ලීටර/කි.ග්‍රෑ)	වල් නාශක පිරිවැය (රු.)
2022	65.5	24,715,000	16 ලීටර	55,100
			1400 කි.ග්‍රෑම්	11,780,000
2023	206	30,852,000	4300 ලීටර	11,497,500
			750 කි.ග්‍රෑම්	4,425,000
2024	223.5	33,807,626	1200 ලීටර	2,441,175
			3000 කි.ග්‍රෑම්	14,940,000


2024 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් නිෂ්පාදනය කරනු ලැබූ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 163.ක් වූ අතර බටහිර මධ්‍යම කලාපයේ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල

රුපියල් 225.40ක් විය.ඒ අනුව, 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ විකුණුම් අනුපාතය, බටහිර මධ්‍යම කලාපයේ විකුණුම් අනුපාතයට වඩා රුපියල් 62.40කින් අඩු අගයක පවත්වා ගෙන ඇත

පසුගිය වසර 03ක සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන වියදම

වගුව 16 – පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක සංසන්දනාත්මක නිෂ්පාදන පිරිවැය

වර්ෂය	අමු තේ දළු කිලෝ ග්‍රෑමයකට නිෂ්පාදන පිරිවැය (රුපියල්)					
	දළු නෙලීම	ක්ෂේත්‍ර වැඩ	පොහොර	වල්නාශක	පොදු වියදම්	එකතුව
2022	55.57	16.72	1.87	10.87	48.57	133.60
2023	54.45	19.12	7.22	18.13	74.64	173.55
2024	61.81	36.53	8.23	17.67	64.91	189.15



රූපය 06 - පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක සංසන්දනාත්මක නිෂ්පාදන පිරිවැය


තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව දැනට තේ නිෂ්පාදන කර්මාන්තශාලා දහයක් ඇති අතර එයින් සී.ටී.සී තේ කර්මාන්තශාලා තුනක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. කැලෑබොක්ක,මිඩ්ලන්ඩ්ස් සහ රංගල තේ කර්මාන්තශාලා තුන මගින් අපගේ වතුයායන් කිහිපයකින් ලබා ගන්නා අමු දළුවලින් තේ නිෂ්පාදනය කරයි. පහත වගුවෙන් එම කර්මාන්තශාලා මඟින් සිදුකරන ලද තේ නිෂ්පාදනය නිරූපනය කරයි.


වගුව **17-** කර්මාන්ත ශාලාවන්ට අදාළ අමු දළු නිෂ්පාදනය ,නිමි තේ නිෂ්පාදනය, නිෂ්පාදන පිරිවැය හා ශුද්ධ විකුණුම් සාමාන්‍ය සංසන්දනාත්මක - **2023-2024**

කර්මාන්තශාලාව	අමු තේ දළු (කිලෝ ග්‍රෑම්)		නිමි තේ (කිලෝ ග්‍රෑම්)		නිපදවූ නිමි තේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස		නිෂ්පාදන පිරිවැය - කිලෝ ග්‍රෑම් එකකට රුපියල්		ශුද්ධ විකුණුම් සාමාන්‍ය - කිලෝ ග්‍රෑම් එකකට රුපියල්	
	2023	2024	2023	2024	2023	2024	2023	2024	2023	2024
කැලෑබොක්ක	1,054,377	903,011	226,748	194,196	21.51	21.51	941.55	1,124.44	792.30	909.71
මිඩලන්ඩ	705,450	297,259	150,270	63,927	21.30	21.51	1,030.16	1,282.02	781.42	825.68
ගෝමර	518,566	523,833	113,147	112,652	21.82	21.51	974.06	984.45	778.55	1,007.46
එකතුව	**2,278,393**	**1,724,103**	**490,165**	**370,775**	**21.51**	**21.51**	**976.22**	**1,109.08**	**785.79**	**924.92**

- අගය දාමය වැඩිකිරීමේ අරමුණින් නවීන තාක්ෂනය අනුව නවීකරණය වූ ගෝමර කර්මාන්ත ශාලාව නිමි තේ නිෂ්පාදන ආරම්භ කරන ලද්දේ 2023 වසරේය.
- රංගල කර්මාන්ත තේ කර්මාන්ත ශාලාව 2022 වසරේ අවසානයේ නවීකරණ කටයුතු සඳහා මේ වනතෙක් ක්‍රිය විරහිත තත්වයේ පවති.



රූපය 07 - නිමි තේ නිෂ්පාදනය



රූපය 08 - කර්මාන්ත ශාලාවන්ට අදාල අමු තේ දළු ප්‍රමාණය නිෂ්පාදනය

කර්මාන්තශාලාව	පිහිටි දිස්ත්‍රික්කය	නිෂ්පාදනය කරන තේ වර්ගය	පෙරීමේ ධාරිතාවය (කිලෝ ග්‍රෑම්)	වර්තමාන තත්ත්වය
කොටගහ	මහනුවර	ඔතඩොක්ස්	1290	අක්‍රිය
ගෝමර	මහනුවර	ඔතඩොක්ස්	8000 (සමස්ත ධාරිතාවය)	අක්‍රිය
හාඟල	මහනුවර	ඔතඩොක්ස්	1419	අක්‍රිය
හුන්නස්ගිරිය	මාතලේ	සීටීසී	1720	අක්‍රිය
කැලෑබොක්ක	මහනුවර	සීටීසී	12000(සමස්ත ධාරිතාවය)	ක්‍රියාත්මකයි
මිඩිලන්ඩ්	මාතලේ	සීටීසී	1400	ක්‍රියාත්මකයි
දන්කන්ද	මාතලේ	ඔතඩොක්ස්	860	අක්‍රිය
නිකොළොය	මාතලේ	ඔතඩොක්ස්	645	අක්‍රිය
රංගල	මහනුවර	සීටීසී	1500	ක්‍රියාත්මකයි

අපගේ වතුයායන්වලින් ලැබෙන අස්වැන්න අඩුවීමත් කර්මාන්තශාලාවල පවතින පැරණි යන්ත්‍රසූත්‍ර මඟින් නිෂ්පාදන කටයුතු සිදුකිරීමත් නිසා නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ මට්ටමක පැවතීම සහ නිෂ්පාදන අලෙවි වන ඉතා අඩු මිල යන හේතු මත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබේ.

මේ තත්ත්වය මහහරවා ගැනීමේ අරමුණින් 2022 වර්ෂයේ ආරම්භ කරන ලද හෙක්ටයාර 160ක් අලුතින් නැවත තේ වගා වැඩසටහන 2023 වසරේදී සාර්ථකව නිමකරන ලදී . එකී ප්‍රාග්ධන ආයෝජනය මඟින් ඉදිරි වර්ෂයේ සිට ලැබෙන නව දළු අස්වැන්න මඟින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අදායම වැඩි කරගැනීමට හැකිවනු ඇත.

මිඩ්ලන්ඩ්ස් තේ කර්මාන්තශාලාව මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි එකම සී.ටී.සී තේ කර්මාන්තශාලාවයි. කැලෑබොක්ක තේ කර්මාන්ත ශාලාව සහ අගය දාමය වැඩිකර ගැනීමේ අරමුණින් නවීකරනය කරන ලද ගෝමර තේ කර්මාන්තශාලා මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

කැලෑබොක්ක තේ කර්මාන්තශාලාව



මිඩ්ලන්ඩ්ස් තේ කර්මාන්තශාලාව



රංගල තේ කර්මාන්ත ශාලාව



නවීකරණය කරන ලද ගෝමර තේ කර්මාන්ත ශාලාව










සංස්ථා තේ



දේශීය වෙළඳපොළට සංස්ථා තේ ලබා දීම තුළින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ මිල, තේ වෙන්දේසිය තුළ උච්චාවචනය වීමෙන් ඇතිවන තාවකාලික මූල්‍ය අර්බුදයන්ට සහනයක් ලබා දීම පිණිස 2016 වර්ෂයේ නොවැම්බර් මස "සංස්ථා තේ" නිෂ්පාදනය ආරම්භ කරන ලදී.

වගුව 19- සංස්ථා තේ අළෙවිවූ පුමාණය- මාසිකව වර්ෂ 2022 ,2023 හා 2024 සංසන්දනාත්මකව


මාසය	අළෙවි වූ තේ පුමාණය (කිලෝග්‍රෑම්)		
	2022	2023	2024
ජනවාරි	4,249	5369	2948
පෙබරවාරි	3,891	4258	2712
මාර්තු	6,753	8737	4278
අප්‍රේල්	4,297	4733	1215
මැයි	1,857	3742	3991
ජුනි	4,506	3924	2889
ජුලි	2,791	3920	3496
අගෝස්තු	3,189	4627	2642
සැප්තැම්බර්	2,486	4720	877
ඔක්තෝම්බර්	4,755	1775	3825
නොවැම්බර්	2,749	3958	3273
දෙසැම්බර්	5,532	4066	3059
එකතුව	**47,054**	**53,828**	**35,203**



රූපය 09 – සංස්ථා තේ අලෙවිය මාසිකව (2022-2024)

වගුව **20** - සංස්ථා තේ අළෙවි අදායම **(2022-2024)**

මාසය	සංස්ථා තේ අළෙවි අදායම (රුපියල්)		
	2022	2023	2024
ජනවාරි	3,253,889	6,756,307	4,556,962
පෙබරවාරි	3,206,595	5,533,657	4,839,298
මාර්තු	5,272,726	11,273,455	7,602,928
අප්‍රේල්	3,520,163	6,992,072	2,261,706
මැයි	1,586,140	6,804,747	7,031,938
ජූනි	3,455,808	6,682,242	5,144,223
ජූලි	2,296,128	6,522,387	6,230,250
අගෝස්තු	2,570,631	7,570,718	4,672,208
සැප්තැම්බර්	2,638,365	7,826,502	1,669,061
ඔක්තෝම්බර්	6,193,980	3,006,145	6,788,332
නොවැම්බර්	3,531,687	6,471,611	5,813,115
දෙසැම්බර්	7,360,445	6,092,555	5,503,432
එකතුව	**44,886,555**	**81,532,397**	**62,113,452**




රූපය **10 –** සංස්ථා තේ අළෙවි අදායම **(2022-2024)**

රබර් නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව පවතිනුයේ එක් රබර් වතුයායක් පමණි. එය ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දුව ප්‍රදේශයේ පිහිටා ඇත. වර්ෂ තුනක් සඳහා මුළු රබර් කිරි නිෂ්පාදනය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 21 - වර්ෂ තුනක් සඳහා මුළු රබර් නිෂ්පාදනය

වර්ෂය	ලේටෙක්ස් (කිලෝ ග්‍රෑම්)	මුළු වියදම (කිලෝ ග්‍රෑම්)	ලාභය / (අලාභය) (රු.)	ශුද්ධ විකිණුම් අගය (රු.)	නිෂ්පාදන පිරිවැය කිලෝ ග්‍රෑම් එකකට (රු.)	කිලෝ ග්‍රෑමයකට ලාභය / (අලාභය) (රු.)
2024	5363	3562855.42	(223,100.80)	622.74	664.34	(41.60)
2023	3189	4,273,444.08	(2,858,364.48)	443.74	1340.06	(896.32)
2022	15,166	12,777,203.34	(4,510,520.06)	545.08	842.49	(297.41)



රූපය 11 - රබර් නිෂ්පාදනය (2022-2024)

භාණ්ඩාගාර ප්‍රතිපාදන

මෙම වසරේදී පසුගිය වසර මෙන් වැටුප් හා එදිනෙදා වියදම් කළමනාකරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගෙන නොමැත.

වගුව 22 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් පිලිබඳ සාරාංශය


අයිතමය	2021	2022	2023	2024
මෙහෙයුම් වියදම් (කම්කරු වේතන සහ කාර්ය මණ්ඩල වැටුප්)	-	-	-	-
ව්‍යවස්ථාපිත ගෙවීම් (සේවක අර්ථ සාධක අරමුදල /සේවක භාරකාර අරමුදල /පාරිතෝෂික)	-	-	63.90	170.40
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සංවර්ධන කටයුතු (තේ නැවත වගාව, කර්මාන්ත ශාලා නවීකරණ, GCF නකල්ස් ව්‍යාපෘතිය හා අනෙකුත් සංවර්ධන කටයුතු)	14.00	178.64		8.09
මුළු ලැබීම් (රුපියල් මිලියන)	**14.00**	**178.64**	**63.90**	178.49

2024වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සහ **2024** වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අනුව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පහත පරිදි නිරූපණය වේ

වගුව 23 – 2024 -2023 වර්ෂයන් සඳහා සංසන්දනාත්මක මූල්‍ය කාර්ය සාධනය -

විස්තරය	**2024** ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් **- 2024**	වෙනස %	**2023** ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - **2023**	වෙනස **%**
සැකසූ තේ - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	793.42	933.18	17.61	763.41	802.62	5.14
ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.) රුපී./කිලෑ	844.80	952.80	12.78	800.98	875.06	9.25
රබර් - නිෂ්පාදන පිරිවැය (C.O.P.) රුපී./කිලෑ	919.69	1,968.56	114.05	714.50	1,340.06	87.55
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.)	850.00	622.82	(26.73)	450.00	443.74	(1.39)
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - සැකසූ තේ (කිලෑ)	1,504,384	1,027,277	(31.71)	2,037,288	1,134,951	(44.29)
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - රබර් (කිලෑ)	10,000	5,363	(46.37)	22,500	3,189	(85.83)
ආදායම් - රුපියල්						
සැකසූ තේ සහ තේ දළු	1,270,899,285	978,791,972	77.02	1,699,700,331	1,011,201,027	59.49
රබර් (ලේටෙක්ස්)	5,500,000	3,340,226	60.73	10,125,000	1,414,816	13.97
මුළු ආදායම	**1,276,399,285**	**982,132,198**	76.95	1,709,825,331	1,012,615,843	59.22
අඩු කළා: නිෂ්පාදන පිරිවැය - රුපියල්						
සැකසූ තේ සහ තේ දළු	1,193,614,983	958,630,982	80.31	1,555,278,627	910,936,665	58.57
රබර්	9,196,944	10,557,412	114.79	16,076,197	4,273,445	26.58
මුළු නිෂ්පාදන පිරිවැය - රුපියල්	**1,202,811,927**	**969,188,394**	80.58	1,571,354,824	915,210,110	58.24
දළ ලාභය/(පාඩුව) - වතුයාය - රුපියල්	**73,587,358**	**12,943,804**	17.59	138,470,507	97,405,733	70.34
එක් කළා: වෙනත් ආදායම් - රුපියල්						
වෙනත් ආදායම් - වතුයාය	343,877,805	174,381,425	50.71	821,870,441	122,905,534	14.95
වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය	35,392,570	26,700,599	75.44	83,676,350	12,838,350	15.34
මුළු වෙනත් ආදායම් - වතු සහ ප්‍රධාන කාර්යාලය	**379,270,375**	**201,082,024**	53.02	905,546,791	135,743,884	14.99
මුළු ආදායම් - රුපියල්	**452,857,733**	**214,025,829**	47.26	1,044,017,297	233,149,617	22.33
අඩු කළා: වියදම් - රුපියල්						
පරිපාලන වියදම් - වතුයාය	107,680,547	95,997,467	89.15	114,247,005	94,054,032	82.33
-ප්‍රධාන කාර්යාලය	160,807,465	126,936,616	78.94	72,340,117	109,520,497	151.40
පුද්ගල වියදම් - ප්‍රධාන කාර්යාලය	268,488,012	222,934,082	83.03	71,630,222	49,200,419	68.69
මූල්‍ය ගාස්තු - වතුයාය	11,300,674	6,039,928	53.45	9,594,182	6,808,618	70.97
-ප්‍රධාන කාර්යාලය	57,398,000	53,692,274	93.54	40,800,000	66,239,953	162.35
මුළු වියදම් - රුපියල්	68,698,674	89,732,202	130.62	308,611,526	325,823,519	105.58
ලාභය/(පාඩුව) - වතු සහ ප්‍රධාන කාර්යාලය - රුපියල්	**115,671,047**	**(68,640,456)**	**(59.34)**	**735,405,771**	**(92,673,902)**	**(12.60)**

මානව සම්පත් කළමණාකරණය



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මානව සම්පත්

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය පහත වගුවෙන් නිරූපණයවේ.

වගුව 24– රාජ්‍ය වැවිලි සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය

තනතුර	අනුමත තනතුරු ගණන		
	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්
ප්‍රධාන කාර්යාලය			
සභාපති	1		
සාමාන්‍යාධිකාරී	1		
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මූල්‍ය	1		
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- පාලන	1		
කළමණාකරු -පාලන/පිරිස්	1		
කළමණාකරු- අලෙවි	1		
කළමණාකරු - නීති	1		
කළමණාකරු - ඉඩම්	1		
කළමණාකරු - පාලන	-		
කළමණාකරු - ප්‍රසම්පාදන	1		
අභ්‍යන්තර විගණක	1		
ගණකාධිකාරී	1		
ජ්‍යේෂ්ඨ වතු අධිකාරී	1		
වතු අධිකාරී	14		
සහකාර වතු අධිකාරී	22		
සහකාර කළමණාකරු - වැවිලි	1		
සහකාර කළමණාකරු - ප්‍රවාහන	1		
සහකාර කළමණාකරු - අලෙවි	1		
සහකාර කළමණාකරු - ප්‍රසම්පාදන	1		
සහකාර ගණකාධිකාරී	1		
ඉඩම් නිලධාරී	1		
තොරතුරු තාක්ෂණ නිලධාරී	1		
පරිපාලන නිලධාරී	1		
අලෙවි ප්‍රවර්ධන නිලධාරී		1	
මුදල් එකතු කිරීමේ නිලධාරී		1	
පරිපාලන සහායක	-		
ගිණුම් සහකාර	1		
විගණන නිලධාරී	1		
පුද්ගලික සහකාර -සභාපති	1		
පුද්ගලික සහකාර - සාමාන්‍යාධිකාරී	1		
පරිපාලන නිලධාරී - විගණන	1		
පරිපාලන සහකාර	28		
වැඩ සුපරීක්ෂක	0		
රියදුරු	8		
කාර්යාල සහායක	3		
කම්කරු	5		
ප්‍රාදේශීය			
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- වැවිලි	1		
වැවිලි කළමණාකරු	1		
සහකාර කළමණාකරු	1		
සහකාර ගණකාධිකාරී	-		
කළමනාකරණ සහකාර	2		
ජ්‍යේෂ්ඨ සහකාර ලිපිකරු			
කණිෂ්ඨ ලිපිකරු			
කාර්යාල සහායක	-		
එකතුව	**110**	**2**	**-**

2024 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකරණ, අධීක්ෂණ සහ නිෂ්පාදන කාර්ය මණ්ඩලය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 25 – රාජ්‍ය වැවිලි සංස්ථාවේ සතු මානව සම්පත්

වතුයාය	වතු අධිකාරිවරුන් ගණන	සහකාර වතු අධිකාරිවරුන් ගණන	කාර්යය මණ්ඩලය		කම්කරුවන්		එකතුව
			ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	අනියම්	
අලකොළ	1	1	20	-	254	0	276
කොටගහ	1	1	12	2	148	0	164
ගල්පිල්ල	1	1	23	1	157	25	208
ගෝමර	1	3	29	-	209	27	269
හාගල	1	1	12	-	144	0	158
හෙයාර්පාර්ක්	1	1	8	-	89	9	108
හුන්නස්ගිරිය	1	2	14	-	174	1	192
කැලෑබොක්ක	1	3	38	-	701	49	792
මිඩ්ලන්ඩ්	1	2	20	-	201	32	256
නිකොළොය	1	1	5	-	5	30	42
ඔපල්ගල	1	0	8	-	54	11	74
රංගල	1	1	20	-	183	7	212
වලහන්දුව		1	9	-	13	37	60
වෛතලාව	1		5	-	60	0	66
වූඩ්සයිඩ්	1	-	5	-	6	24	36
විහාරගල		1	1	-	39	2	43
ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාලය	-	-	54				54
එකතුව	**14**	**19**	**283**	**3**	**2437**	**254**	**3010**

2024 වසර අවසන් වන විට ප්‍රධාන කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩල සංඛ්‍යාව 54ක් වූ අතර, 2023 වර්ෂයේදීද එම අගය 49ක් ලෙස වාර්තා කර ඇත. මෙම කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා 2024 වර්ෂයේදී රුපියල් මිලියන 52.36ක් වැය කර ඇති අතර 2023 වර්ෂයේදී රුපියල් මිලියන 45.83ක් වැය කර ඇත. 2023 ට සාපේක්ෂව 2024 දී රු.මිලියන 6.53ක් එනම් 14.25%කින් කාර්ය මණ්ඩල වැටුප් වැඩිවී ඇත. 2024 වසර අවසන් වන විට වතු අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් ඇතුළු කාර්යාල කාර්ය මණ්ඩලය සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය 283ක් වූ අතර 2023 වර්ෂයේදී එය 319 ලෙස වැඩි අගයක් වාර්තා කර ඇත. 2024 වර්ෂයේදී රුපියල් මිලියන 144.49ක් මෙම කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2023 වර්ෂයේදී ඒ සඳහා රු. මිලියන 138.75ක් වැයකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් හා විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.

වගුව 26 – අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන කමිටු රැස්වීම්

අංකය	රැස්වීමේ නම	රැස්වීමේ දිනය	රැස්වීමේ අංකය
1	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	2024.01.30	47
		2024.02.27	48
		2024.03.25	49
		2024.04.26	50
		2024.05.30	51
		2024.06.27	52
		2024.07.29	53
		2024.09.02	54
		2024.09.13	විශේෂ 54
2	විගණන කමිටු රැස්වීම්	2024.037.07	1
		2024.06.04	2
		2024.09.10	3
		2025.02.07	4

2024 වර්ෂයේදීද 2023 වර්ෂයේදී පරිදිම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුලා ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ තත්ත්වාගණය කල මතය රදවා ගැනීමට හැකිවී ඇති අතර තවදුරටත් මුලා ප්‍රකාශන තුල පවතින අඩුපාඩු ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුලා අංශය මඟින් නිවැරදී කරමින් පවතින බැවින් ඉදිරියේදී තත්ත්වාගණය නොකල මතයක් දක්වා වැඩිදියුණු වීමට හැකිවනු ඇත.

මූල්‍ය වාර්තා 2024



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව					
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය					
ශ්‍රී ලංකා රුපියල්වලින්.					
දෙසැම්බර් 31 වන දිනට	**සටහන**	**පිටු අංක**	**2,024**		**2023**
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත හා උපකරණ	8	13	1,443,900,323		1,362,996,754
ජීවවිද්‍යාත්මක වත්කම් -පාරිභෝජ්‍ය	9	15	3,362,969,544		3,361,498,115
ආයෝජන දේපළ	10	16	1,611,520,641		1,611,520,641
ස්ථාවර කැන්පතු			-		-
විලම්භීත වත්කම්	26	21	307,111		350,984
මුළු ජංගම නොවන වත්කම්			**6,418,697,619**		**6,336,366,494**
ජංගම වත්කම්					
තොග	11	17	114,432,691		86,221,740
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	12	17	348,085,497		309,421,777
මුදල් හා මුදල් හා සමාන දෑ	13	18	62,822,063		5,088,843
මුළු ජංගම වත්කම්			**525,340,252**		**400,732,360**
මුළු වත්කම්			**6,944,037,871**		**6,737,098,854**
ස්කන්ධය හා වගකීම්					
ප්‍රාග්ධන හා සංචිත					
දායකත්ව ප්‍රාග්ධනය	14	18	6,314,881,284		6,136,392,851
රඳවාගත් ආදායම්			(2,587,033,547)		(2,355,053,627)
මුළු ස්කන්ධය			**3,727,847,737**		3,781,339,224
ජංගම නොවන වගකීම්					
බැංකු ණය	17.1	19	221,977,368		-
කල් දැමූ ආදායම	16	18	49,159,332		-
සේවක ප්‍රතිලාභ වගකීම්	15	18	763,931,645		584,181,197
මුළු ජංගම නොවන වගකීම්			1,035,068,344		584,181,197
ජංගම වගකීම්					
මුළු ජංගම නොවන වගකීම්					
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	**17**	**19**	2,178,669,294		2,156,877,357
බැංකු ණය	**16.1**	**19**	-		79,310,000
බැංකු අයිරා	**13**	**18**	2,452,494		135,391,076
මුළු ජංගම වගකීම්			**2,181,121,788**		**2,371,578,433**
මුළු ස්කන්ධය හා වගකීම්			**3,216,190,132**		**2,955,759,630**
			6,944,037,871		**6,737,098,854**

පිටු අංක 5 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බව යටින් අත්සන් කර ඇති අය විසින් සහතික කරනු ලැබේ.

එස්.අයි.එම්. හසන් මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් අනුමත කර අත්සන් කරනු ලැබේ.

ආචාර්ය ආර්. ආර්. එම්. එස්. කේ. රණතුංග
සභාපති

ආර්. එම්. එස්. පී. එස්. බණ්ඩාර මහතා
මණ්ඩල සාමාජික

ජී. ඩී. ටී. එස්. පෙරේරා
මණ්ඩල සාමාජික

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව							
ආදායම් ප්‍රකාශය							
ශ්‍රී ලංකා රුපියල්වලින්							
දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වර්ෂය	සටහන්		පිටු අංක.		**2024**		**2023**
ආදායම	18		20		991,042,009		1,012,615,844
විකුණුම් පිරිවැය					(969,188,394)		(915,210,110)
දළ ලාභය / (අලාභය)					21,853,615		97,405,733
වෙනත් ආදායම්	19		20		192,172,214		134,729,318
පරිපාලන වියදම්	20		20		(222,934,082)		(252,774,948)
මෙහෙයුම් ලාභය / (අලාභය)					(8,908,253)		(20,639,897)
මූල්‍ය ආදායම්	19		20		144,277		1,014,565
මූල්‍ය වියදම්	21		20		(59,876,479)		(73,048,571)
කාල සීමාව සඳහා ලාභය/ (අලාභය).					**(68,640,456)**		**(92,673,903)**
පිටු අංක 5 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.							

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල්වලින්.

2024 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා

	ප්‍රාග්ධනය	ඉඩම් දායකත්වය	සමුච්චිත ලාභය/(පාඩුව	එකතුව
	රු.	රු.	රු.	රු.
2023 ජනවාරී 01 දිනට ශේෂය	3,851,890,925	2,220,601,926	(2,258,965,172)	3,813,527,679
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන	63,900,000	-	-	63,900,000
වසරෙහි ලාභය	-	-	(92,673,903)	(92,673,903)
පෙර වසරෙහි ගැළපීම් (සටහන 26)	-	-	(3,414,552)	(3,414,552)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	3,915,790,925	2,220,601,926	(2,355,053,627)	3,781,339,224
2024 ජනවාරී 01 දිනට ශේෂය	3,915,790,925	2,220,601,926	(2,355,053,627)	3,781,339,224
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන	178,488,434	-	-	178,488,434
වසරෙහි ලාභය	-	-	(68,640,456)	(68,640,456)
පෙර වසරෙහි ගැළපීම් (සටහන 26)	-	-	(163,339,464)	(163,339,464)
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	4,094,279,359	2,220,601,926	(2,587,033,547)	3,727,847,738

පිටු අංක 5 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව				
මුදල් ප්‍රවාහ ප්‍රකාශය				
ශ්‍රී ලංකා රුපියල්වලින්				
දෙසැම්බර් 31 වන අවසන් වන වර්ෂය සඳහා	සටහන්	2024		2023
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්				
බදුකරණයට පෙර ශුද්ධ ලාභය /(පාඩුව)		**(68,640,456)**		**(92,673,903)**
ගැළපීම් :				
ජීවවිද්‍යාත්මක වත්කම් ක්ෂයවීම්	8.1	4,289,928		4,723,618
වත්කම් ක්ෂයවීම්	8	17,051,852		14,197,209
විලම්භිත වත්කම් ක්‍රමක්ෂය කිරීම	27	43,873		43,873
මූල්‍ය ව්‍යදම්	21	59,876,479		73,048,571
මූල්‍ය ආදායම	19	(144,277)		(1,014,565)
පාරිතෝෂික වෙන්කිරීම්	15	38,927,520		32,279,972
දේපල, කම්හල් සහ උපකරණ (PPE) බැහැර කිරීමෙන් පාඩුව		(451,670)		-
විගණන ගාස්තු වෙන්කිරීම්		510,356		580,599
රක්ෂණ වෙන්කිරීම්		894,846		1,490,093
රජයේ ප්‍රදාන හා ආධාර	19	353,835		(2,655,167)
පෙර වර්ෂයේ ගැළපීම්	26	**12,461,458**		**(3,414,552)**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර ලාභය		65,173,744		26,605,748
කාරක ප්‍රාග්ධන වෙනස්කම්				
තොග (වැඩිවීම්)/ අඩුවීම්	11	(28,210,951)		(18,822,482)
වෙළඳ හා වෙනත් ලැබීම් (වැඩිවීම්)/ අඩුවීම්	12	(38,663,720)		(7,979,242)
ජංගම වගකීම් (වැඩිවීම්)/ අඩුවීම්	17	22,753,215		149,505,740
මෙහෙයුම්වලින් උත්පාදනය කරන ලද මුදල්		**(44,121,457)**		**122,704,016**
පාරිතෝෂික ගෙවීම්		(26,260,370)		(22,738,709)
මූල්‍ය ආදායම	19	144,277		1,014,565
මූල්‍ය පිරිවැය ගෙවීම්	21	(58,276,479)		(51,394,143)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්		**(63,340,286)**		**76,191,478**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ				
දේපළ, පිරියත සහ උපකරණ වලට එකතු කිරීම්	8	(112,543,152)		(187,693,245)
පාරිභෝජන ජීව විද්‍යාත්මක වත්කම් වලට එකතු කිරීම්	9	(1,471,429)		(932,819)
දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම්	8	(2,652,300)		-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය		**(116,666,881)**	#	**(188,626,064)**
මුදල් ප්‍රවාහයෙන් ලැබෙන මූල්‍ය ක්‍රියාකාරකම්				
භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම්	14	178,488,434		63,900,000
රජයේ ප්‍රදාන හා සහනාධාර	19	353,835		2,655,167
කල් දැමූ ආදායම	16	49,159,332		-
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම		-		9,785,400
බැංකු ණය		237,100,000		-
බැංකු ණය ගෙවීම - මහජන බැංකුව		(15,122,632)		(20,690,000)
බැංකු අයිරාව පියවීම		-		(35,480,000)
බැංකු ණය පියවීම	17.1	(79,300,000)		-
මූල්‍ය කටයුතු වලින් ඇතිවූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		370,678,968		20,170,567
ශුද්ධ වැඩිවීම් අඩුවීම් මුදල් හා මුදල් සමාන දෑ		**190,671,802**		**(92,264,019)**
මුදල් හා මුදල් සමාන දෑ හි වෙනස්වීම්				
කාලසීමාව ආරම්භයේදී	13	(130,302,233)		(38,038,213)
වසරේ වැඩිවීම්/අඩුවීම්		190,671,802		(92,264,019)
වසර අවසානයේදී මුදල් හා සමාන දෑ	13	60,369,569		(130,302,233)
වසර අවසානයේ මුදල් හා මුදල් සමානකයන් (සටහන 13)				
අතේ ඇති මුදල් සහ බැංකුවේ ඇති මුදල්				
ප්‍රධාන කාර්යාලය		54,669,912		3,125,608
වතු		8,152,152		1,963,235
බැංකු අයිරාව		(2,452,494)		(135,391,076)
		60,369,569		(130,302,233)

ආයතනික තොරතුරු

1.සාමාන්‍ය
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (සංස්ථාව) යනු 1958 අංක 4 දරණ පනත යටතේ 1958 දී සංස්ථාගත කරන ලද සහ ශ්‍රී ලංකාවේ පදිංචි රජයේ සංස්ථාවකි. එය කොළඹ 10, සිරි ධම්ම මාවත, අංක 257 දරණ ස්ථානයේ පිහිටි රජයේ සංස්ථාවකි.

සංස්ථාව විසින් දෙසැම්බර් 31 න් අවසන් වන මාස දොළහක කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන අතර, මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර දී/අනුමත කරනු ලබයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්
සැකසූ නිමි තේ නිෂ්පාදනය සහ තේ වෙන්දේසිය හරහා අලෙවි කිරීම, රබර් කිරි සහ සුළු හෝ අපනයන භෝග (කරාබු නැටි, ගම්මිරිස්, එනසාල්, කුරුඳු ආදිය) විකිණීම සහ සංස්ථාවේ වාණිජ දැව සිටුවීම සහ විකිණීම.

2. සැකසීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර ජීව විද්‍යාත්මක වත්කම් පමණක් සාධාරණ අගයකට (fair value) ඉදිරිපත් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිලිබඳ සාරාංශය

3.1.1 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සංස්ථාව විසින් පහත සඳහන් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනී.

3.1.2 දේපල පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීම් සහ සමුච්චිත හායන පාඩු ඇතිනම් ඒවා අඩුකිරීමෙන් පසුවය. එවැනි පිරිවැයක් තුළ දේපල, පිරියත හා උපකරණවල ආංශික කොටස් ආදේශ කිරීමේ පිරිවැය සහ හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, දිගුකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වේ. දේපල, පිරියත හා උපකරණවල සුවිශේෂී කොටස් කාල අන්තරයක් සහිතව ආදේශ කිරීමට අවශ්‍ය වන්නේ නම්, සංස්ථාව එසේ ආදේශ කරන ලද කොටස හඳුනාගැනීමෙන් තොරව බැහැර කරන අතර, ඊට අදාල ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත, ක්‍රමක්ෂය කළ හැකි නව කොටසක් හඳුනාගැනීමට ලක් කරයි. මේ හා සමානව, යම් ප්‍රධාන පෙලේ විමර්ශනය කිරීමක් සිදුකළහොත්, හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, එහි පිරිවැය, ආදේශකයක් ලෙස එම පිරියත හා උපකරණයෙහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම තුල හඳුනාගැනේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය හටගත් පිරිවැය ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ.

3.1.3 ක්ෂය කිරීම

වර්ෂය තුල අත්පත්කරගත් හා බැහැර කරන ලද දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය වෙන් කිරීම ඒවා මිලදී ගත් දිනයේ සිට බැහැර කර ලද දිනය දක්වා සිදු කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය කාලයන් සහ ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ:

අයිතමය	ප්‍රයෝජනවත් ආයු කාලය	අනුපාතය
ගොඩනැගිලි	20	5%
මෝටර් රථ වාහන	4	25%
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	8	12.5%
කාර්යාල උපකරණ	8	12.5%
යන්ත්‍රෝපකරණ	8	12.5%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	3	33.33%

3.1.4 ජීවවිද්‍යාත්මක වත්කම්

ජීවවිද්‍යාත්මක වත්කම් යම් ජීවී සත්ත්වයෙකුට හෝ පැළෑටියකට අදාල වේ. ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 41ට අනුව, ජීවවිද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් යම් පොදු ලක්ෂණ කිහිපයක් ඇත, එනම්, (අ) වෙනස් වීමට ඇති හැකියාව (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හැකියාව) (ආ) වෙනස්වීම කළමනාකරණය කරගැනීම (කළමනාකරණය මගින් එම ක්‍රියාවලිය සිදුවීම සඳහා අවශ්‍ය තත්ත්වයන් වැඩිදියුණුකිරීමෙන් ජීවවිද්‍යාත්මක පරිවර්තනය වීම සඳහා පහසුකම් සලසයි. එවැනි කළමනාකරණයක් මගින් කෘෂිකාර්මික කටයුතු වෙනත් කටයුතුවලින් වෙන් කර දක්වයි. උදාහරණයක් ලෙස, කළමනාකරණය නොකරන ලද මූලාශ්‍ර මගින් අස්වැන්න ලබාගැනීම) සහ (ඇ) වෙනස්වීම ගණනය කිරීම (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හෝ එමගින් ඇති වූ වෙනස දෛනික කළමනාකරණ කාර්යයක් ලෙස ගණනය කර, අධීක්ෂණය කෙරේ.)

ජීවවිද්‍යාත්මක වත්කම්, ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් සහ පාරිභෝජ්‍ය ජීවවිද්‍යාත්මක වත්කම් ලෙස දෙවැදෑරුම් වේ.

3.1.4.1 ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්

පාරිභෝජ්‍ය ජීවවිද්‍යාත්මක වත්කම් හැර අනෙකුත් ජීව විද්‍යාත්මක වත්කම් ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, සංස්ථාවට අදාළව තේ පඳුරු, රබර් ගස් හා ඕනෑම ක්ෂේත්‍ර වගාවක් වැනි ප්‍රධාන පෙළේ වැවිලි කටයුත්තක් ඊට අයත් විය හැකිය. මෙම ස්වයං ප්‍රතිජනන ජීව විද්‍යාත්මක වත්කම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් ලබා දී ඇති විකල්පය අනුව එම වත්කම්වල අගය, පිරිවැයෙන් සමුච්චිත ක්ෂයකිරීම් සහ යම්කිසි හායන අලාභයන් ඇත්නම් අඩුකොට ඉදිරියට ගෙන යනු ලබන අතර දේපළ, පිරියත හා උපකරණ සමඟ 2024 වසරේ සිට ඉදිරිපත් කරණු ලැබේ.

ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය පහත සඳහන් පරිදි වේ:

පොල්	වසර 25
ගම්මිරිස්	වසර 15
රබර්	වසර 35
කරාබුනැටි	වසර 50
කෝපි	වසර 25
පුවක්	වසර 40
එනසාල්	වසර 20
කොකෝවා	වසර 20
කුරුඳු	වසර 25
සාදික්කා	වසර 30
ඉඟුරු	වසර 01
තේ	වසර 100

3.1.4.2 පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්

කෘෂිකාර්මික නිෂ්පාදිතයක් ලෙස අස්වැන්න ලබාගත හැකි හෝ ජීවවිද්‍යාත්මක වත්කම් ලෙස අලෙවි කළ හැකි වත්කම් පාරිභෝජ්‍ය ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, ඊට දැව ඇතුළත් වේ. කෘෂිකාර්මික නිෂ්පාදනවල අගයකිරීම, ඒවායේ සාධාරණ අගයෙන් ඇස්තමේන්තුගත අලෙවි පිරිවැය සහ වෙළඳපොළට රැගෙන යාම සඳහා අවශ්‍ය වියදම් අඩු කිරීමෙන් පසු සිදු කරනු ලැබේ.එම අගය කිරීමෙන් ලැබෙන ලාභය හෝ පාඩුව විස්තීරණ ආදායම් ප්‍රකාශය යටතේ ඉදිරිපත් කරනු ලැබේ.

3.1.4.3 විලම්භීත වත්කම්

විලම්භීත වත්කම් වාර්ෂිකව 10%ක අනුපාතයට ක්‍රමක්ෂය කෙරේ.

3.1.5 ආයෝජන දේපල

ප්‍රාග්ධන ඇගයීම සඳහා සහ/හෝ කුලී ආදායම් ඉපැයීම සඳහා තබාගත් දේපල ආයෝජන දේපල තුළ අන්තර්ගත වේ. ආයෝජන දේපළ මුල් අවස්ථාවේදී, අදාල ගණුදෙණු පිරිවැය හා ඉන් අනතුරුව යම් දේපලකට එකතු කිරීමක්, යම් දේපලක් ආදේශ කිරීමක් හෝ අලුත්වැඩියා කිරීමක් සම්බන්ධයෙන් හටගත් පිරිවැය ද ඇතුළත් වන පරිදි පිරිවැයෙන් ගණනය කරනු ලැබේ.ඉන්පසුව සිදු කෙරෙන ගණනය කිරීම් ද සමුච්චිත ක්ෂය අඩු කර ලැබෙන පිරිවැයෙන් ගණනය කෙරේ.

3.1.6 දැනට සිදු කරගෙන යන ප්‍රාග්ධන කාර්යයන්

වර්ෂය තුල හට ගත්, එහෙත් ශේෂ පත්‍රය සකස් කරන දිනට ප්‍රාග්ධනීයකරණය නොකරන ලද ප්‍රාග්ධන වියදම්, දැනට සිදු කෙරෙන ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුල ප්‍රාග්ධනීයකරණය කරන ලද සහ භාවිත කළ ප්‍රාග්ධන වත්කම්, දේපල, පිරියත හා උපකරණවලට මාරු කර ඇත.

3.1.7 කල්බදු පහසුකම්

යම් පහසුකම් සැලසීමක් කල්බදු පහසුකමක්ද යන්න හෝ ඊට කල්බදු පහසුකමක් ඇතුළත් වන්නේද යන්න තීරණය කිරීම, එකී පහසුකමේ අන්තර්ගතය මත පදනම් වන අතර, එම පහසුකම් සැලසීම සපුරාලීම, යම් නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිත කිරීම මත සහ එමගින් වත්කම භාවිත කිරීමට අයිතිය ලබාදෙන්නේද යන්න මත රඳා පවතී.

මූල්‍ය කල්බදු පහසුකම්

වත්කම්හි අයිතියට ආනුශංගික වන, එහෙත් අත්‍යවශ්‍යයෙන් නීතිමය හිමිකම් නොවන සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු අන්දමින් ප්‍රතිපාර්ශ්වයන් වෙත මාරු කරන ගිවිසුම්, මූල්‍ය කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ.සංස්ථාව මූල්‍ය කල්බදු පහසුකම් යටතේ කල්බදු පහසුකම ලබාගන්නා වන අවස්ථාවන්හිදී, කල්බදු පහසුකමට යටත් වත්කම් ප්‍රාග්ධනීයකරණය කර, 'දේපල, පිරියත හා උපකරණ' තුළ ඇතුළත් කරන අතර, කල්බදු පහසුකම් සපයන්නා හට ඇති කෙරෙන වගකීමේ බැඳීම 'කල්බදු ණයහිමිකරුවන්' තුළ ඇතුළත් කෙරේ.
මූල්‍ය කල්බදු පහසුකම සහ ඊට අදාල වගකීම මූලික වශයෙන් වත්කමේ සාධාරණ වටිනාකමට හඳුනාගැනෙන අතර සාධාරණ වටිනාකමෙහි අගය අවම කල්බදු ගෙවීම්වල වත්මන් වටිනාකමට වඩා අඩු අගයක් ගන්නේ නම්, අවම කල්බදු ගෙවීම්වල වත්මන් වටිනාකමට වගකීම හඳුනාගැනේ. වගකීමේ ශේෂය මත ස්ථීර පොලී අනුපාතයක් ලබා දිය හැකි පරිදි කල්බදු පහසුකම තුළ සැඟවුණු පොලී අනුපාතය මත පදනම්ව කල්බදු කාලසීමාව තුල 'ශුද්ධ පොලී ආදායම' තුල ගෙවිය යුතු මූල්‍ය ගාස්තු හඳුනාගැනේ.

මෙහෙයුම් කල්බදු

අනෙකුත් සියලුම කල්බදු පහසුකම් මෙහෙයුම් කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ. සංස්ථාව කල්බදු පහසුකම ලබාදෙන්නා වන අවස්ථාවන්හිදී, කල්බදු දී ඇති වත්කම් ශේෂ පත්‍රය තුළ හඳුනා නොගැනේ. කල්බදු කාලසීමාවන් තුල මෙහෙයුම් කල්බදු යටතේ ගෙවිය යුතු හා ලැබිය යුතු කුලී ගාස්තු සෘජු රේඛීය පදනම මත ගිණුම්ගත කෙරෙන අතර, පිළිවෙලින් 'පරිපාලන වියදම්' සහ 'වෙනත් මෙහෙයුම් ආදායම්'හි ඇතුළත් කෙරේ.

3.2.1 තොග/භාණ්ඩ ලේඛන

තොග/භාණ්ඩ ලේඛන, පෙර පිවිසි පෙර නිකුත් පදනම මත අගයන ලද, යල්පැන ඇති හා සෙමින් ක්‍රියාකරන අයිතමයන් සඳහා දීමනා ලබාදීමෙන් අනතුරුව, පිරිවැය හා නිෂ්කාශනය කළ හැකි ශුද්ධ උපලබ්ධි අගයෙන් කවර හෝ අඩු අගයකට හඳුනාගැනේ.

භාණ්ඩ ලේඛන ගණනය කිරීම

3.2.2 භාණ්ඩ ලේඛනවල පිරිවැය

අමුද්‍රව්‍ය

යම් ආනුශංගික වියදමක් ද සහිතව මිලදීගැනීම්වල පිරිවැය.

දැනට සිදු කරගෙන යන කාර්යයන්
අමුද්‍රව්‍ය පිරිවැය හා විවලනය වන මුළු නිෂ්පාදන වියදම්.

නිම කර ඇති භාණ්ඩ
අමුද්‍රව්‍ය පිරිවැය හා විවලනය වන මුළු නිෂ්පාදන වියදම්.

3.2.3 මුදල් හා මුදල් සමානයන්

මුදල් හා මුදල් සමානයන් තුළ අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්, ස්ථාවර තැන්පතු ආයෝජන, අතිශයින් ඉහළ ද්‍රවශීලතාවකින් යුතු, මාස හයකින් හෝ ඊට අඩු කාලයකින් නියම ලෙස කල් පිරෙන වෙනත් කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ. ශේෂ පත්‍රයේ ජංගම වගකීම්හි ණය ගැනීම් තුළ බැංකු අයිරා අගයන් පෙන්නුම් කෙරේ.

3.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබාගැනීමේ අරමුණින් සිදු කරන පර්යේෂණ කටයුතු සඳහා දරන ලද වියදම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනාගැනේ.

4. වගකීම් හා ප්‍රතිපාදන

4.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

4.1.1 අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳී සිටියි. සංස්ථාවේ අඛණ්ඩ වසර පහක කාලසීමාවක් සම්පූර්ණ කිරීම මත පමණක් යම් සේවකයෙකු සම්බන්ධයෙන් පාරිතෝෂික පිළිබඳ වගකීමක් ඇති කෙරේ. මෙම වගකීම සපුරාලීම පිණිස, ශේෂ පත්‍රය තුළ යම් ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යයි. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදන හා වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර වෙනස ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

මෙම වගකීම සඳහා බාහිර වශයෙන් අරමුදල් නොසැපයේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ වර්ග කෙරේ.

4.1.2 අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂික

සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා දායකත්ව මුදල් සපයනු ලැබේ. අදාළ රෙගුලාසිය හා සමගාමීව, අදාල දායකත්ව අරමුදල් මගින් මෙම දායකත්ව මුදල් ආවරණය කෙරේ. සේවකයින් ආවරණය කරනු ලබන සැලසුම් සඳහා දායකත්වය ලබාදීමේ වගකීම වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

සේවක අර්ථසාධක අරමුදල

සංස්ථාව හා සේවකයින් විසින් මූලික වැටුප මත 12%ක් සංස්ථාවෙන්ද, 10%ක් සේවකයින්ගෙන්ද වන පරිදි දායක මුදලක් ලබා දෙයි.

සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදල

සංස්ථාව විසින් මූලික වැටුප මත සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායක මුදලක් ලබා දෙයි.

5. ආදායම් ප්‍රකාශය

සංස්ථාවේ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී සංස්ථාවේ කාර්යසාධනයේ අංග සාධාරණය ලෙස නිරූපණය වනු පිණිස වියදම් ක්‍රමවේදය යොදාගෙන ඇත.

5.1.1 ආදායම් හඳුනාගැනීම

සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා එනු ලැබිය හැකිවීමේ සහ ගෙවීම සිදු කෙරෙන අවස්ථාව නොසලකා හරිමින් සාධාරණ ලෙස ආදායම් ගණනය කළ හැකිවීමේ මට්ටම දක්වා ආදායම් හඳුනාගැනේ/සටහන් කෙරේ. ගිවිසුම්ගත ආකාරයෙන් අර්ථනිරූපිත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින්, ලද හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ වටිනාකමට ආදායම් ගණනය කෙරේ.

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ පරිපාටිය ද සපුරාලිය යුතුය:

භාණ්ඩ අලෙවි කිරීම

සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදාහැරීම මත භාණ්ඩවල අයිතියේ සුවිශේෂී අවදානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත විතැන් වන විටදී, භාණ්ඩ අලෙවියෙන් ලද ආදායම් හඳුනාගැනේ.

සේවා සැපයීම

සේවා සපයන ලද හෝ ඉටු කරන ලද ගිණුම්කරණ කාලසීමාවේ සපයනු ලබන සේවාවන්ගෙන් ලද ආදායම් හඳුනා ගැනේ.

වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ. මීට ප්‍රධාන වශයෙන් ආදායම් කළමනාකරණය කිරීම, ලියාපදිංචි ගාස්තු, ගස් සම්බන්ධ ටෙන්ඩර්වලින් ලද ආදායම් හා කල්බදු කුලී ආදායම් අයත්වේ.

5.1.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සිදු වන සියලුම වියදම් වසරේ ලාභය ගණනය කිරීමේදී ආදායමට හර කර ඇත.

අළුත්වැඩියා කිරීම් සහ අළුත් කිරීම් සඳහා වන වියදම්, වියදම් දරන වසරේදී ලාභ හා අලාභ ගිණුමට හර කරනු ලැබේ.

5.1.3 මූල්‍ය වියදම්

අපේක්ෂිත ලෙස භාවිත කිරීමට හෝ අලෙවි කිරීමට හෝ සූදානම් කරන තෙක් සැලකිය යුතු කාලසීමාවක් අත්‍යවශ්‍යයෙන්ම වැය වන යම් වත්කමක් අත්පත්කරගැනීමට, ඉදි කිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම දායක වන ණයට ගැනීමේ පිරිවැය, අදාල වත්කම්හි පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කෙරේ. අනෙකුත් සියලුම ණයගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුල වියදම් සේ සැලකේ. සංස්ථාවේ මූල්‍ය වියදම් අයිරාව මත පොලිය, මුදල් මත කොමිස් ගාස්තු, ණය පොලී (බැංකු හා වෙනත්) හා තැරැව්කරුවන්ගේ පොලී යනාදියෙන් සමන්විත වේ.

6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසුකාලීන ගණනය කිරීම්

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39හි විෂය පථය යටතේ පවතින මූල්‍ය වත්කම්:ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයකට හඳුනාගනු ලබන , ණය හා ලැබිය යුතු, කල්පිරීමට තබා ඇති ආයෝජන සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර මූලික හඳුනාගැනීමේදී යෝග්‍ය පරිදි අදාළ මූල්‍ය වත්කම වර්ගීකරණය කිරීම පිළිබඳව නිර්ණය කරයි.
සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ඊට අතිරේකව, ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට නොවන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම ගණුදෙණු පිරිවැයට අදාලව හඳුනාගැනේ. සංස්ථාවේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ස්ථාවර තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු හා අනෙකුත් තැන්පතු ඇතුළත් වේ. ඉහත මූල්‍ය වත්කම් පහත සඳහන් ජංගම වත්කම් යටතේ පෙන්නුම් කරයි.

6.1.2 පසුකාලීන ගණනය කිරීම්

පසුකාලීනව මූල්‍ය වත්කම් ගණනය කිරීම පහත සඳහන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී..

6.1.2.1 ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් තුළ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූලික වශයෙන් හඳුනාගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. අලෙවි කිරීමේ හෝ නුදුරු කාලයකදී නැවත මිලදීගැනීමේ අරමුණින් මූල්‍ය වත්කම් අත්පත්කරගන්නේ නම්, එකී වත්කම් අලෙවිය සඳහා තබාගන්නා ලද වත්කම් සේ වර්ගීකරණය කෙරේ. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට ලද කිසිදු මූල්‍ය වත්කමක් නොවීය.

6.1.2.2 ණය හා ලැබිය යුතු

ණය හා ලැබිය යුතු යනු සක්‍රීය වෙළඳපොලක් තුල සඳහන් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කමිය. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, පසුකාලීනව එවැනි මූල්‍ය වත්කම්, හායනය කිරීම් අඩු කර ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ. යම් වට්ටමක් හෝ අත්පත්කරගැනීමක් මත රක්ෂණ වාරිකයක් හා EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කෙරේ. මෙම EIR ක්‍රමක්ෂය කිරීම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුළ ඇතුළත් කෙරේ. හායනය මගින් හටගන්නා පාඩු මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය පිරිවැය තුළ හඳුනාගැනේ.

6.1.2.3 කල් පිරීමට තබා ඇති ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හා ස්ථාවර කල්පිරීම් කල් පිරෙන තෙක් රඳවාගැනීමේ සද්භාවය සහ හැකියාව සංස්ථාව සතු වන විට, එවැනි වත්කම් කල් පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, කල් පිරීමට තබා ඇති ආයෝජන, භායනය අඩු කර, ඵලදායී පොලී ක්‍රමවේදය අනුගමනය කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. අත්පත්කරගැනීමක් මත යම් වට්ටමක් හෝ රක්ෂණ වාරිකයක් සහ EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුළ ඇතුළත් කෙරේ. භායනයෙන් ජනනය වන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගැනේ. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල් පිරීමට තබා ඇති කිසිදු ආයෝජනයක් නොමැත.

6.1.2.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යන්නට ස්කන්ධ හා ණය ඇපකර යනාදිය ඇතුළත් වේ. ස්කන්ධ ආයෝජන විකිණීමට ඇති සේ වර්ගීකරණය කරනුයේ, අලෙවිය සඳහා ඇති හෝ ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකම සඳහා යනුවෙන් වර්ගීකරණය කර නොමැති හෙයිනි. මෙම කාණ්ඩයේ ණය ඇපකර යනු අවිනිශ්චිත කාලසීමාවක් සඳහා තබා ගැනීමට අපේක්ෂා කරන, ද්‍රවශීලතා අවශ්‍යතාවලට සහ වෙළඳපොල තත්ත්වයන්හි වෙනස්කම්වලට ප්‍රතිචාරී ලෙස අලෙවි කළ හැකි ඇපකර වේ.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව විකිණීමට ඇති කිසිදු මූල්‍ය ආයෝජනයක් නොමැත.

6.1.2.5 හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් මූල්‍ය වත්කමක් (හෝ අදාල වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ ඒ හා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගැනීමෙන් තොරව බැහැර කරනුයේ,

i). එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වූ විට;
ii). සංස්ථාව මගින් එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරාදුන් විට හා ‘pass-through’ ක්‍රමය යටතේ යම් තෙවන පාර්ශ්වයක් වෙත කිසිදු ආකාරයක ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහ ගෙවීමට යම් වගකීමක් භාර ගත් විට; සහ එමෙන්ම

(අ) සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දී ඇති විට; හෝ
(ආ) සංස්ථාව විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පවරා දී හෝ රඳවා ගෙන නොමැති නමුත්, වත්කමේ පාලනය පවරා දී ඇති විට.

6.1.2.6 මූල්‍ය වත්කම් භායනය වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් භායනය වී ඇති බවට යම් වාස්තවික සාක්ෂියක් පවතීද යන්න සංස්ථාව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම අගයනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුව ඇති යම් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙස භායනයක් සිදු ව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් හා සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකි එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත එම පාඩු සිදු කරන ලද සිදුවීම මගින් බලපෑමක් සිදු කර ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් එකී මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩය භායනය වී ඇතැයි සැලකිය යුතුය.

යම් ණයගැතියන් හෝ ණයගැතියන් කාණ්ඩයකට සුවිශේෂී මූල්‍ය දුෂ්කරතාවකට මුහුණ දෙමින් සිටින බව, පොලී හෝ ප්‍රධාන ගෙවීම් වංචා කිරීම හෝ පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට පත්වන බව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානය කිරීමකට සූදානම් වන බව සහ වංචාවන් සමඟ සහසම්බන්ධ වන ගෙවුම් හිඟ හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුල ගණනය කළ හැකි අඩුවීමක් ඇති බවට

නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් පෙන්නුම් කරන විටෙක භායනය වීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. දැනට සංස්ථාව විසින් ලැබිය යුතු වෙළඳ සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඇත.

6.1.2.7 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම්

සංස්ථාව විසින් ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, පළමුව තනි තනි වශයෙන් වැදගත් හෝ එසේ තනි තනි වශයෙන් සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් භායනය වීමක් ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න අගයනු ලබයි. සුවිශේෂී වන හෝ නොවන යම් තනි තනි වශයෙන් අගයන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් භායනය වීමක් පිළිබඳ කිසිදු වාස්තවික සාක්ෂියක් නොමැති බවට සංස්ථාව නිර්ණය කරන්නේ නම්, ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුල එම වත්කම ඇතුළත් කර, භායනය වීම සම්බන්ධයෙන් සාමූහික ලෙස ඇගයේ. භායනය වීම සම්බන්ධයෙන් තනි තනි වශයෙන් අගයන ලද සහ භායනය වීමක් හඳුනාගත් හෝ එසේ අඛණ්ඩව සිදු වන බව හඳුනාගත් වත්කම් සාමූහික භායන ඇගයුමක් තුළ ඇතුළත් නොකෙරේ.

යම් භායන පාඩුවක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, වත්කමේ ඉදිරියට ගෙන යන ශේෂය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (දැනට සිදුව නොමැති අනාගතයේ අපේක්ෂා කරන ණය පාඩු හැර) වෙනස ලෙස එම පාඩුවේ ප්‍රමාණය ගණනය කෙරේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම සඳහා එම මූල්‍ය වත්කමේ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් ලබා දෙයි.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම හා ගණනය කිරීම

ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39හි විෂයපථය තුළ පවතින මූල්‍ය වගකීම් : ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වගකීම් හෝ ණය හා ණයගැනීම් හෝ යෝග්‍ය පරිදි ඵලදායී සීමාවක් තුල සීමාසහිත මූල්‍ය උපකරණ ලෙස හඳුනාගෙන ඇති ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කෙරේ. සංස්ථාව විසින් මූලික හඳුනාගැනීම්වලදී සිය වගකීම් වර්ගීකරණය පිළිබඳව තීරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබුවද, ණය හා ණයගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය ඔස්සේ ඉදිරියට ගෙන යනු ලබයි. මීට සෘජුවම අදාල වන ගණුදෙණු පිරිවැය ඇතුළත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් තුල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරා ඇතුළත් වේ.

පසුකාලීන ගණනය කිරීම්

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම
යම් වගකීමක් යටතේ පවතින මූල්‍ය වගකීමක් ඉටු කළ විට හෝ අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට එම වගකීම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

6.1.2.6 මූල්‍ය වත්කම් භායනය වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් භායනය වී ඇති බවට යම් වාස්තවික සාක්ෂියක් පවතීද යන්න සංස්ථාව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම අගයනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුව ඇති යම් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙස භායනයක් සිදු ව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් හා සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකි එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත එම පාඩු සිදු කරන ලද සිදුවීම මගින් බලපෑමක් සිදු කර ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් එකී මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩය භායනය වී ඇතැයි සැලකිය යුතුය.
යම් ණයගැතියන් හෝ ණයගැතියන් කාණ්ඩයකට සුවිශේෂී මූල්‍ය දුෂ්කරතාවකට මුහුණ දෙමින් සිටින බව, පොලී හෝ ප්‍රධාන ගෙවීම් වංචා කිරීම හෝ පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට පත්වන බව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානය කිරීමකට සූදානම් වන බව සහ වංචාවන් සමඟ සහසම්බන්ධ වන ගෙවුම් හිඟ හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුල ගණනය කළ හැකි අඩුවීමක් ඇති බවට

නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් පෙන්නුම් කරන විටෙක හායනය වීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. දැනට සංස්ථාව විසින් ලැබිය යුතු වෙළඳ සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඇත.

6.1.2.7 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම්

සංස්ථාව විසින් ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, පළමුව තනි තනි වශයෙන් වැදගත් හෝ එසේ තනි තනි වශයෙන් සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් හායනය වීමක් ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න අගයනු ලබයි. සුවිශේෂී වන හෝ නොවන යම් තනි තනි වශයෙන් අගයන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් හායනය වීමක් පිළිබඳ කිසිදු වාස්තවික සාක්ෂියක් නොමැති බවට සංස්ථාව නිර්ණය කරන්නේ නම්, ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුල එම වත්කම ඇතුළත් කර, හායනය වීම සම්බන්ධයෙන් සාමූහික ලෙස ඇගයේ. හායනය වීම සම්බන්ධයෙන් තනි තනි වශයෙන් අගයන ලද සහ හායනය වීමක් හඳුනාගත් හෝ එසේ අඛණ්ඩව සිදු වන බව හඳුනාගත් වත්කම් සාමූහික හායන ඇගයුමක් තුළ ඇතුළත් නොකෙරේ.

යම් හායන පාඩුවක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, වත්කමේ ඉදිරියට ගෙන යන ශේෂය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (දැනට සිදුව නොමැති අනාගතයේ අපේක්ෂා කරන ණය පාඩු හැර) වෙනස ලෙස එම පාඩුවේ ප්‍රමාණය ගණනය කෙරේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම සඳහා එම මූල්‍ය වත්කමේ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් ලබා දෙයි.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම හා ගණනය කිරීම

ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39හි විෂයපථය තුළ පවතින මූල්‍ය වගකීම් : ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වගකීම් හෝ ණය හා ණයගැනීම් හෝ යෝග්‍ය පරිදි ඵලදායී සීමාවක් තුල සීමාසහිත මූල්‍ය උපකරණ ලෙස හඳුනාගෙන ඇති ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කෙරේ. සංස්ථාව විසින් මූලික හඳුනාගැනීම්වලදී සිය වගකීම් වර්ගීකරණය පිළිබඳව තීරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබුවද, ණය හා ණයගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය ඔස්සේ ඉදිරියට ගෙන යනු ලබයි. මීට සෘජුවම අදාල වන ගණුදෙණු පිරිවැය ඇතුළත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් තුල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරා ඇතුළත් වේ.

පසුකාලීන ගණනය කිරීම්

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් වගකීමක් යටතේ පවතින මූල්‍ය වගකීමක් ඉටු කළ විට හෝ අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට එම වගකීම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

7. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පළමු වරට අදාළ කරගැනීම

2012 ජනවාරි මස 01 දින සිට බලාත්මක වන, ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතිකරණ ප්‍රමිත හා ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පළමු වරට සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ඇතුලු සහ ඒ දක්වා කාලසීමාවන් සඳහා සංස්ථාව විසින් පූර්වයෙන් පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

08 දේපළ, පිරියත හා උපකරණ

ප්‍රධාන කාර්යාලය	සිත්නක්කර ඉඩම්	ගොඩනැඟිලි	උපකරණ	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	පරිගණක	මෝටර් වාහන					එකතුව
පිරිවැය හෝ තක්සේරුකිරීම්											
2024 ජනවාරි 1 දිනට	4,031,845	4,959,427	14,277,369	9,510,126	6,720,151	67,511,974					107,010,892
එකතුකිරීම්		202,420	491,608	255,180	549,650						1,498,858
බැහැරකිරීම්	-	-	-	-	-	-					-
මාරුකිරීම්	-	-	-	-	-	-					-
2024 දෙසැම්බර් 31 දිනට	4,031,845	5,161,847	14,768,977	9,765,306	7,269,801	67,511,974					108,509,750
සමුච්චිත ක්ෂයවීම්											
2024 ජනවාරි 1 දිනට											
වසරෙහි ක්ෂයවීම් සඳහා ගාස්තු	-	4,959,384	11,343,300	4,763,804	5,149,778	66,217,469					92,433,735
පෙර වර්ෂයේ ගැළපීම්	-	4,959	581,053	892,850	599,619	-					2,078,481
බැහැරකිරීම්	-	-	-	5,201	-	-					5,201
2024 දෙසැම්බර් 31 දිනට		4,964,342	11,924,352	5,661,856	5,749,397	66,217,469					94,517,417
ශුද්ධ පොත් අගය											
2024 දෙසැම්බර් 31 දිනට	4,031,845	197,505	2,844,625	4,103,451	1,520,404	1,294,505					13,992,334
වතුයායන්											
පිරිවැය හෝ තක්සේරුකිරීම්											
2024 ජනවාරි 1 දිනට	645,345,972	201,566,842	28,921,275	8,291,133	1,176,722	84,200,574	175,229,683	6,672,973	927,347,638		2,078,752,811
එකතුකිරීම්	-	5,026,452	- 2,642,568	- 290,230	- 291,340	- 590,255	2,212,880	-	99,990,568		111,044,293
පෙර වර්ෂයේ ගැළපීම්	-	-	- -	- -	- -	- -	(3,479,963)	-	-		(3,479,963)
මාරුකිරීම්	-	-	- -	- -	- -	- -	-	-	(4,963,475)		(4,963,475)
බැහැරකිරීම්	-	(770,700)	- -	- -	- -	- -	(1,881,600)	-	-		(2,652,300)
2024 දෙසැම්බර් 31 දිනට	645,345,972	205,822,594	- 31,563,843	- 8,581,363	- 1,468,062	- 84,790,829	172,081,000	6,672,973	1,022,374,731		2,178,701,366
සමුච්චිත ක්ෂයවීම්											
2024 ජනවාරි 1 දිනට	-	124,882,097	20,599,351	990,455	997,348	73,406,988	116,240,882	6,672,972	386,541,844		730,333,213
වසරෙහි ක්ෂයවීම් සඳහා ගාස්තු	-	5,013,828	- 1,484,042	- 525,741	- 113,842	- 745,982	7,089,937	-	4,289,928		19,263,300
පෙර වර්ෂයේ ගැළපීම්	-	(20,062)	- (2,410)	- -	- -	- -	(319,625)	-	(461,039)		(803,136)
බැහැරකිරීම්	-	-	- -	- -	- -	- -	-	-	-		-
2024 දෙසැම්බර් 31 දිනට	-	129,875,863	22,080,982	1,516,196	1,111,190	74,152,970	123,011,193	6,672,972	390,370,733		748,793,377
ශුද්ධ පොත් අගය											
2024 දෙසැම්බර් 31 දිනට	645,345,972	75,946,730	9,482,861	- 7,065,167	356,872	10,637,859	49,069,807	1	632,003,998		1,429,907,990
ශුද්ධ පොත් අගය ප්‍රධාන කාර්යාලය සහ වතුයාය 2024 දෙසැම්බර් 31 දිනට (එකතුව)	649,377,816	76,144,235	- 12,327,486	- 11,168,618	- 1,877,276	- 11,932,364	49,069,807	1	632,003,998		1,443,900,323

ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

8.1 ධර ජීව විද්‍යාත්මක වත්කම්

ධර ජීව විද්‍යාත්මක වත්කම් රැගෙන යනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුවය.

ධර ජීව විද්‍යාත්මක වත්කම්	තේ		වෙනත් බෝ ග වගාව	පොල්	ගම්මිරිස්	රබර්	කෝපි	වෙනත්	එකතුව
	පරිණත වගාව	අපරිණත වගාව	අපරිණත වගාව (8.2)						
පිරිවැය හෝ තක්සේරුව									
2024 ජනවාරි 1 වන දිනට	**508,654,524**	**357,059,545**	**16,527,314**	**3,870,374**	**3,709,621**	**15,270,484**	**1,565,492**	**20,690,284**	**927,347,638**
එකතු කිරීම්	6,927,929	77,064,731	15,935,431		-	-		62,476	**99,990,568**
පෙර වසරේ ගැලපීම්/ නිවැරදි කිරීම		(4,979,598)							-
පැවරුම් නිවැරදි කිරීම				-	-	-	-	16,123	**(4,963,475)**
බැහැර කිරීම්	-	-		-	-	-	-	-	-
2024 දෙසැම්බර් 31 වන දිනට	**515,582,454**	**429,144,679**	**32,462,745**	**3,870,374**	**3,709,621**	**15,270,484**	**1,565,492**	**20,768,884**	**1,022,374,731**
සමුච්චිත ක්ෂය	**තේ**		**වෙනත් බෝ ග වගාව**	**පොල්**	**ගම්මිරිස්**	**රබර්**	**කෝපි**	**වෙනත්**	**එකතුව**
	පරිණත වගාව	අපරිණත වගාව	අපරිණත වගාව (8.2)						
2024 ජනවාරි 1 වන දිනට	**370,322,825**	-	-	**3,358,935**	**2,647,942**	**6,463,241**	**1,442,998**	**2,305,901**	**386,541,844**
වසර සඳහා ක්ෂය ගාස්තුව	2,412,423	-	-	56,447	122,103	1,138,500	7,703	552,752	**4,289,928**
පෙර වසරේ ගැලපීම්	-	-	-	(461,039)	-	-	-	-	**(461,039)**
පැවරුම් නිවැරදි කිරීම්	-	-	-	-	-	-	-	-	-
බැහැර කිරීම්	-	-	-	-	-	-	-	-	-
2024 දෙසැම්බර් 31 වන දිනට	**372,735,248**	-	-	**2,954,344**	**2,770,046**	**7,601,742**	**1,450,701**	**2,858,654**	**390,370,733**
ශුද්ධ පොත් වටිනාකම්									
2024 දෙසැම්බර් 31 වන දිනට	**142,847,206**	**429,144,679**	**32,462,745**	**916,031**	**939,575**	**7,668,742**	**114,791**	**17,910,230**	**632,003,998**
2024 දෙසැම්බර් 31 වන දිනට ශුද්ධ පොත් වටිනාකම්									**632,003,998**

8.2 **8.2 අපරිණත වගා - වෙනත් බෝග**

ධාර ජීව විද්‍යාත්මක වත්කම්	කුරුඳු	කරාබුනැටි	පොල්	කෝපි	පුවක්	එකතුව
පිරිවැය හෝ තක්සේරුව						
2024 ජනවාරි 1 වන දිනට	5,001,336		11,525,977			**16,527,314**
එකතු කිරීම්	5,542,577	69,863	4,671,018	4,906,215	745,758	**15,935,431**
2024 දෙසැම්බර් 31 වන දිනට	**10,543,913**	**69,863**	**16,196,995**	**4,906,215**		**32,462,745**

9 ජීවවිද්‍යාත්මක වත්කම් -පාරිභෝජ්‍ය

ජීවවිද්‍යාත්මක වත්කම් -පාරිභෝජ්‍ය	2024.12.31 දිනට	2023.12.31 දිනට
	රු.	රු.
ජීවවිද්‍යාත්මක වත්කම්	**3,361,498,115**	**3,360,565,296**
වසර තුළ එකතුකිරීම්	1,471,429	932,819
මුළු පාරිභෝජ්‍ය ජීවවිද්‍යාත්මක වත්කම්	**3,362,969,544**	**3,361,498,115**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි වතුයායන්හි පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීම වර්තමානයේදී සිදුවෙමින් පවතී. 2023 වර්ෂයේදී, සංස්ථාව විසින් වැවිලි සමාගම් විසින් ඉදිරිපත් කරන ලද ගස් තොගවල නිරවද්‍යතාවය තක්සේරු කිරීමට පෙර ඒවා පරීක්ෂා කිරීමේ නිරතවන ලදි. ගස් තොගයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු සුදුසු සහ පිළිගත හැකි ක්‍රමවේදයක් භාවිතා කරමින් පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

පහත වගුවේ දැක්වෙන්නේ 2023 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුයායන්හි හි තිබෙන්නාවූ ගස් සංඛ්‍යාවයි. 2018-2023 සඳහා අනුමත වන කළමනාකරණ සැලසුම් අනුව කපා ගත හැකි ගස් සංඛ්‍යාව දෙවන තීරුවේ වෙන වෙනම පෙන්වා ඇත.

වතුයායෙහි නම	2023/12/31 දිනට භෞතික සත්‍යාපනයට අනුව (වන කළමනාකරණ සැලැස්මේ ඇති ගස් හැර) මුළු ගස් සංඛ්‍යාව	අනුමත වන කළමනාකරණ සැලැස්මට අනුව 2023.12.31 දිනට කපාගත හැකි සෙසු ගස් සංඛ්‍යාව	2023.12.31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි වතුයායන්හි පවතින මුළු ගස් සංඛ්‍යාව
අලකොළ රාජ්‍ය වතුයාය	3,042	209	3,251
කොටගහ රාජ්‍ය වතුයාය	4,070	1,093	5,163
ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය	10,338	-	10,338
ගෝමර රාජ්‍ය වතුයාය	7,232	303	7,535
හාගල රාජ්‍ය වතුයාය	7,517	-	7,517
හෙයාපාර්ක් රාජ්‍ය වතුයාය	3,182	-	3,182
හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය	5,691	-	5,691
කැලැබොක්ක රාජ්‍ය වතුයාය	7,544	7,177	14,721
මිඩිලන්ඩස් රාජ්‍ය වතුයාය	10,471	782	11,253
නිකොළොය රාජ්‍ය වතුයාය	2,320	-	2,320
ඔපල්ගල රාජ්‍ය වතුයාය	10,523	964	11,487
රංගල රාජ්‍ය වතුයාය	5,544	45	5,589
වෛතලාව රාජ්‍ය වතුයාය	6,959	109	7,068
විහාරගල රාජ්‍ය වතුයාය	791	-	791
වූඩ්සයිඩ් රාජ්‍ය වතුයාය	3,299	4,435	7,734
වලහන්දුව රාජ්‍ය වතුයාය	1,051	-	1,051
මුළු ගස් සංඛ්‍යාව	**89,574**	**15,117**	**104,691**

		2024.12.31 දිනට	2023.12.31 දිනට
10	**ආයෝජන දේපළ**	**රු.**	**රු.**
	රජයේ ඉඩම් දායකත්වය	1,600,601,926	1,600,601,926
	ප්‍රාග්ධන අගය වැඩිකිරීම සඳහා ඉඩම්	10,918,715	10,918,715
		1,611,520,641	**1,611,520,641**

10.1 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) සතු ඉඩම් සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් (RPCs) වෙත පවරා දුන් ඉඩම්.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) සහ අනෙකුත් රාජ්‍ය ආයතනය විසින් ගැසට් නිවේදන මගින් ඉඩම් දෙසිය හැත්තෑ හතරක (274) අයිතිය ශ්‍රී ලංකා

	ගැසට් අංකය	ගැසට් කරන ලද දිනය	පවරනු ලැබුයේ	ශ්‍රී.ලං.රා.වැ.ස ට පවරන ලද ඉඩම් සංඛ්‍යාව	ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබාදුන් ඉඩම්	ශ්‍රී.ලං.රා.වැ.ස සතු ඉඩම්
1	150/12	24.07.1981	ඉ.ප්‍ර.කො	38	38	-
2	569/14	02.08.1989	ඉ.ප්‍ර.කො	3	3	-
3	571/14	18.08.1989	ඉ.ප්‍ර.කො	1	1	-
4	157/13	03.04.1975	වෙනත් රාජ්‍ය ආයතන.	5	5	-
5	181/12	27.02.1982	ඉ.ප්‍ර.කො	80	54	26
6	195/6	31.05.1982	ඉ.ප්‍ර.කො	14	9	5
7	206/15	20.08.1982	ඉ.ප්‍ර.කො	1	-	1
8	230/12	02.02.1983	ඉ.ප්‍ර.කො	1	1	-
9	439/18	06.02.1987	වෙනත් රාජ්‍ය ආයතන.	1	-	1
10	937/2	19.08.1996	ඉ.ප්‍ර.කො	7	7	-
11	815/10	21.04.1994	ඉ.ප්‍ර.කො	123	122	1
මුළු ඉඩම්				**274**	**240**	**34**

10.2 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු අනෙකුත් ඉඩම් සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත පවරා දුන් ඉඩම්.

ශ්‍රී.ලං.රා.වැ.ස විසින් ඉඩම් තිහක් (30) මිලදී ගෙන ඇති අතර ගැසට් නිවේදන නොමැතිව රජයේ ආයතන වෙතින් වතු එකොළහක් (11) ලැබී ඇත. ඉඩම් හතළිස්

	ඉඩම් මූලාශ්‍රය	ලද වසර	ඉඩම් සංඛ්‍යාව	ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දුන් ඉඩම්	ශ්‍රී.ලං.රා.වැ.ස සතු ඉඩම්	වෙනත්
1	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්	1960	4	4	-	-
2	ඉඩම් කොමසාරිස්	1968	1	-	-	මහවැලි ව්‍යාපෘතිය වෙත භාරදෙන ලදි.
3	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	1977	6	6	-	-
4	ශ්‍රී.ලං.රා.වැ.ස විසින් මිලදී ගත්	1972, 1973, 1974, 1975	30	30	-	-
මුළු ඉඩම්			**41**	**40**	**-**	

ඒ අනුව, 1992 වසරේදී ඉඩම් දෙසිය අසූවක් (280) වසර පනස් තුනකට (53) බදු පදනම් මත ප්‍රාදේශීය වැවිලි සමාගම් විස්සක් (20) වෙත ලබා දී ඇත. බදු කාලය 2045 දී අවසන් වේ.

බදු ගිවිසුම්වලට අනුව, සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම, උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම සහ ආගරපතන වැවිලි සමාගම යන සමාගම් විසින් ශ්‍රී.ලං.රා.වැ.ස වෙත බදු කුලී ගෙවීම් සිදුකරනු ලබන අතර අනෙකුත් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් ලබන බදු කුලී මහා භාණ්ඩාගාරය වෙත ගෙවනු ලැබේ.

ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 ට අනුව, ආයෝජන දේපලක් මුල් අවස්ථාවේදී (මාරු කිරීමේ අවස්ථාවේ) එහි පිරිවැයෙන් මනිනු ලබන අතර පසුව සාධාරණ වටිනාකම් ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය භාවිතා කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වෙත පරිවර්ථනය වන අවස්ථාවේ මාරුකිරීම් සිදුකළ දිනයේ අධීක්ෂණ අගයන් ලබා ගැනීමට කළමනාකාරීත්වයට නොහැකි වූ අතර ඒ වෙනුවට ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දෙන අවස්ථාවේ වටිනාකම් වතු වල සාධාරණ වටිනාකම් ලෙස සැලකේ. එබැවින් 1992 වන විට ඉඩම් වටිනාකම් ප්‍රාදේශීය වැවිලි සමාගම්හි ශේෂ පත්‍රවලින් සමානුපාතිකව උපුටා ගන්නා ලදී. කළමනාකාරීත්වයේ අදහස වන්නේ මෙම ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දුන් දිනට එම ඉඩම්වල පිරිවැය සාධාරණ ලෙස පිළිබිඹු කරන බවත්, එම අගයන් ගිණුම් පොත්වල ඉදිරියට ගෙන යන බවත්ය.

2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ඉඩම් තක්සේරු කිරීම සඳහා මූලික පියවර ගෙන ඇති අතර, අප වෙත අයත් ඉඩම් තක්සේරු කරන ලෙසත් තක්සේරු කිරීම සඳහා වන මුළු පිරිවැය දන්වන ලෙසත් දන්වමින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත.පිළිතුරු වශයෙන් ඔවුන් අපගේ ඉඩම් තක්සේරු කිරීම සඳහා ඔවුන්ගේ ගාස්තුව/අයකිරීම් ගණනය කිරීමේ සූත්‍රය සම්බන්ධයෙන් අප දැනුවත් කර ඇත. මෙම ඉඩම් තක්සේරු කිරීම සඳහා ලබා දී ඇති සූත්‍රයට අනුව මෙම තක්සේරු කිරීම් සම්පූර්ණ කිරීමට විශාල මුදලක් අවශ්‍ය වේ යැයි අපි අපේක්ෂා කරමු. අප මුහුණ දී සිටින වත්මන් මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙවැනි විශාල වියදමක් දැරීමට මේ මොහොතේ හැකියාවක් නොමැත. කෙසේවුවද, මෙම ඉඩම් තක්සේරු කිරීමේ මූලික පියවර ලෙස, නියමු ව්‍යාපෘතියක් වශයෙන් එක් වතුයායක තක්සේරු කටයුතු සිදුකරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය අප වෙත උපදෙස් දී ඇති අතර ඉදිරි වසරවලදී සියලුම ඉඩම් තක්සේරු කිරීම ආරම්භ කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව			
	මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්			
11	**තොග**	**2024.12.31 දිනට**		**2023.12.31 දිනට**
		රු.		රු.
	නිමි නිෂ්පාදන	70,779,796		51,878,540
	භාවිත කළ හැකි තොග	43,652,895		34,343,200
		114,432,691		**86,221,740**
	නිමි නිෂ්පාදන තොගයේ අගය ගණනය කරනු ලැබුවේ පිරිවැය සහ දළ තථ්‍ය අගය (NRV) සලකා බැලීමෙන් පසුවය			
12	**වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ**	**2024.12.31 දිනට**		**2023.12.31 දිනට**
		රු.		රු.
	වෙළඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලය(අ)	47,273,044		43,124,085
	අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ ණයගැතියන් සඳහා වෙන්කිරීම්	(19,879,268)		(19,879,268)
	වෙළඳ ණයගැතියන් -සියලු වතුයායන් (ආ)	244,388,992		251,813,385
	අඩුවීම් - : වතු ණයගැතියන් සඳහා වෙන්කිරීම්	(49,128,420)		(59,652,474)
	වෙනත් ලැබීම්-ප්‍රධාන කාර්යාලය	89,985,927		61,465,342
	අඩුකිරීම් : අඩමාණ ණය-බදු ඉඩම් කුලී සඳහා ප්‍රතිපාදන	(15,780,848)		(15,780,848)
	වෙනත් ලැබීම්-සියලු වතුයායන්	51,226,071		48,331,554
	පාරිතෝෂික අත්තිටුවීම් (2012 ශේෂ)	85,257,147		85,257,147
	අඩුවීම් : පාරිතෝෂික අත්තිටුවීම් සඳහා වෙන්කිරීම්	(85,257,147)		(85,257,147)
		348,085,497		**309,421,777**
අ).	**වෙළඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලයට පහත අංශ ඇතුළත් වේ**	**2024.12.31 දිනට**		**2023.12.31 දිනට**
	B.C.C. සමාගම	15,404,568		15,404,568
	අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ ණයගැතියන්ගේ විශේෂ අපහායනයන්	(15,404,568)		(15,404,568)
	ඇල්කඩුව වතුයාය	1,916,092		1,916,092
	වුඩ්සයිඩ් වතුයාය	992,125		992,125
	අඩුවීම්: අඩමාණ ණය -වුඩ්සයිඩ් සඳහා ප්‍රතිපාදන	(992,125)		(992,125)
	ඩක්වාරි	2,500,000		2,500,000
	අඩුවීම්: අඩමාණ ණය -ඩක්වාරි සඳහා ප්‍රතිපාදන	(2,500,000)		(2,500,000)
	වෙළඳ ණයගැතියන්	880,434		880,434
	අඩුවීම්: අඩමාණ ණය -වෙළඳ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන	(880,434)		(880,434)
	ජී.ජී.මහේන්ද්‍රරත්න	102,140		102,140
	අඩුවීම්: අඩමාණ ණය - ජී.ජී.මහේන්ද්‍රරත්න සඳහා ප්‍රතිපාදන	(102,140)		(102,140)
	ගිණුම් ලැබීම් - තේ දළු මිලදී ගන්නන්	25,301,927		21,031,488
	සුළු හා වෙනත් ණයගැතියන්	175,757		297,237
		27,393,776		**23,244,817**
ආ).	**වෙළඳ ණයගැතියන් - වතුයායන්ට පහත අංශ ඇතුළත් වේ.**			
	විවිධ ණයගැතියන්	31,921,586		38,390,538
	පාරිභෝගික ණයගැතියන්	41,071,407		41,071,407
	සුළු ආදායම් ණයගැතියන්	2,588,530		2,588,530
	ජ.න.ව.සේ.ම	1,668,269		1,668,269
	නිෂ්පාදනය සඳහා ණයගැතියන්	726,644		726,644
	අඩුවීම්: පැල තවාන් සම්බන්ධයෙන් හඳුනානොගත් ශේෂයන් සඳහා ප්‍රතිපාදන	-		(10,524,054)
	අඩුවීම් : වතු ණයගැතියන්ගේ විශේෂ අපහායනයන්	(47,537,070)		(47,537,070)
	අඩුවීම් : බොල් ණය සඳහා ප්‍රතිපාදන	(1,591,349)		(1,591,349)
	අන්තර් වැවිලි ජංගම ගිණුම්	-		-
	වෙනත් ණයගැතියන් - ජංගම ගිණුම් ශේෂයන්	166,412,556		167,367,998
		195,260,572		**192,160,912**
	*** 2024/12/31 දිනට තවාන් තොග ඉහත සටහන අංක 11 හි පරිභෝජන තොග යටතේ දක්වා ඇත.**			

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

13	**මුදල් හා ඒ හා සමාන දෑ**				**2024.12.31 දිනට**		**2023.12.31 දිනට**
(අ).	**ධන ශේෂයන් :**				**රු.**		**රු.**
	අතැති හා බැංකුවේ ඇති මුදල්						
	- ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය වැවිලි සමාගම්				54,669,912		3,125,608
	- සියලු වතුයායන්				8,152,152		1,963,235
					62,822,063		**5,088,843**
(ආ).	**සෘණ ශේෂයන්**						
	- මහජන බැංකු ජංගම ගිණුම්				**(2,452,494)**		**(135,391,076)**
	වසර අවසානයේදී මුදල් හා ඒ සමාන දෑ				**60,369,569**		**(130,302,233)**
(ඇ).	මහජන බැංකුවෙන් ලබාගත් රුපියල් මිලියන 130.0 ක ස්ථිර අධිභාර (POD) පහසුකම්, 2024/02/22 දින සිට වසර දැනට පවතින **ස්ථිර අයිරා පහසුකම් වසුහය (POD)**						
14	**දායක ප්‍රාග්ධනය**				**2024.12.31 දිනට**		**2023.12.31 දිනට**
					රු.		**රු.**
	රාජ්‍ය දායකත්වය(ප්‍රදාන)				3,698,291,381		3,519,802,947
	ඉඩම් සඳහා රාජ්‍ය දායකත්වය				2,616,589,903		2,616,589,903
					6,314,881,284		**6,136,392,850**
	සමස්ත රජයේ දායකත්වය සමන්විත වන්නේ රජයෙන් (භාණ්ඩාගාරයෙන්) හෝ අමාත්‍යාංශ හරහා ලැබෙන ප්‍රදාන සහ ගැසට් නිවේදන මඟින් රජය විසින්						
	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා ඇති/හිමිකර දී ඇති ඉඩම් වලිනි. සමාලෝචනයට ලක්වන වර්ෂය තුළදී, ගෙවීමට ඇති ව්‍යවස්ථාපිත හිඟ මුදල් වලට						
	එරෙහිව සෑම සතියකම නඩු විභාගයට එන නීතිමය නඩු සමථ කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට රුපියල් මිලියන 170.4ක් පොදු භාණ්ඩාගාරයෙන්						
	ලැබී ඇත.ඊට අමතරව, GCF නකල්ස් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය හරහා ද අපට ප්‍රදාන ලැබී ඇති අතර මෙම වර්ෂය තුළදී රුපියල්						
	මිලියන 8.09ක් ප්‍රාග්ධන වැඩ සඳහා අප විසින් භාවිත කර ඇත.						
15	සේවක ප්‍රතිලාභ වගකීම්		**ප්‍රධාන කාර්යාලය 2024**	**වතුයායන් 2024**	**2024.12.31 දිනට**		**2023.12.31 දිනට**
					රු.		**රු.**
	ආරම්භක ශේෂය		25,103,255	559,077,942	584,181,197		643,919,338
	පාරිතෝෂිකය සඳහා අඩු/(වැඩි) ප්‍රතිපාදන		4,542,560	183,576,324	188,118,884		2,665,080
	වර්ෂය සඳහා ප්‍රතිපාදන		1,425,485	37,502,035	38,927,520		32,279,972
	ගෙවිය යුතු පාරිතෝෂිකය වෙත මාරු කරන ලදි		(2,244,478)	(43,616,315)	(45,860,793)		2,665,080
	අනෙකුත් ගනුදෙනු/මාරු කිරීම්		926,841	(2,362,004)	(1,435,163)		(93,919,517)
					-		(766,675)
	සමස්ත සේවක ප්‍රතිලාභ වගකීම්		**29,753,663**	**734,177,982**	**763,931,645**		**584,181,197**
	වර්ෂය තුළදී කම්කරු වැටුප 35%කින් වැඩි කිරීම හේතුවෙන් ප්‍රධාන වශයෙන්ම රුපියල් මිලියන 183.57ක පාරිතෝෂිකය සඳහා ඌන ප්‍රතිපාදන (Gratuity under provision)						
	තත්ත්වයක් ඇති විය. සමාලෝචිත වර්ෂය තුළදී දෛනික කම්කරු වැටුප රුපියල් 1,000 සිට රුපියල් 1,350 දක්වා වැඩි කරන ලදී						
16	කල් දැමූ ආදායම						
	වර්ෂය තුළදී අපගේ වතුවල GCF (හරිත දේශගුණික අරමුදල) නකල්ස් ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන ලද අතර, ඒ සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග						
	අමාත්‍යාංශය මඟින් අරමුදල් සපයන ලදී. ලැබුණු සහ භාවිත කළ ප්‍රදානවල සාරාංශ විස්තර පහත දැක්වේ						
	ප්‍රමාද කළ ආදායම / ප්‍රාග්ධන ප්‍රදාන				2024.12.31 වන විට (රු.)		2023.12.31 වන විට (රු.)
	GCF ව්‍යාපෘති කටයුතු සඳහා ලැබුණු ප්‍රදාන/සහනාධාර				75,911,396		-
	අඩු කරන්න:	ආදායම් වියදම්			(18,663,630)		-
		ප්‍රාග්ධන වියදම්			(8,088,434)		-
	අවසන් ශේෂය - ප්‍රමාද කළ ආදායම				**49,159,332**		-

මූල්‍ය ප්‍රකාශන සටහන්

17 වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

		2024.12.31 වන විට		2023.12.31 වන විට
		(රු.)		(රු.)
ප්‍රධාන කාර්යාලය	(අ)	479,620,080		442,622,983
වතු	(ආ)	1,699,049,214		1,714,254,373
එකතුව		2,178,669,294		2,156,877,357

(අ) **ප්‍රධාන කාර්යාලය සඳහා වන වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**

පර්ත් වත්ත	6,610,411	6,610,411
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	97,709,342	97,709,342
නිෂ්පාදිත තේ තැරැව්කරුවන්ගෙන් ලැබුණු අත්තිකාරම්	49,946,484	48,316,765
දලු ගැනුම්කරුවන්ගෙන් ලැබුණු අත්තිකාරම්	393,201	1,449,988
ටෙන්ඩර් පාරිභෝගිකයන්ගෙන් ලැබුණු අත්තිකාරම් ගෙවීම්	5,158,992	1,139,492
කුලී අත්තිකාරම් - ඊ එ එම් මැලිබන් ටෙක්ස්ටයිල්ස් (පුද්.) සමාගම	34,525,000	-
කුලී අත්තිකාරම් - D R ලීෂර් (පුද්.) සමාගම	20,746,301	-
ආපසු ගෙවිය යුතු තැන්පතු -ඩී ආර් ලෙෂර් (පුද්.) සමාගම	4,400,000	-
සංස්ථා තේ පාරිභෝගිකයන් - වැඩිපුර ගෙවීම්	1,375	6,872
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
පොහොර සංස්ථාව	35,931,679	35,931,679
හලාවත වැව්ලි සමාගම	42,810,959	41,210,959
ණය - ලංකා ඛනිජ වැලි	25,000,000	25,000,000
හිඟ වියදම්	18,232,048	23,306,903
සේවක අර්ථසාධක අරමුදල (EPF) - ගෙවිය යුතු	24,628,938	22,926,897
සේවක විශේෂ විශ්‍රාම වැටුප් ක්‍රමය (ESPS) - ගෙවිය යුතු	12,043,028	11,692,077
ආයතනික විශ්‍රාම වැටුප් ක්‍රමය (CPPS) - ගෙවිය යුතු	21,959,468	18,135,315
සේවක භාරකාර අරමුදල (E.T.F) - ගෙවිය යුතු	168,768	293,615
ආපසු ගෙවිය යුතු තැන්පතු	28,571,363	41,402,978
ගෙවිය යුතු පාරිතෝෂික	4,911,149	3,253,946
ශ්‍රී ලංකා තේ මණ්ඩලය - පොහොර	-	6,666,672
ගෙවිය යුතු පොලිය - මහජන බැංකු ණය	905,717	20,054,428
වෙනත් ගෙවිය යුතු දෑ	16,256,830	8,805,616
එකතුව	479,620,080	442,622,983

(ආ) වතු සඳහා වන වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	2024.12.31 වන විට	2023.12.31 වන විට
	(රු.)	(රු.)
විවිධ ණය හිමියන්	7,887,384	6,838,664
නිවාඩු වැටුප් ප්‍රතිපාදන	-	993,725
නිවාඩු වැටුප්	20,181,207	20,773,747
ඇල්කඩුව වගාව	172,137	172,137
වෙනත් වගකීම්	85,149,589	102,183,652
වෘත්තීය සමිති	9,604,956	9,557,646
කාර්ය මණ්ඩල සහ සේවක ගෙවිය යුතු මුදල්	49,868,157	34,188,575
විගණන ගාස්තු සහ රක්ෂණ සඳහා ප්‍රතිපාදන	8,175,351	7,700,651
සේවක අර්ථසාධක අරමුදල ගෙවිය යුතුයි	671,061,907	666,314,285
සේවක විශේෂ විශ්‍රාම වැටුප් ක්‍රමය ගෙවිය යුතුයි	77,756,693	61,620,943
චන්දි ගෙවීමේ විශ්‍රාම වැටුප් ක්‍රමය ගෙවිය යුතුයි	24,954	24,954
සේවක භාරකාර අරමුදල ගෙවිය යුතුයි	47,368,717	49,438,814
පාරිතෝෂික ගෙවිය යුතුයි	583,316,046	625,998,758
සමුච්චිත වියදම්	14,313,389	13,920,970
පැමිණීමේ ප්‍රසාද දීමනා ප්‍රතිපාදන	117,583	1,009,067
සේවක අර්ථසාධක අරමුදල් අධිභාර ගෙවිය යුතුයි	85,854,420	78,378,572
සේවක භාරකාර අරමුදල් අධිභාර ගෙවිය යුතුයි	10,425,561	9,295,631
පාරිතෝෂික අධිභාර ගෙවිය යුතුයි	27,771,163	25,843,582
එකතුව	1,699,049,214	1,714,254,373

17 බැංකු ණය - (මහජන බැංකුව)

ණය අංකය : මහජන බැංකු ණය 0468001000001837	74,501,778	79,310,000
ණය අංකය : මහජන බැංකු ණය 0468001000001855	17,198,451	-
ණය අංකය : මහජන බැංකු ණය 0468001000001864	125,000,871	-
ණය අංකය : මහජන බැංකු ණය 0468001000001846	5,276,268	-
එකතුව	221,977,368	79,310,000

වසර තුළදී, නිරවුල් නොවූ ස්ථිර අයිරා (Overdraft) ශේෂය සහ ගෙවා නොනිබූ බැංකු ණය සහ ඒවාට අදාළව ගෙවා නොනිබූ වූ ගෙවීමේ පොලී ශේෂයන් , ඉහත සඳහන් පරිදි දීර්ඝ කාලීන ණය හතරක් බවට පරිවර්තනය කරන ලදී. ණය සහ අයිරාව (Overdraft) සඳහා වූ ගෙවීමේ කාලය වසර පහක් වන අතර, ගෙවා නොනිබූ පොලී කොටස සඳහා ගෙවීමේ කාලය වසර තුනක් වේ.
අපි මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය, භාණ්ඩාගාරයේ එකභත්වය සහ ඇප ලබාගෙන ඇත. මෙම ණය,
භාණ්ඩාගාර ඇපකරයට සහ අප සතු දෙමටගොඩ පිහිටි දේපළට එරෙහිව සුරක්ෂිත කර ඇත.

		2024.12.31 වන විට		2023.12.31 වන විට	
18	**ආදායම**	**(රු.)**		**(රු.)**	
	තේ	601,078,318		530,705,781	
	අමු දළු	377,713,655		462,446,492	
	සුළු බෝග	8,909,811		18,048,754	
	රබර්	3,340,226		1,414,816	
	මුළු ආදායම	**991,042,009**		**1,012,615,844**	

තේ අලෙවියෙන් ලැබෙන ආදායමට, කොළඹ තේ වෙන්දේසියේදී නිෂ්පාදික තේ (Made tea) විකිණීමෙන් ලැබෙන ආදායම, දේශීය අලෙවි (සංස්ථා තේ) සහ ටෙන්ඩර් මගින් ඉවත් කරන තේ (Refuse tea) විකිණීමෙන් ලැබෙන ආදායම ද ඇතුළත් වේ.

		2024.12.31 වන විට		2023.12.31 වන විට	
19	**වෙනත් අදායම**	**(රු.)**		**(රු.)**	
	ගස් ටෙන්ඩරය	141,951,100		86,053,385	
	බදු කුලී	26,746,165		18,189,536	
	කළමනාකරණ ගාස්තු	9,877,975		10,612,085	
	මූල්‍ය ආදායම	144,277		1,014,565	
	භූන්නස් දිය ඇල්ලෙන් ලැබෙන ආදායම	3,493,242		1,369,773	
	රජයේ ප්‍රදාන සහ සහනාධාර	353,835		2,655,167	
	තවාන් පැල - විකුණුම් ආදායම	100,000		1,289,152	
	ප්‍රවේශ පත්‍ර ආදායම	1,952,500		2,205,250	
	විකුණුම් ආදායම - අතිරික්ත අයිතම	5,030,380		4,369,360	
	ආගන්තුක බංගලා ආදායම	609,200		399,900	
	වෙනත් ආදායම් - වතු සහ ප්‍රධාන කාර්යාලය	2,057,817		7,585,711	
	මුළු අනෙකුත් ආදායම	**192,316,490**		**135,743,884**	

		2024.12.31 වන විට		2023.12.31 වන විට	
20	**පරිපාලන වියදම්**	**(රු.)**		**(රු.)**	
	කාර්ය මණ්ඩල වියදම් - (ප්‍රධාන කාර්යාලය)	54,741,858		49,200,419	
	නිර්වචනය කරන ලද දායක මුදල් - ස.අ.අ., ව.ගෙ.වි.ක්‍රි. සහ සේ.වි.වි.ක්‍රි. (ප්‍ර.කා)	5,613,465		4,852,131	
	නිර්වචනය කරන ලද දායක මුදල් - සේ.හා.අ. (ප්‍ර.කා)	1,403,681		1,202,980	
	ක්ෂය වීම (ප්‍රධාන කාර්යාලය)	2,078,401		1,697,455	
	පාරිතෝෂික වියදම් (ප්‍රධාන කාර්යාලය)	1,425,483		1,330,301	
	වෙනත් පරිපාලන හා විකුණුම් වියදම් - ප්‍ර.කා.	61,673,645		65,819,110	
	පාරිතෝෂික වියදම් - (වතු)	37,502,035		30,949,671	
	වෙනත් පරිපාලන වියදම් - වතු	58,495,431		63,104,361	
	මුළු පරිපාලන වියදම්	**222,934,082**		**218,156,428**	

		2024.12.31 වන විට		2023.12.31 වන විට	
21	**මූල්‍ය වියදම්**	**(රු.)**		**(රු.)**	
	මුදල් සඳහා කොමිස්	6,039,928		6,808,618	
	තේ කෑල්කරුවන්ගේ අත්තිකාරම් සහ ගාස්තු සඳහා පොලී	13,987,222		8,050,274	
	බැංකු ගාස්තු	427,153		1,258,547	
	බැංකු අයිරා පොලී	5,581,044		36,729,279	
	බැංකු ණය පොලී - (මහජන බැංකුව)	32,241,132		18,601,853	
	බැංකු ණය පොලී - හලාවත වැවිලි සමාගම	1,600,000		1,600,000	
	මුළු මූල්‍ය වියදම්	59,876,479		73,048,571	

22 **ආදායම් බදු**

පසුගිය වසරවල මෙන්ම, සමාලෝචිත මූල්‍ය වර්ෂය සඳහා වන SLSPC හි වාර්ෂික ගිණුම්වල ආදායම් බදු ගණනය කිරීම් ඉදිරිපත් කර නොමැත. SLSPC පසුගිය වසරවල අඛණ්ඩව පාඩු ලබා ඇති බැවින් (1995 සිට 2023 දක්වා කාලය තුළ වසර පහක් හැර පහක් හැර, එම වසරවල SLSPC ලාභ උපයා ඇත), අනාගතයේදී බදු අය කළ හැකි ලාභ නොලැබෙනු ඇතැයි උපකල්පනය කෙරේ. කෙසේ වෙතත්, අපි මේ වන විට ආදායම් බදු වාර්තා (Returns) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටින අතර, දැනට, අපගේ වාර්ෂික මූල්‍ය වර්ෂය අවසන් වන දෙසැම්බර් 31 වන දිනට අනුව සකස් කරන ලද වාර්ෂික ගිණුම් මත පදනම්ව ආදායම් බදු වාර්තා ඉදිරිපත් කිරීමට ඉඩ දෙන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා අපි අපගේ රේඛීය අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දී ඇත. එනම් සෑම වසරකම මාර්තු (31 වන දිනට නොව). ආරම්භයේ සිටම SLSPC වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා වන අතර, 2023 වර්ෂය දක්වා වාර්ෂික ගිණුම් ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කර ඇත ඉදිරියට කටයුතු කිරීම සඳහා අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී.

පාර්ශ්ව සම්බන්ධ ගනුදෙනු

23 රාජ්‍ය සහ රාජ්‍ය පාලනය යටතේ ඇති ආයතන සමඟ ගනුදෙනු

සාමාන්‍ය ක්‍රියාකාරිත්වයේ දී, සංස්ථාව ආශ්‍රිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනුවලට එළඹේ. ආශ්‍රිත පාර්ශ්වයන් අතරට ශ්‍රී ලංකා රජය (සංස්ථාවේ අවසාන හිමිකරු ලෙස), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය පාලිත ආයතන ඇතුළත් වේ. තනි තනි වශයෙන් වැදගත් වන සහ සාමූහිකව ගත් කලෙක මිස තනිව ගත්කළ වැදගත් නොවන රාජ්‍ය සහ රාජ්‍ය පාලිත ආයතන සමඟ සංස්ථාව විසින් සිදු කරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

	2024	2023
	(රු.)	(රු.)
ගෙවීමට ඇති/ලැබීමට ඇති ශේෂයන්		
ගෙවීමට ඇති		
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
පොහොර සංස්ථාව	35,931,679	35,931,679
මහජන බැංකුව	-	-
හලාවත වැවිලි	42,810,959	41,210,959
ලංකා ඛනිජ වැලි සමාගම	25,000,000	25,000,000
ඇල්කඩුව වතුයාය	172,137	172,137
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	97,709,342	97,709,342
පර්ත් වතුයාය	6,610,411	6,610,411
	236,943,557	**235,343,557**
ගෙවීමට ඇති / ලැබීමට ඇති		
ඇල්කඩුව වතුයාය	1,916,092	1,916,092
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	41,071,407	41,071,407
(එකතුව / උප එකතුව)	1,668,269	1,668,269
එකතුව	**44,655,768**	**44,655,768**

24 බැඳීම් හා අවිනිශ්චිතතාවයන්

දිගු කාලයක් තිස්සේ ව්‍යවස්ථාපිත වගකීම් (EPF, ETF සහ පාරිතෝෂික) නොපියවීම සම්බන්ධයෙන් ශේෂ පත්‍ර දිනය වන විට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකාරිත්වයට එරෙහිව පන්විල, තෙල්දෙණිය සහ මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු කටයුතු 784 ක් ගොනුකර ඇත.2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළ නඩු 163 ක් සම්පූර්ණයෙන් සමථයකට පත් කිරීමෙන් පසු 2023 දෙසැම්බර් 31 වන විට මුළු නඩු 784 ක් විභාග වෙමින් පැවතුණි. කවද, 2023 වර්ෂය තුළ සංස්ථාවට එරෙහිව නව නඩු 95ක් පවරා ඇත.සංස්ථාවේ නීතිඥයින් විසින් නඩු කටයුත්ත සාර්ථකවිය හැකි නමුත් සංස්ථාවේ වාසියට නඩු තීන්දුවක් ලබාදීමේ සම්භාවිතාවය ඉතා අඩුබවට සංස්ථාව දැනුවත් කරනු ලැබ ඇත.ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශනවලින් කිසිදු අවිනිශ්චිත වගකීමක් සඳහා ප්‍රතිපාදන සපයා නොමැත.

පෙර වසරවලදී මෙන්ම, 2023 වර්ෂයේදී ද සංස්ථාව විසින් සෑම සතියකම විභාගයට ගැනෙන දිගුකාලයක සිට පැවත එන හිඟ සේවක ව්‍යවස්ථාපිත ගෙවීම්වලට අදාළ නඩු කටයුතු සඳහා අබාණ්ඩව ගෙවීම් සිදු කරන ලදී. 2020 වසරේ සිට 2023 වසරේ සැප්තැම්බර් දක්වා කාලය තුළ සංස්ථාව මහා භාණ්ඩාගාරයෙන් කිසිදු මූල්‍ය ආධාරයක් ලබා නොගෙන මෙම නඩු සඳහා රුපියල් මිලියන 281.04ක් තම අරමුදල්වලින් ගෙවීම් කටයුතු සිදුකර ලදී. කෙසේවුවද, 2023 සැප්තැම්බර් මාසයේ සිට සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් කටයුතු සඳහා හෝ ඊට අදාළ නඩු සමථ කරගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මාසිකව රුපියල් මිලියන 21.3 ක් සංස්ථාව වෙත ගෙවන අතර ඒ අනුව සංස්ථාව වෙත 2023 සැප්තැම්බර් - දෙසැම්බර් කාලසීමාව තුළ මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 63.9 ක් ලැබී ඇත. ප්‍රධාන වශයෙන් නඩු කටයුතු සඳහා විශාල මුදල් ප්‍රවාහයක් පිටකට ගලා යෑම සහ 2021 මාර්තු මස සිට කම්කරු වැටුප රු.1000 (34.5% කින්) ඉහළ යාම නිසා වාර්ෂිකව රු.මි 150.0 ක අතිරේක පිරිවැයක් ඇරීමට සිදුවූ හෙයින් මෙම කාලසීමාව සඳහා අප විසින් මාසික ව්‍යවස්ථාපිත වගකීම් ගෙවා නොමැත. මෙම කාලය තුළදී මාස හතරක් සඳහා පමණක් අප විසින් ව්‍යවස්ථාපිත වගකීම් ගෙවනු ලබා ඇත.

25 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති සියලුම වැදගත් සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ හෙළිදරව් කිරීම් සිදු කර ඇත

26 පෙර වර්ෂයේ ගැළපීම්

පෙර වර්ෂයේ ගැලපීම්වලට පූර්ව මූල්‍ය වර්ෂවලට අදාළ පහත ගනුදෙනු ඇතුළත් වන අතර වතුයායන් සහ ප්‍රධාන කාර්යාලය විසින් මෙම වර්ෂය තුළ මෙම ගැලපීම් සිදු කරන ලදී.

විස්තර

	2024	2023
	රු.	රු.
ගෙවිය යුතු පාරිතෝෂිකය / සැපයීම (අඩු/වැඩි සැපයීම)	127,693,467	6,022,343
පාරිතෝෂික අධිභාර	2,902,909	227,010
සේවක අර්ථසාධක අරමුදල් (EPF) අධිභාර	10,452,233	3,854,975
සේවක භාරකාර අරමුදල් (ETF) අධිභාර	2,642,549	521,454
අවලංගුකරණ සැපයීම් අඩු/වැඩි කර දැක්වීම	(761,685)	(141,578)
අනෙකුත් වියදම්/ගැලපීම්	20,409,991	(7,069,652)
එකතුව	163,339,464	3,414,552

27 විලම්බිත වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.4.3 ට අනුව විලම්බිත වත්කම් 10% කින් ක්‍රමක්ෂය කරන ලද අතර ලාභ හා අලාභ ගිණුමේ සාමාන්‍ය ගාස්තු -මාර්ග යටතේ වියදම්වලින් හර කරගන්නා ලදී.


විගණන වාර්තාව
2024

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිඒඑල්/ජී/එස්එල්එස්පීසි/01/2024/16 } ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 ජූලි 08 දින

සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1958 අංක 04 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 14 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 13 හි 27 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් සාධාරණ අගයකට ගිණුම්ගත කළ යුතු වුවත් සංස්ථාව සතු වතු 16 න් වතු 15කට අයත් හෙක්ටයාර් 9,960 ක් වූ ඉඩම් වටිනාකම් ගණනය කර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 55 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතයට ගත හැකි අවස්ථාවේ සිට ක්ෂය කිරීම් සිදුකළ යුතු වුවත් ගෝමර තේ කර්මාන්තශාලාව සඳහා මිලදීගෙන තිබූ වර්ණ විභේදන යන්ත්‍රය (Color Separate) 2023 මාර්තු 28 දින සිට නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කර තිබුණද යන්ත්‍රය සඳහා 2023 දෙසැම්බර් මාසයට පමණක් ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයට අදාළව රු. 2,169,966 ක් අඩුවෙන් ක්ෂය ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම් ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම් සිදුකළ යුතු නමුත්, ආයුගණන ක්‍රමය භාවිතා කර නොතිබූ බැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු. 763,932,645ක් වූ සේවක ප්‍රතිලාභ බැඳීම් ශේෂයන්හි නිර්වද්‍යභාවය විගණනයේදී තහවුරු නොවිය.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 හි 28 ඡේදය අනුව මූල්‍යමය අයිතම පියවීමේදී පැන නගින විනිමය වෙනස්කම් ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතු වුවත් වර්ණ විභේදන යන්ත්‍රය (Color Separate) මිලදී ගැනීමට අදාළව පැන නැඟුන හුවමාරු අගයේ වෙනස්කම මත වූ ලාභය 2023 වර්ෂයේදී රු. 137,618 ක් හා 2024 වර්ෂයේදී රු. 3,405,805 ක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41හි 12 හා 30 ඡේදයන්ට හා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.4.2 අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනාගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු බව දක්වා ඇතත්, සංස්ථාවේ වතු 14 ක් පුරා විහිදුනු දැව අස්වනු නෙළිය හැකි ගස් 104,691 ක් ඇතුළුව ග්‍රාන්ඩිස්, ඇල්බිසියා, තේක්ක, යුකැලිප්ටස් යනාදී වනවගාවන් සමාලෝචිත වර්ෂය අවසානයටද නිසි තක්සේරු කිරීමකින් තොරව හෝ සාධාරණ අගයකට අගය කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 3,362,969,544 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. එසේම ප්‍රමිතයේ 43 ඡේදය ප්‍රකාරව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් පරිණත හා පරිණත නොවූ වගාවන් ලෙස වෙන වෙනම ඉදිරිපත් කල යුතු වුවද 2020 සිට 2024 දක්වා කාලය තුල සිටුවා තිබූ විවිධ දැවමය ශාක 32,820 ක් පරිණත හා පරිණත නොවූ ලෙස දක්වා නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන්හි දේපළ පිරියත හා උපකරණ වර්ග 06ක පිරිවැය රු.504,307,691 ක් වූවද ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛනය අනුව එහි අගය රු.380,289,813 ක් වූයෙන් රු.124,017,878 ක වෙනසක් නිරීක්ෂණය විය. සංස්ථාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය ගණනය කිරීම් අනුව ගොඩනැගිලි සඳහා රු. 218,769 ක් ක්ෂය වැඩියෙන් ද උපකරණ, ගෘහ භාණ්ඩ, මෝටර් රථ, පරිගණක හා යන්ත්‍ර සඳහා රු.1,038,206ක් ක්ෂය අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඌ) ගෝමර තේ කර්මාන්තශාලාවේ 2024 ජූලි 15 දින තේ වියලන යන්ත්‍රයට හා ගොඩනැගිල්ලට හානි වී තිබුණු අතර එම හානියේ වටිනාකම රු. 2,652,300 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර හානියට අදාළව රක්ෂණයෙන් රු. 2,200,630 ක් ලැබී තිබුණි. ඒ අනුව වත්කම් හානියෙන් රු. 451,670 ක අලාභයක් හඳුනාගෙන තිබුණි. වත්කම් ඉවත් කිරීමට අදාළ මුළු අලාභය රු. 45,386 ක් වුවත් වත්කම් ඉවත් කිරීමේ අලාභය රු. 451,670 ක් ලෙස දැක්වීමෙන් සංස්ථාවේ ලාභය රු. 406,284 කින් ඌණගණනය වී තිබුණි.

(එ) 2024 වර්ෂය තුළදී වලහන්දුව වතුයායේ රබර් ගස් 1007 ක් ටෙන්ඩර් කැඳවමින් රු. 3,791,359ක මිලකට අලෙවිකර තිබුණද එහි පිරිවැය ධාරක ජීව විද්‍යාත්මක ශේෂයෙන් අඩුකර නොතිබුණ නිසා වත්කම් අධිගණනය වී තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී ගස් විකිණීමෙන් රු. 141,951,100ක ආදායමක් උපයා තිබුණද එහි පිරිවැය හඳුනාගෙන වර්ෂයේ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයෙන් අඩුකර නොතිබුණු බැවින් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය අධි ගණනය වී තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය සහ වර්ෂය තුල ගෙවන ලද පාරිතෝෂික වියදමද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල වෙනම ගලපා තිබුණු අතර ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකමෙන් පසුගිය වර්ෂයේ ශේෂය සමඟ වෙනස වූ රු. 41,025,510 ක වෙනස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුලින් ගලපා තිබුණි.

(ඕ) සංස්ථාවේ 2024 වර්ෂයේ බදු කුලී ආදායම රු.1,252,504 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයෙන් සංස්ථාවේ ලාභය අඩු වී තිබුණු අතර ලැබිය යුතු බදු කුලී ආදායම ද එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ක) 2024 දෙසැම්බර් 31 දිනට වතුයායන්හි වෙළඳ හා ණයගැති ශේෂය තුල ප්‍රධාන කාර්යාලය සහ වතු අතර, ප්‍රාදේශීය කාර්යාලය සහ වතු අතර හා වතුයායන් අතර භාණ්ඩ හුවමාරු කරගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුල එකිනෙකට හිලව් නොවූ රු. 166,412,556 ක ශේෂයක් පැවතුනි. ඒ තුල වර්ෂයකට වැඩි රු. 7,963,019,263 ක් වූ හර ශේෂයක් හා රු. 7,525,771,264 ක් වූ බැර ශේෂයක් විය. වතු ජංගම ගිණුමේ (Estate C/A Balance) හර ශේෂය තුල 2019 හා 2020 වර්ෂ වලට අදාලව වතුයායන් අතර පවතින ගනුදෙනු සටහන් කිරීමේදී අවශ්‍ය ජනල් සටහන් ඇතුලත් නොකිරීම හේතුවෙන් ඉතිරි වූ රු. 1,681,780,263 ක ශේෂයක් පැවතිනි. එය මෙතෙක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) ප්‍රධාන කාර්යාලයේ ගෙවිය යුතු ශේෂ තුල ආපසු ගෙවිය යුතු තැන්පතු (Refundable Deposit) ලෙස රු.28,571,363 ක දීර්ඝ කාලයක සිට නිරවුල් නොවූ ශේෂයන් වූ අතර එම ශේෂයන්හි නිවැරදිභාවය තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුනි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් නිසා නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවන් සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු ලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ 15 හා 16 වන වගන්තිය	2000 සිට 2024 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.695,690,845ක සේවක අර්ථසාධක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර ඒ මත ගෙවිය යුතු අධිභාරය 2024 දෙසැම්බර් 31 දිනට රු.85,854,420ක් විය. ඉහත අරමුදලට දායක නොවන වතු සේවකයින් වතු කාර්යමණ්ඩලයේ අර්ථසාධක අරමුදල (ESPS) වෙත ගෙවිය යුතු දායක මුදල රු.89,799,721ක්ද, වතු කළමනාකරුවන් ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය (CPPS) වෙත ද ගෙවිය යුතු මුදල රු. 21,984,422 ක්ද විය.

(අ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 02 වන කොටසේ 16(1) ඡේදය	2000 සිට 2024 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා ගෙවිය යුතු දායක මුදල රු.47,537,485 ක් වන අතර ඒ මත ගෙවිය යුතු අයිභාර මුදල රු. 10,425,561 ක් විය.
(ඇ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 5(1) වගන්තිය	2010 සිට 2024 වර්ෂය දක්වා වතු සේවකයින් සඳහා රු.583,316,046 ක් ද ප්‍රධාන කාර්යාලයේ සේවකයින්ට රු.4,911,149 ක්ද වශයෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු මුළු පාරිතෝෂික මුදල රු. 588,227,195 ක් වූ අතර ඒ මත ගෙවිය යුතු අයිභාර මුදල රු. 27,777,163 ක් විය.
(ඈ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 18(1) වගන්තිය හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තිය	පනත ප්‍රකාරව 2018 සිට ඉන්ධොයිස් පත්‍ර ඉදිරිපත් කල වර්ෂ 6 ක විගණන ගාස්තු රු.6,585,858 ක් ද, 1998 සිට 2017 වර්ෂ සඳහා වූ විගණන ගාස්තු රු.6,393,289 ක් ද ගෙවා නොනිබුණි.
(ඉ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	ආයතනය සතු වාහන 122 න් 74 ක් ම එනම් සියයට 61 ක්ම ධාවන තත්ත්වයේ නොමැති අතර ඒවායින් වැඩි ප්‍රමාණයක් වර්ෂ 8 – 14 කට පෙර සිටම ධාවන තත්ත්වයේ නොතිබුණු වාහන විය. 2024 පැවති පොදු ව්‍යාපාර කමිටුව මහින් ද වාහන අපහරණය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා නිබුණ ද 2025 මැයි 31 වන විටත් එම වාහන අපහරණය කර නොනිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2020 සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ නැවත දැවමය ගස් වගා කරන ලද රංගල කල්දූරියා කොටසේ ගම්පැල 2,600 ක්, යුකැලිප්ටස් 1,732 ක්, කැසීයා 250 ක් හා කුඹුක් පැල 10 ක් සිටුවීමට රු. 1,065,150 ක මුදලක් වැයකර තිබුණද එම පැල සිටුවා නොතිබූ බව විගණනයේදී නහවුරු විය.

(ආ) සංස්ථාව සතු වතුයායන් මැනුම් කටයුතු සිදුකිරීමේදී වතුයායන් 06 ක ගැසට් මඟින් ලද ඉඩම් ප්‍රමාණයට වඩා හෙක්ටයාර් 1,112 ක් අඩුවෙන්ද එක් වතුයායක හෙක්ටයාර් 3.19 ක් වැඩියෙන්ද තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය රු.මිලියන 1,655.78ක ඍණ අගයක් ගෙන තිබුණි. එසේම රු.මිලියන 2,181.12 ක්වූ ජංගම වගකීම් තුළ එකතුව රු.මිලියන 1,443.24ක දිගුකාලීනව ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් ශේෂයක්ද රු.මිලියන 221.98 ක බැංකු ණයක් හා රු. මිලියන 2.45 ක බැංකු අයිරාවක්ද වූ අතර සංස්ථාව ඌන කාරක ප්‍රාග්ධන ගැටළුවකට මුහුණපා ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු, ශේෂය වූ රු. 479,620,080 න් වර්ෂ 05 කට වඩා පැරණි රු. 253,147,140 ක ශේෂයක් වූ අතර ඒ තුළ වර්ෂ 12 කට පෙර සිට පවතින රු. 219,546,538 ක ශේෂයක් විය. එය ගෙවිය යුතු ණයහිමි ශේෂයෙන් සියයට 46ක් විය.

(ඉ) ප්‍රධාන කාර්යාලයේ සහ වතුවල රු. 348,085,497 ක් වූ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 05 ඉක්මවා තිබුණු රු.58,872,707 ක ශේෂය අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

ජී.ඒ.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පැහැදිලි කිරීම්

1.2 මතය සඳහා පදනම

(අ). බැංකු ණයක් ලෙසට පරිවර්තනය කරන ලද සංස්ථාවේ බැංකු අයිරාව, 2020 වර්ෂයේදී ලබාගෙන තිබූ බැංකු ණය මුදලෙන් ගෙවිය යුතුව තිබූ ශේෂය සහ ඒවාට අදාල පොළිය ද ඇතුළත් වූ රු. 237,100,000 මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලා ඒමක් ලෙස සටහන් කිරීමට හේතුවුයේ එම මුදල් සංස්ථාවේ මහජන බැංකුවේ අංක 046-1-001-5-0000933 දරණ ගිණුමට 2024.02.22 දින බැර කර තිබූ නිසාය. තවද පස් අවුරුදු ණයක් ලෙස පරිවර්තනය කරන ලද රු. 79,300,000 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලායාමක් ලෙස සටහන් කර ඇත්තේ එම මුදල බැංකු ගිණුමට හර සටහනක් ලෙස 2024.02.22 දින යොදා තිබූ නිසාය (රු. 102,099,898.16 තුල ඉහත සඳහන් රු. 79,300,000 ඇතුළත්ව ඇත). බැංකු ප්‍රකාශනයේ පිටපතක් විගණනයේ දැන ගැනීම පිණිස මේ සමඟ අමුණා ඇත

(ආ). ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 2023 වසර දක්වා වතු මැණුම් කර මායිම් හඳුනාගෙන නොතිබූ හෙයින් මෙතෙක් කල් රජයේ තක්සේරුවක් ලබාගැනීමට යාමේ දී එය බාධාවක් බවට පත්විය. කෙසේ වෙතත්, අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් රජයේ අයවැය ප්‍රතිපාදන මත අදියර කිහිපයකින් සංස්ථාවේ පාලනය යටතේ ඇති වතු මැණුම් කිරීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව ඉඩම් වල වටිනාකම පිලිබඳව අදහසක් ලබාගැනීමට රජයේ තක්සේරු වාර්තා ලබාදෙන ලෙස ඉල්ලීමක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත සිදු කර තිබිණි.

එහි දී ඒ සඳහා අය කරන මුදල් ප්‍රමාණය ගණනය කිරීමට යොදාගන්නා මිල සූත්‍රය පිළිබඳව ද එකී දෙපාර්තමේන්තුව අප වෙත දැනුම් දීමක් සිදු කර තිබූ අතර, ඒ අනුව තක්සේරු කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවන බව තහවුරු විය.

එබැවින් මෙම තක්සේරු කටයුතු සිදු කරගැනීමේ ක්‍රියාවලියට අමාත්‍යාංශයේ මැදිහත් වීම ලබාදෙන ලෙසට අප විසින් 2025.04.28 දිනැතිව ඉල්ලීමක් සිදු කල අතර, ඊට ප්‍රතිචාරයක් ලෙස අමාත්‍යාංශය විසින් 2025.05.15 දිනැති ලිපිය මඟින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරමින් මෙම වතු රජයේ වතු ඝනයට අයත් වන හෙයින් සහන මිලක් අය කරමින් තක්සේරු කිරීමේ හැකියාව සොයා බලන ලෙස ඉල්ලීමක් සිදු කර තිබුණි.

(ඇ). ගෝමර තේ කර්මාන්තශාලාවේ ස්ථාපනය කිරීම සඳහා චීනයෙන් ආනයනය කරන ලද Colour Separator යන්ත්‍රය ක්ෂය කිරීමෙදි විගණන වාර්තාවේ පෙන්වා ඇති ආකාරයට 2023 වර්ෂයේ දෙසැම්බර් මස සඳහා පමණක් ක්ෂය ගණනය කිරීම තුළින් 2023 වර්ෂය සඳහා අඩුවෙන් ක්ෂය ගණනය කිරීම අත්වැරදීමකින් සිදුවුවකි. එබැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16ට අනුකූලව නිවැරදිව ක්ෂය ගණනය කර එම වරද 2025 වසරේ අවසන් ගිණුම් පිළියෙල කිරීමෙදි නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

(ඈ). සංස්ථාවේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව ආයුගණන ක්‍රමය භාවිතා කලයුතු වුවද, මේ දක්වා එය සිදුකිරීමට නොහැකිවූයේ ආයුගණකඥවරයෙකුගේ (Actuary) හෝ ආයුගණකඥ ආයතනයක (Actuarial firm) සේවාව ලබාගැනීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවන බැවින්, ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතා මාධ්‍යයේ ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට අපහසු වීම නිසාය. කෙසේ නමුත් අප විසින් ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලවීමේ අවශ්‍යතාවය ඉතා වැදගත් කොට සලකන බැවින් ඉදිරියේදි පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කොට අනුමැතිය ලබාගැනිමට අපේක්ෂා කෙරේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමටද බලාපොරොත්තු වේ.

(ඉ). ගෝමර කර්මාන්තශාලාවතුල ස්ථාපිත කිරීම සඳහා ආනයනය කරන ලද Colour Separator යන්ත්‍රය අප සංස්ථාව විසින් පසුගිය වර්ෂ ගණනාව තුලදීම සිදුකල එකම ආනයනයවේ. එම යන්ත්‍රය ආනයන කිරීමට අදාලව පැණනැගුණු විදේශ විනිමය හුවමාරු ලාභය (Exchange gain) නිවැරදි ලෙස ආදායම් ප්‍රකාශණයතුල ගිණුම්ගත

කර නොතිබීම අප අතින් සිදු වූ වරදක් වන අතර, 2025 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී අවශ්‍ය ගැලපීම් සිදුකොට මෙම වරද නිවැරදි කිරීමට බලාපොරොත්තුවේ.

(ඊ) සංස්ථාවේ වතුයායන් සතුව ඇති වානිජමය වන වගාවන් මේ වන විට ලැයිස්තු ගත කිරීම අවසන් කර ඇති අතර, එම වන වගාවන් තක්සේරු කිරීමේ කටයුතු මේ වන විට සිදුකරගෙන යමින් පවති. මෙම කාර්යය සඳහා විශාල කාලයක් ගත වන අතර ආයතනයේ නිළධාරීන් පිරිසක් විසින්ම ඔවුනගේ දෛනික රාජකාරී අතරතුරෙහිම මෙම කාර්යයේ නියලෙන බැවින්, දැනට මෙම තක්සෙරු කිරීමේ කටයුතු ඕපල්ගල වතුයායේ

ඇති වනවගාවන් තක්සේරු කිරීමට පමණක් සීමා වී ඇත. එබැවින් මේ අවස්ථාව වනවිට වනවගාවන්ගේ සත්‍ය වටිනාකම මූල්‍ය තත්ව ප්‍රකාශණයේ ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. මෙම කාර්ය සම්පූර්ණ කල පසු විකුණූ ගස්වල පිරිවැය ධාරක විද්‍යාත්මක ශේෂයෙන් අඩුකර පෙන්වීමට කටයුතු කරනු ලැබේ.

තවද, මෙම ගස් තක්සේරු කිරීම සඳහා අප විසින් භාවිතා කරනු ලබන්නේ දැව සංස්ථාව විසින් භාවිතා කරනු ලබන සමීකරණයකි. අප වෙත දෙන මෙම සමීකරණය වැවිලි සංස්ථාවේ ගස් තක්සේරු කිරීමට කොපමණ දුරකට යෝග්‍ය දැයි ගැටළුවකාරී තත්වයක් මතු වී ඇත්තේ එම සමීකරණය දැව සංස්ථාව විසින් බිම හෙලන ලද දැව කොටන් වල අගය තක්සේරු කිරීම සඳහා යොදාගන්නා සමීකරණයක්වීමය. එබැවින් එම සමීකරණය සංස්ථාවේ ගස් තක්සේරු කිරීම සඳහා යොදා ගන්නා විට ගස් වල වටිනාකම ඉතා ඉහළ අගයක් ගන්නා බව මේ වන විට නිරීක්ෂණය වී තිබේ. එබැවින් මෙම ඉදිරි තක්සේරු කටයුතු සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලයේ උපදෙස් අපි ගස් තක්සේරු කිරීම සඳහා අප විසින් යොදාගනු ලබන්නේ දැව සංස්ථාව විසින් දැව කොටන්වල වටිනාකම තක්සේරු කිරීම සඳහා භාවිතා කරනු ලබන සමීකරණයකි. එබැවින් ගස් තක්සේරු කිරීමේ ඉදිරිකටයුතු සම්බන්ධව ජාතික විගණන කාර්යාලයේ උපදෙස් අපි විසින් බලාපොරොත්තු වන්නෙමු.

(උ). සංස්ථාවේ ලෙජරයේ නැවත වන වගාව සඳහා දරණ ලද වියදම වන රු.48,388,411.35 ධාරක වන වගා වියදම් යටතේ පෙන්වා ඇති අතර නෙලීමට සුදුසු තත්වයේ ගස් වල වටිනාකම රු.3,085,476,423.89 හා රු.මි.229,104,709 ක් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේපෙන්වා ඇත.එසේ වෙන වෙනම ගිණුම් වල පෙන්වා ඇති අගයන් වල එකතුව එක් අගයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇති අතර ධාරක වන වගා සඳහා දරණ ලද වියදම මේ වන තෙක් පරිනත හා පරිනත නොවූ වශයෙන් වෙන්කිරීමක් සිදු කර නොමැත.

(ඌ). විගණන වාර්තාවේ සඳහන් පරිදි 2024.12.31 දිනට වතුයායන්හි දේපළ, පිරියත හා උපකරණ වර්ග 6ක පිරිවැය සහ ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන උපලේඛනය අනුව එම වත්කම් වල පිරිවැය අතර රුපියල් මිලියන 124.02 ක වෙනසක් ඇති බව සඳහන් වේ. මෙම වෙනසට හේතු වී ඇත්තේ දීර්ඝ කාලයක් තිස්සේ නිවැරදි ස්ථාවර වත්කම් ලේඛණයක් සංස්ථාව සතුව නොතිබීමයි. රේඛීය අමාත්‍යාංශයේද සහයෝගය ඇතිව අංග සම්පූර්ණ නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම මේ වන විට සංස්ථාව විසින් අරබා ඇති අතර එහි ප්‍රථම අදියර වශයෙන් කැළෑබොක්ක වතුයායේ ස්ථාවර වත්කම් (ගෘහ භාණ්ඩ හා උපකරණ, පරිඝණක යන්ත්‍ර) ලැයිස්තුගත කිරීම ආරම්භ කරන ලදී. මෙම ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපන කටයුතු සිදුකරනු ලැබුවේ ආයතනයේම නිළධාරීන් බැවින්, දෛනික රාජකාරී වලට අමතරව මෙම කටයුත්තේද නියැලීම නිසා ඔවුන්ට මෙම කාර්යය නිම කිරීමට නොහැකි විය. එබැවින් ස්ථාවර වත්කම් ලේඛණය පිළියෙල කිරීමේ කාර්යය ආයතනයේ විශ්‍රාමික නිලධාරීන් දෙදෙනකු යොදවා සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි. නමුත්, එම විශ්‍රාමික නිලධාරීන් දෙදෙනා විසින් ඔවුන්ට මෙම කාර්යය සිදුකල නොහැකි බව සංස්ථාව වෙත දන්වා එවා ඇත. එබැවින්, මේ සම්බන්ධයෙන් ඉදිරියෙදි අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කර ඔවුන්ගේ තීරණය අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

(එ). ඉහත ඌ අයිතමයේ සඳහන් කර ඇති පරිදි ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කිරීමේදී සිදුව ඇති දෝෂ සඳහා බලපා ඇත්තේ සංස්ථාව සතුව නිවැරදි ස්ථාවර වත්කම් ලේඛණයක් නොමැතිවීමයි. නමුත්, 2025 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කිරීමට බලාපොරොත්තුවන අතර, සිදුවී ඇති දෝෂයන් නිවැරදි කිරීමට ද අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

(ඒ). දේපළ පිරියත හා උපකරණ මිලදිගත් දින සිට ඒවා ඉවත් කරන දිනය දක්වා ක්ෂය කිරීම සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වේ. එසේ වුවත් 2024 වර්ෂයේදී වතුයායන් විසින් මිලදිගත් වත්කම්වල මිළදී ගත් දිනය නොසලකා මුළු මාසයටම ක්ෂය ගණනය කර තිබීම අප අතින් සිදුව ඇති වරදකි. මෙසේ අදාල කාලපරිච්ඡේදයට

පමණක් ක්ෂය කිරීමට නොහැකිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ වතුයායන් විසින් ස්ථාවර වත්කම් මිලදී ගත් දිනයන් නිවැරදිව ප්‍රධාන කාර්යලය වෙත වාර්තා නොකිරීමයි. මෙම අඩුපාඩුව නිවැරදි කරගැනීමට අවශ්‍ය පියවරක් ලෙස වතුයායන් විසින් මිලදී ගනු ලබන ස්ථාවර වත්කම්වලට අදාල ඉන්වොයිස්පත් කඩිනමින් ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශය වෙත යොමු කරන මෙන් දන්වා ඇත. එබැවින් මින් ඉදිරියට නිවැරදිව ක්ෂය ගණනය කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කෙරේ. තවද, 2024 වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේදී සිදුවී ඇති දෝෂයන් 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට ද අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

(ඔ) 2024 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ වාහන ක්ෂය ගණනය කිරීමේ දී අතපසුවීමකින් 2023 වර්ෂයේ දී මිලදී ගත් වාහනවලට අදාලව ක්ෂය ගණනය කිරීමක් සිදුකර නොමැත. එබැවින්, 2025 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඕ).(ක) ගෝමර කර්මාන්ත ශාලාවේ තේ වියලන යන්ත්‍රයට සිදු වූ අලාභය නිවැරදිව ගණනය කර නොමැති අතර අප විසින් හානිය ලෙස ගණනය කර ඇත්තේ ගින්නෙන් සිදු වූ හානියේ වටිනාකම ලෙස ඇස්තමේන්තු කර තිබූ රු.2,652,300 සහ ලැබූ රක්ෂණ මුදල වන රු.2,200,630 අතර වෙනස වන රු.451,670 ය. මෙම අලාභය ගණනය කිරීමේ දී සිදුව ඇති දෝෂය 2025 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

එසේම මෙම හානීවූ යන්ත්‍රයේ ක්ෂය ගණනය කිරීමේ දෝෂයද 2025 වර්ෂයේ නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(ග). වලන්දුව වතුයායේ ඇති රබර් ගස් සඳහා මූල්‍ය ප්‍රකාශණවල දක්වා ඇති ශේෂය වර්ෂ 2000 පමණ සිට පැවත එන පැරණි ශේෂයකි. තවද, මෙසේ කපා ඉවත්කරන ලද රබර් ගස් වසර 30 කටත් වඩා පැරණි බැවින්ද, එම ගස් පිළිබඳව එම වතුයාය සතුව නිවැරදි දත්තයන්ද නොමැතිවීම හේතුවෙන් ද කපා ඉවත්කරන ලද රබර්ගස්වල පිරිවැය නිවැරදිව හඳුනාගෙන ධාරක ජීව විද්‍යාත්මක ශේෂයෙන් අඩුකර පෙන්වීමට නොහැකිවීමට හේතුවිය. ඉදිරියේදී සංස්ථාවේ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදිව ලැයිස්තු ගත කර තක්සේරු කල පසුව එම වත්කම් විකිණීමෙන් පසු ඒවායේ පිරිවැය වත්කම් ශේෂයෙන් අඩුකර පෙන්වීමට හැකියාව ලැබෙණු ඇත.

(ච) සමාලෝචිත වර්ෂයේදී ගස් විකිණීමෙන් රු.මි.141.95 ක ආදායමක් උපයාගනු ලැබුවද එම ගස්වලට අදාල පිරිවැය සංස්ථාවේ පාරිභෝජ්‍ය විද්‍යාත්මක වත්කම් ශේෂයෙන් අඩුකර පෙන්වීමට නොහැකි වී ඇත්තේ ඉහත සඳහන් (ග) යටතේ පැහැදිලි කර ඇති කරුණු නිසාය.

(ඡ). මෙම වතු වලට අදාල බදු ගිවිසුම් වල සඳහන් කොන්දේසියක් අනුව එම වතු වල බදු ආදායම මහාභාණ්ඩාගාරය වෙත වාර්ෂිකව ලබා දිය යුතුව ඇත.

එසේ ලබා දීමේ දී එම මුදල් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය හරහා ලබා දීම සිදුවේ. එබැවින් ලබා දිය යුතු මුදල කවරේද යන්න සහ ලබාදෙන මුදල කුමක් ද යන්න අප වෙත දැනුම් දීමක් සිදු නොකෙරේ.

එබැවින්, එකී මුදල්, අපගේ ගිණුම් වල වැවිලි සංස්ථාවෙන් මහාභාණ්ඩාගාරය වෙත ලැබෙන මුදලක් ලෙස සටහන් නොවීම නිසා මෙම විගණන විමසුමෙන් අසා ඇති ගැටළුව පැන නැගී ඇති අතර, මෙසේ ආදායමක් ලෙස මහාභාණ්ඩාගාරය වෙත ලබා දෙන මුදල පිළිබඳ විස්තර අප වෙත ද ලබාදෙන ලෙස වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත.

එයට මෙතෙක් පිළිතුරු නොමැති හෙයින් නැවත වරක් සිහිකැඳවීම් ලිපියක් යැවීමට කටයුතු කර ඇත.

(ට).) මෙම රුපියල් 19.148,711 යනු ගෙවිය යුතු ණය පොලී ගිණුමේ 2023 සහ 2024 වර්ෂ අවසානයේ පැවති ශේෂයේ වෙනසයි. 2023 වර්ෂයේ ගෙවිය යුතු ණය පොලී ශේෂය රු.20,054,428 කි. එය 2023 වර්ෂයේ දී ගෙවා නොමැති බැවින් 2023 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය වියදමක් ලෙස සටහන් කොට නොමැත. නමුත් 2024 වර්ෂයේදී මෙම පොලිය ගෙවූ බැවින් 2024 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කොට ඇත. එබැවින් මෙය නිවැරදිව කාරක ප්‍රාග්ධනය යටතේ ගිණුම්ගත කර ඇත.

(ඩ) අප විසින් විගණන වාර්තාවේ සඳහන් කර ඇති කරුණු අප විසින් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇති බව අපගේ විශ්වාසයි. නමුත් අපගේ ගිණුම්කරණයේ අඩුපාඩුවක් ඇතොත් එය නිවැරදි කර ගැනීමට අපහට උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

(ණ) වතුයායන්හි වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තුළ වූ නිවාඩු දින දීමනා වෙන් කිරීමේ ශේෂයෙහි වෙනස්කම වූ රු.993,725 මුදල් ප්‍රවාහයට බලපෑමක් ඇති නොකරන නිසා එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් තුළට ඇතුලත් කර නොමැත.

(ත) අප විසින් විලම්භිත ආදායමට අදාළව විගණනය වෙත ලබා දී ඇති ලේඛණයේ අඩංගු වී ඇත්තේ වතුයායන් විසින් GCF නකල්ස් ව්‍යාපෘතිය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය හරහා ලැබූ අරමුදල් වලින් සිදුකරන ලස ගෙවීම් පිළිබඳ විස්තර පමණි. ප්‍රාදේශීය කාර්යාලය හරහා දරණ ලද රු.574,976 ක මුදල් එම ලේඛණයේ ඇතුළත්ව නොමැතිවීම මෙම වෙනසට හේතුවයි. එබැවින් එම විස්තර ඇතුලත් ලේඛනය මේ සමග අමුණා විගණනය වෙත ඉදිරිපත් කරමු.

(ද) ඉඩම් අංශය විසින් මූල්‍ය අංශය වෙත ලබාදෙන තොරතුරු අනුව, මූල්‍ය අංශය විසින් ලැබිය යුතු බදු ආදායම් සඳහා ඉන්වොයිස්පත් නිකුත් කර ගිණුම් ගත කරනු ලැබේ. කෙසේ වෙතත් බදු දී ඇති දේපොළ වලින් ලැබිය යුතු බදු කුලී ආදායම් පිළිබඳව රජයේ විගණන අංශය වෙත ඉඩම් අංශය විසින් 2024.10.03 දින ලබා දී ඇති ලේඛණයේ දෝෂ පැවති බැවින් නැවත එය නිවැරදි කිරීමට ද කටයුතු කර ඇත.

ඉහත කී එම දෝෂ සහිත තොරතුරු මෙම විගණන විමසුමෙහි සඳහන් වෙනස් ගණනයන්ට පාදක වී ඇත. එය නැවත පරීක්ෂා කර නිවැරදි කර එම ලේඛන මූල්‍ය අංශය වෙත භාරදීමට කටයුතු කරමින් පවතී. තවද, මූල්‍ය අංශය විසින් විගණනය වෙත බදු කුලී ආදායම සම්බන්ධයෙන් ලබාදී ඇති තොරතුරු නිවැරදි බව තහවුරු කරමු.

(න) වතුයායන්හි වෙළෙඳ හා ණයගැති ශේෂය තුළ ප්‍රධාන කාර්යාලය හා වතුයායන් අතර ද, ප්‍රාදේශීය කාර්යාලය හා වතුයාන් අතර ද ඇතිවන ගනුදෙනු සටහන් කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුළ එකිනෙකට හිලව් නොවූ ශේෂයන් අතරින් (2024.12.31 දිනට රු.166,412,556) වැඩිම ප්‍රමාණයක් ඇත්තේ පැරණි හිලව් නොවූ ශේෂයන්ය මේ අතරින් 2019 හා 2020 වසර වලට අදාළව පවතින රු.1,681,780,263 ක ශේෂයෙන් යම් ප්‍රමාණයක් පිළිබඳව වැඩිදුරටත් සොයා බලා ඒවාට අදාළ ජර්නල් සටහන් යොදා එම හිලව් නොවූ ශේෂයන් අඩු කිරීමට 2025 වසරේදී කටයුතුද කිරීමට අපේක්ෂා කෙරේ.

(ප) ආයතනය තුළ දීර්ඝ කාලයක සිට පවතින මූල්‍ය දුෂ්කරතා හමුවේ සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් ද ඇතුළුව දිගු කාලීන සහ කෙටි කාලීන වගකීම් විශාල ප්‍රමාණයක් ගෙවීමට නොහැකි වී ඇත. සංස්ථාවේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් පසුගිය වසර කිහිපය තුලම නිසි වේලාවට වතුයායන්වලට අවශ්‍ය පොහොර යෙදීමට නොහැකි වීම තුළින් තේ දළු අස්වැන්න අඩුවීම, වතු කම්කරු වැටුප් 2021 සහ 2024 වසරවල 35% ක පමණ ප්‍රමාණයකින් වැඩිවීම වැනි කරුණු සංස්ථාවතුල මූල්‍ය අර්බුදයක් ඇතිවීමට ප්‍රධාන හේතූන් විය. මෙම අයහපත් තත්ත්වය මගහරවාගෙන සංස්ථාවේ ආදායම් වැඩිකර ගැනීම සඳහා වතුයායන්ට අවශ්‍ය කරන පොහොර ලබාදීමට මේ වන විට අප ප්‍රමුඛතාවය ලබා දී ඇත. ඒ අනුව ඉදිරි කාලයේදි සංස්ථාවේ තේ අස්වැන්න වැඩි කර ගැනීමට හැකිවෙතැයි අපි අපේක්ෂා කරමු. එලෙස සංස්ථාවේ ආදායම ඉහළ නංවා ගැනීම තුළින් ආයතනයේ මූල්‍ය තත්වය ශක්තිමත් කරගැනීමටත් ව්‍යවස්ථාපිත ගෙවීම් ද ඇතුළුව මේ වන විට ගෙවීමට නොහැකිව ඇති ගෙවීම් වලින් කොටසක් හෝ ගෙවීමට හැකි වෙතැයි අප බලාපොරොත්තු වෙමු. තවද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ඇතුළුව රාජ්‍ය ආයතන තුනක හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධව 2025 වසරේ මාර්තු මස නව රජය යටතේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කොට ඇත. එහිදි මේ සම්බන්ධව අධ්‍යනය කොට නිර්දේශ ලබාදීම සඳහා කමිටුවක් පත් කොට ඇති අතර, 2023 වසරේ සැප්තැම්බර් මාසයේ සිට කැබිනට් තීරණයක් අනුව සංස්ථාව වෙත මාසිකව ලබාදෙන රුපියල් මිලියන 21.3ක මුදල 2025 වසරේ ජූනි මාසය තෙක් ලබාදීමට ද කැබිනට් මණ්ඩලය තිරණය කර ඇත. මෙලෙස මහා භාණ්ඩාගාරයෙන් මාසිකව ලබාදෙන රු. මිලියන 21.3ක මුදල භාවිතා කර සේවක ව්‍යවස්ථාපිත මුදල් නොගෙවීම නිසා සංස්ථාවට එරෙහිව, අධිකරණවල ගොනුකර ඇති නඩු සඳහා සතිපතා ගෙවීම් සිදුකරනු ලැබේ. ඉදිරියේදි කැබිනට් මණ්ඩලය සංස්ථාවේ සම්පූර්ණ හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාදුනහොත්, සියළුම හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීමට ද අප බලාපොරොත්තු වෙමු.

(බ) 2024.12.31 දිනට ප්‍රධාන කාර්යාලයේ ගෙවිය යුතු ශේෂය වූ රු.479,620,083 තුළ වසර 12 ඉක්මවූ රු.230,371,420 ක ශේෂයක් පවතින බවත් එම ශේෂයන් නිරවුල් කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී ඇති බවත් විගණන වාර්තාවේ දක්වා ඇත. මෙම වසර 12 කට වඩා පැරණි ශේෂයන් සම්බන්ධයෙන් අප විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග පහත දැක්වේ.

- **හලාවත වැවිලි සමාගම**

හලාවත වැවිලි සමාගම වෙත අප විසින් ගෙවිය යුතු ණය මුදල (2024.12.31 දිනට ගෙවිය යුතු පොළියද ඇතුලත්ව රු. 42,810,959) අප සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් කපා හරින ලෙස ඉල්ලීමක් සංස්ථාව විසින් සිදු කරන ලදි. එම ආයතනය විසින් අපගේ ඉල්ලිමට පිළිතුරු වශයෙන් දන්වා ඇත්තේ එම ණය මුදල කපා හැරීමට

නොහැකි බවයි. කෙසේ වුවත් මෙම ණය පියවීම සම්බන්ධව ගත හැකි වෙනත් විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට එම සමාගමට හැකි බව ද දන්වා ඇත. එබැවින් හලාවත වැවිලි සමාගම සමඟ මේ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

- **ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම**

ලංකා මිනරල් සෑන්ඩ් සමාගම විසින් අප සංස්ථාව වෙත ලබාදී ඇති රු. මිලියන 25ක ණය මුදල පියවා ගැනීම සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ පවරා ඇති නඩුව සමතයකට පත්කර ගැනීම වෙනුවෙන් අප සංස්ථාවේ සභාපතිවරයා සහ එම ආයතනයේ සභාපතිවරයා අතර සාකච්ඡාවක් 2025/02/17 වන දින පවත්වන ලදී. එම සාකච්ඡාවේදී දෙපාර්ශවයම ප්‍රකාශකර සිටියේ මෙම ආයතන දෙකම රාජ්‍ය ආයතන වන බැවින් මෙය සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණීම වඩාත් උචිත බවයි. ඒ අනුව මේ පිළිබඳ කරුණු එම ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණනය කරන ලදි.

ඒ අනුව ලංකා මිනරල් සෑන්ඩ් සමාගමේ අධක්ෂක මණ්ඩලය තීරණය කර ඇත්තේ, මෙම කරුණ ආයතනයේ විගණන කමිටුව වෙත ඉදිරිපත් කොට එහි නිර්දේශය අනුව ඉදිරි කටයුතු සිදු කල යුතු බවය. මීලග විගණන කමිටු රැස්වීම 2025 සැප්තැම්බර් මාසයේදි පැවැත්වෙන බව එම ආයතනය මගින් දන්වා ඇත. තවද ඉදිරි නඩු දිනය 2025 ඔක්තෝබර් මාසයේ පැවැත්වීමටද නියමිතය.

- **ලංකා පොහොර සමාගම**

අප සංස්ථාව විසින් ණය පදනම මත ලංකා පෙහොර සමාගමෙන් ලබාගත් පොහොර වෙනුවෙන් ගෙවිය යුතු රුපියල් මිලියන 35.93 ක මුදල ආයතනයේ මුල්‍ය දුෂ්කරතා සලකා බලා කපාහරින ලෙස ඉල්ලා අප විසින් ලිපියක් යොමු කර ඇත. නමුත් එම සමාගම ඔවුන්ගේ රේඛීය අමාත්‍යාංශය වෙත 2024.12.20 දින ලිපියක් යොමු කර පවසා ඇත්තේ 2023.05.15 දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමා සමග පැවැති සාකච්ඡාවේදි අප සංස්ථාව විසින් මාසිකව රුපියල් ලක්ෂ දෙක බැගින් ගෙවා මෙම ණය මුදල පියවීමට එකඟ වූ නමුත් මේ දක්වා කිසිදු මුදලක් ගෙවා නොමැති බවය. එබැවින් මේ සම්බන්ධව අපගේ රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට ඉදිරි පියවර ගැනීමට බලාපොරොත්තු වේ.

- **ජනතා වතු සංවර්ධන මණ්ඩලය**

ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත දීර්ඝ කාලයක සිට අප විසින්ගෙවිය යුතු මුදල රු.97,709,346 ක් වුවද එම ආයතනය විසින් සංස්ථාව වෙත ගෙවිය යුතු මුදල රු.42,739,676කි.එබැවින් සංස්ථාව විසින් ඡනවසමට ගෙවිය යුතු ශුද්ධ මුදල රු.54,696,666 කි.අප සංස්ථාවේ දිගු කලක සිට පවතින මුල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙම මුදල ගෙවා දැමීමට නොහැකිවි ඇති නිසා එම මුදල කපා දමන ලෙස ඉල්ලීමක් අප විසින් සිදු කර ඇත.එයට පිළිතුරු වශයෙන් එම ආයතනය දන්වා ඇත්තේ එම මුදල කපා හැරිය නොහැකි බව ඔවුන්ගේ විගණන කමිටුව විසින් තීරණය කළ බවයි. ඉදිරියේදි ආයතනයේ මූල්‍ය තත්වය අනුව මෙම ගෙවීම සිදුකිරීම සම්බන්ධව සලකා බැලීමට අපේක්ෂා කෙරේ.

- **රාජ්‍ය සම්පත් කළමණාකරණ සංස්ථාව**

මුදල් අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය සම්පත් කළමණාකරණ සංස්ථාව වෙත දීර්ඝ කාලයක සිට ගෙවිය යුතු රු. 28,709,029.00 ක මුදලකපා හරින ලෙස ඉල්ලීමක් අප විසින් මුදල් අමාත්‍යාංශයෙන් සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් පිළිතුරක් මෙතෙක් අප වෙත ලැබී නොමැත. නමුත්, වර්තමානයේ දී මෙම ආයතනය පවතිනවාද යන්න පිළිබඳව ගැටළුකාරී තත්වයක් පවතින බැවින් අප විසින් එම ආයතනය පිළිබඳ ව අනතර් ජාලය තුළ පවතින තොරතුරු අධ්‍යනය කළ අතර එහිදී, එම ආයතනය රාජ්‍ය පරිපාලන අමාත්‍යාශය යටතේ පවතින බව දැනගන්නට ලැබිණි. නමුත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාශයේ වෙබ් පිටුවේ එම අමාත්‍යාශය යටතේ ඇති ආයතන වල නම් ලැයිස්තුවේ රාජ්‍ය සම්පත් කළමණාකරණ සංස්ථාව ඇතුලත්ව නොමැති බව අප හට නිරීක්ෂණය විය.එබැවින් මේ සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් විමසීමට බලාපොරොත්තු වන අතර, අප ආයතනයේ විගණන කමිටුව විසින් නිර්දේශ කර ඇත්තේ මෙම ආයතනය වර්තමානයේ නොපවතීනම් අදාළ අනුමැතින් ලබා ගෙන මෙම මුදල ආදායමක් ලෙස ගිණුම් ගත කරණ ලෙසයි.

ඉදිරියේදි ආයතනයේ මූල්‍ය තත්වය අනුව ඉහත සඳහන් ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ.

(ම) විගණන වාර්තාවේ දක්වා ඇති වෙළඳ හා අනෙකුත්ත් ලැබිය යුතු දෑ ශේෂයේ අන්තර්ගත ප්‍රධාන අයිතමයක් වන්නේ ජනතා වතු සංවර්ධණ මණ්ඩලයෙන් අප සංස්ථාවට ලැබිය යුතු රු. 42,739,676 කි. මීට කාලයකට පෙර රාජ්‍ය වැවිලි සංස්ථාවත් ජනතා වතු සංවර්ධණ මණ්ඩලයත් එකම සභාපතිවරයකු යටතේ පවත්වාගෙන ගිය අවස්ථාවේදී එම ආයතනය වෙත ලබාදුන් මුදලකි. නමුත් එම ආයතනය වෙත සංස්ථාව විසින් ගෙවිය යුතු රු.මි. 97,709,346 ක් ඇති බැවින්, සංස්ථාව විසින් ජනවසම වෙත රු.54,696,666 ක මුදලක් ගෙවිය යුතුවේ. මෙම ගණුදෙනු සම්බන්ධව දිගින් සාකච්ඡා සිදුකර ඇති අතර අප ආයතනයට ජනවසමෙන් ලැබිය යුතු ශේෂය සඳහා 2012 වර්ෂයේදී අඩමාණ ණය මුදලක්ද වෙන්කර ඇත.

තවද, MECC වැවිලි ආයතනය මගින් මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇති තේ දළු ගණුදෙනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව යන ආයතනවලට නීතිමය කටයුතු සඳහා යොමු කර ඇත. තවද, ණයගැති වයස් විශ්ලේෂණ වාර්තාවේ ශේෂ ගැලපීම් කරන අවස්ථාවේදි වරදක් සිදුවී ඇති අතර, MECC ආයතනයේ ශේෂය රු.2,541,873.00ක් ලෙස නිවැරදි විය යුතුය. දැනට මෙම ආයතනයේ කළමණාකාරීත්වය නව ආයතනයකට භාර දී ඇති අතර එම ආයතනය සංස්ථාව සමඟ සාකච්ඡා කර ගෙවීම් කටයුතු පිළිබඳ එකඟතාවයකට එළඹඇත. ඒ අනුව 2024 වර්ෂයේ මැයි මස සිට දෙසැම්බර් දක්වා මෙම ආයතනයෙන් රුපියල් මිලියනයක් ලැබී ඇති අතර, තවදුරටත් අයවිය යුතු මුදල් මාසිකව රු.100,000.00 බැගින් අයකර ගැනීමට එකඟ වී ඇත.නමුත් මෙම ගණුදෙනුව සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා නීතිපති දෙපාර්තමේනතුව විසින් මෙවන විටත් නීතීමය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමු.

නානුඔය තේ කර්මාන්තශාලාවෙන් ලැබිය යුතු මුදල අයකරගැනිම සම්බන්ධව මෙවන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව විසින් නීතිමය කටයුතු සිදුකරමින් පවති. තවද, පුස්සතැන්න ආයතනය සමග සිදුවූ ගණුදෙණුව සම්බන්ධව අදාල නීතිමය කටයුතු කිරීමට සංස්ථාවේ නීති අංශයට යොමුකර ඇත. මීට අමතරව ඇල්කඩුව වැවිලි සමාගමෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා අප විසින් එම ආයතනය වෙත නිරන්තරයෙන් ලිඛිතව හා වාචිකව දන්වා ඇති අතර, මෙම මුදල අයකරගැනිම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.

නිෂ්පාදන අංශයේ ණයගැතියන් (Rs.25,876.00), විවිධ ආදායම් ණයගැතියන් (රුපියල්.2,588,530.00), නිෂ්පාදන සඳහා ණයගැතියන්"– රුපියල් 726,644.00) යන ශේෂයන් කාලයක් තිස්සේ පැවත එන අතර මෙම ශේෂයන් සම්බන්ධව මුදල් අයකර ගැනිමේ හැකියාවක අවම වන බැවින් 2012 වර්ෂයේදි අඩමාණ ණය මුදලක් ලෙස වෙන්කිරීමක් සිදුකර ඇත.

බදු ගිවිසුම්හි පැවති ගැටළුකාරී තත්වයන් හේතුවෙන් බදු මුදල් අයකර ගැනීමට නොහැකි තත්වයක් උදා වී ඇති පහත සඳහන් ආයතනයන් සම්බන්ධයෙන් ඉදිරියේදි. සංස්ථාව එම ආයතන සමඟ සාකච්ඡා කර මෙම බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ඊ.ඒ.පී. බෝඩ් කාස්ටිං (පුද්ගලික) සමාගම රු.1,170,000.00
හිල්ස් ඇරෝමා තේ කර්මාන්ත ශාලාව (පුද්ගලික) රු.425,000
මොරවක්කෝරලේ තේ නිෂ්පාදන සහයෝගීතාව රු.825,000.00
ආර්.පී.සී.-උඩුපුසෙල්ලාව වැවිලි සමාගම රු.21,000.00
ආර්.පී.සී.-ඇල්කඩුව වැවිලි සමාගම රු.54,000.00

(ය). 2024.12.31 දිනට ලෙජරය අනුව අවසාන තොගයේ වටිනාකම රු.මි.17,783,065,.67 ක් වන අතර එම තොගය ගණනය කර ඇත්තේ වතුයායන් විසින් එවන ලද 2024 දෙසැම්බර් මාසික ගිණුම් වල පිටු අංක 10යේ අගයට පිටු අංක 13A හි පෙන්වා ඇති තොග වශයෙන් සැලකිය හැකි අයිතමයනුත්, මීට පෙර ඕපල්ගල වතුයායට ඒකාබද්ධ කරන ලද කුඩා ඔය වතුයායේ ශේෂයත් එකතු කිරීමෙනි. ඒ අනුව, මාසික ගිණුම් අනුව අවසන් තොගයේ වටිනාකමත් ලෙජරය අනුව අවසන් තොගයේ වටිනාකමත් අතර වෙනසක් ඇති වන අතර එම වෙනසට හේතු වූ අයිතමයන් පහත දැක්වෙන වගුවේ සටහන් කර ඇත.

වතුයාය	පිටු අංක 10යේ අගය	වෙනස	විස්තරය	එකතුව
අලකොල්ල	250,897.30			250,897.30
කොටගඟ	1,710,715.96	288,002.50	තොග මිලදි	1,998,718.46

			ගැනීම්	
ගල්පිහිල්ල	1,359,618.58			1,359,618.58
ගෝමර	1,842,144.50	2,708,127.18	දහන දර තොග	4,550,271.68
භාගල	359,218.27	10,990.00	අබලි ද්‍රව්‍ය	370,208.27
හෙයාපාර්ක්	1,523,983.37			1,523,983.37
හුන්නස්ගිරිය	633,103.99			633,103.99
කැලෑබොක්ක	2,188,611.72	1,179,728.60	දහන දර තොග	3,377,974.56
		9,634.00	කෝපි තොග	
මිඩ්ලන්ඩ්	966,682.57			966,682.57
නිකොලොය	706,913.65			706913.65
රංගල	342,691.39			342,691.39
ඕපල්ගල්ල	497,406.62			497,406.62
වුඩසයිඩ්	44,695.74			44695.74
විහාරගල	82,779.15			82,779.15
වෛයිතාලාව	443,629.78	3630.00	ලිපි ද්‍රව්‍ය	447,259.78
වලහන්දුව	393,614.13	133,165.15	නිවාස ව්‍යාපෘතිය	526,779.34
කුඩා ඔය		103,081.00		103,081.00
එකතුව	**13,346,706.72**	**4436358.43**		**17,783,065.45**

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

(අ).(ආ),(ඇ) කාලයක් තිස්සේ සංස්ථාවේ පැවති මූල්‍ය අර්බුධය හේතුවෙන් ඉහත සඳහන් හිඟ ව්‍යවස්ථාපිත (EPF,ETF,ESPS,CPPS,Gratuity)ගෙවීම් නියමිත පරිදි සිදුකිරීමට නොහැකි විය. මෙම මූල්‍ය අර්බුර්ධයට ප්‍රධාන වශයෙන්ම බලපෑ කරුණු වන්නේ, පසුගිය වසර කිහිපය තුලම නිසි වේලාවට වතුයායන්වලට අවශ්‍ය පොහොර යෙදීමට නොහැකි වීම තුළින් තේ දළු අස්වැන්න අඩුවීම, 2021/2022 වර්ෂ වල රාජ්‍ය ප්‍රතිපත්ති මත අතැම් රසායනික පොහොර සහ වල්නාශක රට තුළට ආනයනය කිරීම තහනම් කිරීම සහ අනෙකුත් රසායනික පොහොරවල මිල සීඝ්‍ර ලෙස ඉහළ යාම හේතුවෙන් තේ දළු අස්වැන්න සීඝ්‍ර ලෙස පහළයාම, වතු කම්කරු වැටුප් 2021 සහ 2024 වසරවල 35% ක පමණ ප්‍රමාණයකින් වැඩිවීම වැනි කරුණුය. වතු කම්කරු වැටුප් වැඩිවීම හේතුකොටගෙන මාසිකව දළ වශයෙන් රු.මි.14 ක පමණ අමතර වියදමක් දැරීමටද සංස්ථාවට සිදු වේ. මෙම අමතර වියදම දරා ගැනීමට හැකි තේ දළු අස්වැන්නක් අනාගතයේදි ලබා ගැනීම සඳහා වතුයායන් සඳහා අවශ්‍ය පොහොර ලබාදීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස සලකා මේ වන විට කටයුතු කරමින් පවති.

තවද, 2023 වර්ෂයේ සැප්තැම්බර මස සිට කැබිනට් තීරණයක් අනුව හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීම සඳහා මසකට රු.මි.21.3 ක් මහා භාණ්ඩාගාරය මඟින් ලබා දීමට පියවර ගැණිනි.මෙම ප්‍රතිපාදන භාවිතා කොට සති පතා ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් ඇති නඩු වාරික ගෙවා දැමීම සංස්ථාව විසින් සිදුකරගෙන යනු ලබයි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ඇතුළුව රාජ්‍ය ආයතන තුනක හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධව 2025 වසරේ මාර්තු මස නව රජය යටතේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කොට ඇත. එහිදි මේ සම්බන්ධව අධ්‍යනය කොට නිර්දේශ ලබාදීම සඳහා කමිටුවක් පත් කොට ඇති අතර එම නිර්දේශ අනුව කැබිනට් මණ්ඩලය විසින් ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාදෙන්නේ නම් සම්පූර්ණයෙන්ම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීමට බලාපොරොත්තුවේ.

තවද, මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇති අධිභාරය සැකසී අත්තේ EPF ,ETF ,Gratuity නඩු කටයුතු සඳහා යොමු වූ ශේෂයන්ට පමණි. ඉදිරියේ දී නඩු නොදැමූ ශේෂයන්ට අදාලව එම ආයතන සමඟ සාකච්ඡා කර අධිභාරය ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. තවද ගෙවියයුතු පාරිතෝෂික සම්බන්ධව සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂාවක් සිදුකළ අතර එම අවසන් පරීක්ෂණ වාර්තාව ලැබුන පසු පනත ප්‍රකාරව පාරිතෝෂික අධිභාරය ගණනය කිරීමටද බලාපොරොත්තුවේ.

2.2.2 (ඇ), 1 මු.රෙ.756(2)

(අ) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ බඩු බාහිරාදිය භෞතිකව පරීක්ෂා කිරීම සඳහා සම්ප්‍රදායිකව වැවිලි ක්ෂේත්‍රයේ වතුයායන්හි පත් කරනු ලබන්නේ අදාල වතුයායේ වතු අධිකාරි සහ වෙනත් නිළධාරීන් දෙදෙනෙකුය. මෙය රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතුයායන් තුල පසුගිය වසර 50ක පමණ කාලයක සිට සිදු කරනු ලබන ක්‍රමවේදයයි. මෙයට වෙනස් ක්‍රමයක් අනුගමනය කළයුතු වන්නේ නම් ඒ සඳහා එම උපදෙස් ලබා දී වක්‍ර ලේඛණයක් එවිය යුතු වන්නේය. මෙහි සඳහන් කොට ඇති භාණ්ඩ භෞතිකව පරීක්ෂාවට ලක් නොකර ඉකුත් වර්ෂයේ සමීක්ෂණ වාර්තා පිටපත් ලබාගෙන අත්සන් තබන අවස්ථා නිරීක්ෂණය වන්නේයැයි සඳහන් කොට ඇති නමුත් එයට එකඟවිමට නොහැකිය. මෙම භාණ්ඩ ලැයිස්තු සෑම වසර අවසානයේදිම නැවත මුද්‍රණයකොට පරීක්ෂා කිරීම සිදු කිරීම සඳහා ලබාදෙන බවත් සඳහන් කරනු කැමැත්තෙමි. එවැනි අවස්ථාවක් නිරීක්ෂණය වූයේ නම් එම කරුණු එම අවස්ථාවේදීම වතු කළමණාකාරිත්වය දැනුවත් කිරීමට තිබුණි.

II කාලයක පටන් අප සංස්ථාවේ වතුයායන්වල ප්‍රධාන ගබඩා පොතක් (Main Inventory Book) පවත්වාගෙන යනු ලබන අතර, බඩු භාණ්ඩ ගබඩාවට භාර ගැනීම සඳහා සහ ගබඩාවෙන් නිකුත් කිරීම සඳහා Goods Received Note සහ Goods Issued Note භාවිතා කරනු ලබයි. සංස්ථාව විසින් විගණන වාර්තාවේ සඳහන් පරිදි මුදල් රෙගුලාසි 454 අනුව 44 වැනි පොදු ආකෘතිය අනුව භාණ්ඩ ලේඛණ පොතක් පවත්වාගෙන යාම අවශ්‍ය නම් ඉදිරියේදි එසේ කිරීමට අපේක්ෂා කෙරේ.

III කැලැබොක්ක 360 නැරඹුම් ස්ථානයට කැපැමිණෙන සංචාරකයින් සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම නවින තාක්ෂණය යොදා ගනිමින් පරිඝණක යෙදුමක් (Computer App) භාවිතයෙන් සිදු කිරීමට සැලසුම් කර ඇත. සංස්ථාව විසින් දැනටමත් හුන්නස්ගිරිය වතුයාය පරිශ්‍රයේ ඇති දියඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින්ට පරිඝණක යෙදුමක් මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම අරඹා ඇති අතර කැලෑබොක්ක වතුයායේද මේ ආකාරයටම ඉදිරියේදි ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම ආරම්භ කරන බැවින් විගණන වාර්තාවේ සඳහන් ගැටළුව ඉදිරියේදි සිදු නොවනු ඇත.

(ඉ). නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන/මානව සම්පත්) යනු ආයතනයේ ප්‍රධානියා නොවන අතර මෙම නිළධාරියා වයස අවු.60 සම්පූර්ණ නොවූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වසර 22 ක සක්‍රිය සේවා කාලයකින් පසු නීත්‍යානුකූලව විශ්‍රාම ගත් නිළධාරියෙක් වන හෙයින් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවය පැන නොනගී.
තවද ඔහුගේ පත්වීම් බලධාරියා වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වන හෙයින් මෙම නිළධාරියාට මෙම තනතුර ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ.

(ඊ) රාජ්‍ය වැවිලි සංස්ථාව ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් එහි පත්වීම් බලධාරියා වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වන බැවින් මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(උ) අප ආයතනය සතු වාහන 74 ක් අපහරණය කිරීම සඳහා යෝජිතය. අපහරණය කිරීමට සුදුස්ස වාහන හඳුනාගැනීමේ විශේෂ සමීක්ෂණ මණ්ඩල හා ඒදේ හඳුනාගත් වාහව තක්සේරු කිරීම සඳහා දිස්ත්‍රික් අනුව මණ්ඩල/කමිටු පත් කර ඇත.
කොළඹ දිස්ත්‍රික්කයට අදාල ඒක් වාහනයක් හා මාතලේ දිස්ත්‍රික්කයට අදාල වාහන 05 ක් අපහරනය සඳහා අප විසින් යෝජනා කල අතර ඒම වාහන අතරින් කොළඹ දිස්ත්‍රික්කයට අදාල වාහනය සහ මාතලේ දිස්ත්‍රික්කයට අදාල වාහනද 2 ක් පමණක් අපහරනය කිරීම සුදුසු බව මණ්ඩල/කමිටු විසින් අනුමත කර ඇත.

ඒබැවින් කොළඹ හා මාතලේ දිස්ත්‍රික්කවලට අදාල අපහරනය කිරීමට අනුමැතිය ලත් ඉහත වාහන 3 ට අදාල මණ්ඩල/කමිටු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ අපහරනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

මහනුවර දිස්ත්‍රික්කයට අදාලව අපහරනය කිරීම සඳහා යෝජිත වාහන 68ට අදාලව ද ඉහත සඳහන් කමිටු මණ්ල විසින් මේ වන විට වාහන භෞතිකව පරීක්ෂා කර අවසන් කර ඇති අතර ඒම මණ්ඩල/කමිටු වාර්තා ලැබීමට නියමිතය ඒම වාර්තා ලද පසුව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර ලැබෙන තීරණ අනුව කොළඹ හා මාතලේ දිස්ත්‍රික්කවලට අදාලව අඅපහරනය කලයුතු වාහන 3 ද ඇතුලත්ව පුවත්පත් දැන්වීම් පලකර නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ අපහරන කටයුතු කඩිනමින් කිමකිරීමට බලාපොරොත්තු වේ.

(ඌ) බඳවා ගැනීම් හා උසස් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධව මේ වන විට ප්‍රාථමික තනතුරු සඳහා පමණක් කළමණාකාර සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දී ඇති අතර ඉතිරි තනතුරු සම්බන්ධව අනුමැතිය ලබාදී නොමැත. නමුත් 2019 පැවැති රජය මගින් අප සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිතව තිබූ බැවින් මේ සඳහා අනුමැතිය හිමි නොවුන අතර අද වන විට අප රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධ කිරීමට නියමිත බැවින් ඒ අනුව මෙම අනුමත කිරීම් ඉදිරියේ දී සිදු කරන බව දන්වා සිටින ලදී.

(එ) 2024-2028 වර්ෂයට අදාල ව්‍යාපාර සැලැස්ම , ජාතික වැවිලි කළමණාකාර ආයතනයේ උපදෙස් මත පිළියෙළ වුවද , එම සැලස්ම පොදු ව්‍යාපාර කාරක සභාව මඟින් යලිත් පිළියෙළ කලයුතු බවට උපදෙස් දීම නිසා, එවකට සංස්ථාව අයත්ව තිබූ පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ උපදෙස් පරිදි, අමාත්‍යාංශයේ සැලසුම් අංශය මඟින් ප්‍රධාන කාර්යාලයේ විධායක නිලධාරීන් සහ වතු අධිකාරිවරුන් සම්බන්ධ කර ගනිමින් නැවතත් එම වාර්තාව සකස් කල අතර, එම වාර්තාව 2024.10.25 දින රේඛිය අමාත්‍යාංශයේ සැලසුම් අංශයට ඉදිරිපත් කරන ලදී. එවිට 2024 වර්ෂයේ අවසන් කාර්තුව නිසා ක්‍රියාකාරී සැලස්ම 2024 පිළියෙළ නොකර 2025 වසරේ සිට ක්‍රියාත්මක කරන ලදී.

2.3. වෙනත් කරුණු

(අ) කැලැබොක්ක 360 නැරඹුම් මධ්‍යස්ථානය පිහිටා තිබෙන්නේ කඳමුදුනෙහි බැවින් ස්වාභාවික ජල උල්පත් මගින් ජලය සපයා ගැනීමට අපහසුය. තවද, මෙම ස්ථානයේ විදුලිබලය නොමැති හෙයින් ජල පොම්පයක් ක්‍රියාත්මක කිරීමට ද නොහැකිය. නමුත් මෙම නැරඹුම් මධ්‍යස්ථානය සඳහා සපයා ඇති පහසුකම් ඉදිරියේදී වැඩිදියුණු කිරීමට අප බලාපොරොත්තු වෙමු. තවද, ඒම ස්ථානයට ලගා වීම සඳහා ඇති කිලෝමීටර් 06 ක පමණ මාර්ගය පිළිසකර කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කොට ඒය පළාත් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ). ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කාර්ය මණ්ඩලයට පරිපාලන සහ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩළය විසින් අනුමත කර ඇති අතර එම අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවේ පුරප්පාඩු වී ඇති සේවකයින් පමණක් පුවත්පත් දැන්වීම් පල කර සුදුසුකම්ලත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩළයක් හරහා නියමිත ක්‍රමවේදයට අනුව අදාල සුදුසුකම් හා පළපුරුද්ද සහිත අපේක්ෂකයින් පමණක් බඳවා ගෙන ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පරිපාලන නිලධාරී, සහකාර ක්ෂේත්‍ර නිලධාරී, කර්මාන්තශාලා නිලධාරී, ක්ෂේත්‍ර නිලධාරී, කණිෂ්ඨ වතු වෛද්‍ය නිලධාරී, ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී යන තනතුරු සඳහා නිලධාරීන් දෙනෙකු බඳවා ගැනීමේදී සාපේක්ෂව අවම වැටුපක් සාමූහික ගිවිසුමෙහි සඳහන්වන අතර එම 15 යේ රැකියාක්ෂේත්‍ර සඳහා පවතින අධික වෙළඳපල ඉල්ලුම මත සුදුසු වැටුප් තලයක නොපිහිටුවවහොත් ඉහත රැකියා සඳහා සුදුසුකම්ලත් සහ ක්ෂේත්‍රයේ පළපුරුදු අයදුම්කරුවන් කිසිවෙකුත් බඳවා ගැනීමට නොහැකි තත්වයක් නිරීක්ෂණය වී ඇතඑබැවින් පරිපාලන නිලධාරී ., සහකාර ක්ෂේත්‍ර නිලධාරී, කර්මාන්තශාලා නිලධාරී, ක්ෂේත්‍ර නිලධාරී, කණිෂ්ඨ වතු වෛද්‍ය නිලධාරී, ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුරු සඳහා සුදුසුකම්ලත් සහ ක්ෂේත්‍රයේ පළපුරුදු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා එහිදී ඔවුන්ගේ ක්ෂේත්‍රයේ පළපුරුද්ද, සුදුසුකම් හා එම ක්ෂේත්‍රයේ ලබාගත් වැටුප් විස්තර සලකා බලා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත ඔවුන්ව සුදුසු වැටුප්තලවල පිහිටුවා සේවයේ අත්‍යවශ්‍යතාවය සැලකිල්ලට ගෙන බඳවා ගැනීමට කටයුතු කරන ලදීදෙනෙකු මේ වන විට සේවය 9 න් දැනට 15 එහෙත් මෙම වැටුප්තලවල පිහිටුවුවද ඔවුන් . යේ දැනට බඳවා ගැමෙය වතු ක්ෂේත්‍ර .අතහැර ගොස් ඇතනීමේදී සිදු කරන සාමාන්‍ය ක්‍රමවේදය වන අතර අප අමාත්‍යාංශය යටතේ පවතින අනෙකුත් ආයතන ද මෙම ක්‍රමවේදයම අනුගමනය කර ඇතමයෙන් මෙම ක්‍ර . රව සාමූහික ගිවිසුමේ පවතින මූලික වැටුප් තලයේ සේවය කිරීමට පළපුරුදු කිසිදු සේවකයෙකු කැමති පරිබාහි නොවන අතර එසේ වුවහොත් වතුයායේ සේවක පුරප්පාඩු උග්‍ර වී වතු පාලනය අකර්මන්‍ය වීමට හේතු වේ.

එසේම වතු කළමණාකරණයේදී අත්‍යවශ්‍ය නොවන සහ අතිරේක පලපුරුදු නොමැති මූලික සුදුසුකම් පමණක් සපුරා ඇති අයදුම්කරුවන් සාමූහික ගිවිසුමෙහි සඳහන්වන පරිදි මූලික වැටුප් තලයේ පිහිටුවා බඳවා ගැනීමට කටයුතු කර ඇත.

එසේම වතුයායන්වල මෙහෙයුම් සහ පරිපාලන කටයුතු මනාව පවත්වාගෙන යාම සඳහා එම වර්ෂයේ අප්‍රියෙල් මාසය වන විට තනතුරු බාණ්ඩ 10ක් යටතේ පුරප්පාඩු 38ක් පැවතුනද 2024.04. හා 30 යන දෙදින පැවති සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගීවූ අයදුම්කරුවන්ගෙන් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබූ 30 ක් පමණක් බඳවා ගැනීමට

කටයුතු කරන ලදී. එසේ වුවත් මෙම බඳවා ගත් 30 දෙනාගෙන් සේවයට වාර්තා කරන ලද්දේ 20 දෙනෙකු පමණි.

එසේම ඉහත තනතුරු සඳහා වතු ක්ෂේත්‍රයේ සහ විවෘත රැකියා වෙළඳපොළෙහි පවතින දැඩි ඉල්ලුම හා ගෙවනු ලබන ඉහළ වැටුප් මත පළපුරුද්ද සහිත ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් අප ආයතනයේ ගෙවනු ලබන මූලික වැටුප්තල යටතේ බඳවා ගැනීමට අපහසු බව නිරීක්ෂණය වී ඇත. වතුයායන්වල වෘත්තීය සමිති සහ ආයතනය අතර අත්සන් කර ඇති සාමූහික ගිවිසුම අනුව මෙම තනතුර සඳහා අවම වැටුප සඳහන්වන අතර තවද සාමූහික ගිවිසුමෙහි සේවකයින් ශ්‍රේණිගත කිරීම පිළිබඳව "General Terms and Conditions" යටතේ ii කොටසෙහි " Grading of employees covered shall be at the discretion of the employer " ලෙසද දක්වා ඇත. තරඟකාරී රැකියා වෙළඳපොළෙහි පවත්නා ඉහළ ඉල්ලුම හා ගෙවන වැඩි වැටුප් හේතුවෙන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයින් අඩු වැටුප්තලවල පිහිටුවා බඳවා ගැනීමේ හා සේවයේ රඳවා ගැනීමේ අසිරුතාවයට ආයතනය මුහුණපා සිටින අවස්ථාවේදී අනෙකුත් ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අනුබද්ධ ආයතනවල සේවයට බඳවා ගැනීමේදී අනුගමනය කරන ක්‍රමය වන පළපුරුද්ද හා ඔවුන් අවසන්වරට ලැබූ වැටුප අනුව සුදුසු වැටුප් තලයක පිහිටුවා බඳවා ගැනීමේ ක්‍රමවේදය අප සංස්ථාව විසින්ද ක්‍රියාත්මක කරන ලද අතර ඉන් බැහැරව වෙනත් අනීතික හෝ අයථා ක්‍රමයක් අනුගමනය කර නොමැතිව සේවකයින් 15 දෙනෙකු එම අදාල වැටුප් තලවල පිහිටුවා බඳවා ගත්තද මොවුන්ගෙන් 9 දෙනෙකු ඉහළ වැටුප් අවශ්‍යතාවය මත සේවයෙන් ඉවත්වී ඇති අතර මෙම අමාත්‍යාංශ විගණන හා කළමණාකරණ රැස්වීම් සාකච්ඡා සටහන්වල පවතින පරිදි 2024 මැයි මස සිට රු.256,375/- ක් වැඩියෙන් ගෙවීම ලෙස සඳහන් කර තිබුණද එය මූල්‍ය ප්‍රකාශනවල දක්තයන්ට සම්පූර්ණයෙන් වෙනස් විය හැකි බව දන්වා සිටිමි. එනම් මෙවන විට මොවුන්ගෙන් 06 දෙනෙකු පමණක් සේවයේ යෙදෙන අතර ඔවුන්ගේ වැටුප් පරිමාණවල අගය වතුයේද රු.94,900/-කි. නමුත් මොවුන්ගේ සේවය ආයතනයේ සමස්ථ වටිනාකම ඉතාමත් ඉහළ පිටුවහලක් වී ඇත.

මේ සම්බන්ධව SLSPC/2025/BP/Admin/11/April 20422 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය වූයේ මෙම සේවකයින්ගේ මූලික වැටුපට වඩා පළපුරුද්ද සහ නිපුණතාවය මත ලබා දෙන දීමනාව වැඩි විය නොහැකි බව සහ එකී දීමනාව අදාළ සේවකයින්ගේ අවසන් වැටුපට ගැලපීම සිදු කළ යුතු බව වන අතර එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කටයුතු කරනු ලැබේ.

(ඇ) මීට අමතරව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව තුල මෝටර් කාර්මික දැනුම ඇති කිසිදු නිළධාරියෙකු සේවය නොකරන හෙයින් මෙම ආයතනයේ වාහන නඩත්තු කාර්යයන් සඳහා විශාල පිරිවැයක් පිටස්තර ආයතනවලට ගෙවීමට සිදුවීම හා නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවීමේ හේතුව මත මෝටර් රථ ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු බඳවා ගැනීමට ඇති අත්‍යවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් කෘෂිකාර්මික දැනුමැති මෝටර් රථ ක්ෂේත්‍රයේ වසර 22 ක පළපුරුද්දක් ඇති විශ්‍රාමික ගුවන් හමුදා සාමාජිකයෙකු ක්ෂේත්‍ර නිළධාරියෙක් ලෙස නියමිත ක්‍රමවේදය ඔස්සේ බඳවා ගැනීමට කටයුතු කළ අතර එමගින් වාහන අළුත් වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා වැයවෙන විශාල පිරිවැයක් ඉතුරු කර ගැනීමට අපේක්ෂා කළ අතර මොහු බඳවා ගැනීමෙන් අනතුරුව වාහන නඩත්තුව සඳහා සංස්ථාව වියදම් කළ මුදල් ප්‍රමාණය විශාල ලෙස අඩු වූ අතර දැනට ඔහු මෙම ආයතනයේ සේවයෙන් ඉල්ලා අස්වී ඇත. තවද මේ සම්බන්ධව පසුගිය වසර සඳහා වැයවී ඇති වියදම් පරීක්ෂා කර වර්ෂයේ ප්‍රවාහන කටයුතු සම්බන්ධව මූල්‍ය තත්වය පරීක්ෂා කිරීමෙන් තවදුරටත් ආයතනයට මෙම තීරණය මගින් සිදුවූ ඉතිරිය හඳුණා ගත හැක.

එසේම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වලහන්දුව රාජ්‍ය වතුයායේ අනවසරයෙන් ඉඩම් අල්ලාගැනීම සීඝ්‍රයෙන් ඉහළ ගොස් වතු අධිකාරීට හා එහි කාර්ය මණ්ඩළයට ඇතිවූ මරණීය තර්ජන හේතුවෙන් එම වතුයායේ පාලනය ආයතනයෙන් ගිලිහී ගොස් තිබීම හේතුවෙන් එම වතුයායේ ඉඩම් හා නිළධාරීන්ගේ ආරක්ෂාව සලසා ගැනීම පිණිස එහි සේවය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධාරීන් යොදවා ආරක්ෂක මුර පොළවල් දෙකක් ස්ථාපනය කිරීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්තුමාගෙන් ඉල්ලුම් කරන ලදී.ඒ අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් නිළධාරීන් පැමිණ වලහන්දුව රාජ්‍ය වතුයායේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ අතර එහිදී ඔවුන් එම වතුයායේ සන්නිවේදන පහසුකම්වල දුර්වලතාවය හා අනෙකුත් හේතූන් සඳහන් කරමින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සේවය සඳහා යෙදවීමට නොහැකි බව පවසා අපගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. (සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ඇමුණුම 2ලෙස අමුණා ඇත.). වතුයායේ ඉඩම් අනවසර අල්ලා ගැනීම්වලින් වැළැක්වීම ඉතා අත්‍යවශ්‍ය කරුණක් වූ හෙයින් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් නිළධාරීන් ලබා දීම ප්‍රතික්ෂේප කළ බැවින් සභාපතිතුමා ඇතුළු ඉහළ කළමණාකාරීත්වයේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මත ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ලබා ගත් කෘෂි ක්ෂේත්‍රය පිළිබඳ දැනුමැති නිළධාරීන් ක්ෂේත්‍ර නිළධාරීන් ලෙස බඳවා ගැනීමට තීරණය කරන ලද අතර ඉන් දෙදෙනෙකු පමණක් අද වන විට සේවයේ යෙදී සිටියි.

මෙවන් තත්වයක් මත වතුයායේ පාලනය ස්ථාපිත කිරීම පිණිස ඇති එකම විකල්පය ලෙස විශ්‍රාමික හමුදා නිළධාරීන් බඳවා ගෙන ක්ෂේත්‍ර රාජකාරියේ යොදවා වතු කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කොට පරිපාලනය යථාවත් කිරීම පිණිස ඉහළ කළමණාකාරීත්වයේ මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේද අනුමැතිය සහිතව කටයුතු කරන ලදී. ඒ අනුව මෙම නිළධාරීන් බඳවා ගැනීමෙන් පසුව වලහන්දුව රාජ්‍ය වතුයායේ වැඩ බලන වතු අධිකාරීවරයාද ස්ථාන මාරු කොට වලහන්දුව රාජ්‍ය වතුයාය සඳහා වතුයාය භාර නව සහකාර වතු අධිකාරීවරයෙකු පත් කරන ලදී. මෙම ක්‍රියාකලාපයන් නිසා අද වන විට එම සියළු හානිකර ක්‍රියාකාරීකම් අවසන් වී දැඩි ලෙස අලාභ සිදු වූ වතුයාය අද වන විට අලාභය ක්‍රමයෙන් අඩු වී ලාභ ලබන තත්වයකට පත් වෙමින් පවතී.

(ඇ) මෙහි සඳහන් පරිදි 2024/04/09 දින අලෙවිසැල ආරම්භ කරන ලදී.

මෙම වාර්තාවේ සඳහන් පරිදි පිටතින් මිළ දී ගත් ද්‍රව්‍ය වටිනාකම	රු.321340.00
ආපසු යවන ලද භාණ්ඩවල වටිනාකම	රු.(24086.01)
පිටතින් මිළ දී ගත් භාණ්ඩවල වටිනාකම	රු.297253.99
සංස්ථා තේ අලෙවියට තබා තිබූ ප්‍රමාණය	රු.137040.00
මුලු වටිනාකම	රු.434293.99

2025/06/17 දිනට විකුණුම් ආදායම රු.352706.25

ආයතනයේ සුබසාධක වෙළඳසැල පිහිටි ව.අඩි. 360 ක මෙම භූමි ප්‍රමාණය පිටස්තර පාර්ශවයන් විසින් රථවාහන ගාල් කිරීම සඳහා වසර ගණනාවක් භාවිතා කරණ ලදී. වටිනාකමින් ඉහළ දෙමටගොඩ පිහිටි මෙම භූමි ප්‍රමාණය ගැටුමකින් තොරව නැවත අප ආයතනය වෙත අත්පත් කර ගැනීමේ අරමුණින් මෙම සුභසාධක වෙළඳසල ආරම්භ කරන ලද අතර ආයතනය බලාපොරොත්තු වූ අලෙවි ආදායම මෙම අලෙවිසැලෙන් ලබා ගැනීමට නොහැකි බව පෙනියන ලදී. එම නිසා ආයතනයට ඉහල ආදායමක් ලබා ගැනීමේ අරමුණින් විකල්පයක් ලෙස දැනටමත් මෙම වෙළඳසැලට අදාළ කොටස තක්සේරු කර බදු පදනම මත බාහිර පාර්ශවයක් වෙත ලබාදීමට පාලනාධිකාරිය කටයුතු කරමින් පවතී.

(ඉ) ඔිපල්ගල වතුයාය නකල්ස් රක්ෂිතයට සහ ස්වරාක්ෂක කලාපයට යාබදව පිහිටා තිබීම නිසා ගස් කැපීම සඳහා අනුමැතීන් ලබාදීමට විශාල කාලයක් ගතවීමත්, මෙම වතුයාය සංස්ථාවේ අනෙකුත් වතුයායන්ගෙන් වෙන්ව ශුෂ්ක කලාපයට අයත්ව තිබීම නිසා අධික උෂ්ණත්වය සහ කාලගුණික බලපෑම් හේතුකොටගෙන මෙම ගස්වල අභ්‍යන්තරයේ භෞතික සැකැස්මට විශාල ලෙස හානිසිදුවේ(ඉරිතැලීම්, පැලීම්) එබැවින් සංස්ථාව සතු අනෙකුත් වතුයායන්වල ඇති ගස් හා සම වයසේ වුවත් මෙම ගස් දැව වටිනාකම අතින් අඩුවීමට මෙය ප්‍රධාන හේතුවක් විය.

2020 සිට පැවති කොවිඩ් වසංගතය හේතුකොටගෙන රටතුල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදු වූ දැඩි පසුබෑම හේතුකොටගෙන වාණිජමය දැව මිලදීගැනීමට කිසිදු ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවීම නිසාද මෙම දැව නිසිකාලයේදි ටෙන්ඩර් මගින් විකිණීමට නොහැකිවිය.

(ඊ) මැද රට කලාපයේ පවතින බෑවුම් තත්වය අනුව, සාමාන්‍ය වශයෙන් හෙක්ටයාර 01ට සම්මත තේ ගස් සංඛ්‍යාව 12500ක් ලෙස නිවැරදි විය යුතුය. එලෙසම කොටහග වතුයායේ දළ වශයෙන් 1ක හෙක්ටයාරයකට පවතින තේ පඳුරු සංඛ්‍යාව 4982කි. මෙය හුදෙක්ම වර්ෂ 100ට වඩා ඉපැරණි ඇට තේ වගාවන්වල තේ පඳුරු පරිහානියට ලක්වීම නිසා සිදුවූවකි. එලෙසම රංගල වතුයායේ ඇට තේ 1ක හෙක්ටයාරකට ඇති තේ පඳුරු සංඛ්‍යාව අනුව, 18%ක ප්‍රමාණයක් පමණක් ඇති අතර, රිකිළි තේ සඳහා 74.26%ක ප්‍රමාණයක් පමණ ඇත. මෙහිදී ඇට තේ වගාවන් නඩත්තු කිරීම ප්‍රායෝගිකව ලාභ තත්වයක් නොවන අතර, එම ඉඩම් තේ පරයේෂණ ආයතනයේ උපදෙස්වලට අනුකූලව, තේ පඳුරු ගලවා පස සාරවත් කොට නැවත, වගාකළ යුතුය. එලෙසම රිකිළි තේ වගාවන්වල කප්පාදු චක්‍රයේදි, මැරී ඇති පැළ නැවත සිටුවා යාවත්කාලීනකළ යුතු වේ.

)උ (2020 හා 2021 වසරවල රජය විසින් ක්‍රියාත්මක කරන ලද පොහොර සහනාධාරයට අනුව පොහොර මෙක්ට්‍රික් ටොන් 1 ක මිල රු.30,000/- ක් පමණ විය. එහිදී අප සංස්ථාවේ මූල්‍ය ශක්තිය අනුව 2020, 2021වර්ෂවල දි වතුයායන් වෙත පොහොර ප්‍රමාණයන් ලබාදෙන ලදි. ඊට සාපේක්ෂව දළු අස්වැන්න ද වැඩිවිය.

එලෙසම 2021 වරෂයේ අගභාගයේදි රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස ඇතැම් රසායනික පොහොර ආනයනය තහනම් කිරීම සිදුකරන ලදි. එබැවින් 2022 සහ 2023 වරෂයේදි අත්‍යාවශය පොහොර සුළු වශයෙන් මිලදි ගැනීම්

හැකියාවක් පැවතිණි. තවද රු.30,000/- ක්ව තිබූ පොහොර මෙට්ට්රික් ටොන් 1ක මිල රු.585,000/ දක්වා ඉහළයෑමක් සිදුවිණි. ඒ අනුව 2022 හා 2023 වර්ෂවල වතුයායන්ට පොහොර යෙදීම අවම මට්ටමකට පවැතුණි. ඒ අනුව දළු අස්වැන්නද ශ්‍රීසයෙන් පහත වැටිණි.ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙලෙස අධික ලෙස මුදල් යොදවා පොහොර යෙදීමට හැකියාවක් නොතිබිණි.

කෙසේ වෙතත්, 2023 වර්ෂයේ පොහොර මිල යම් ප්‍රමාණයකට අඩුවීම හේතු කොට ගෙන, පොහොර කිලෝ 128,000කට ආසන්න ප්‍රමාණයක් යෙදීමට හැකියාව තිබුණි. නමුත් අදායම් ලබන තේ ක්ෂේත්‍රයන් සඳහා මෙය 20%ක ප්‍රමාණයක් වේ. එයට සාපේක්ෂව තේ අස්වැන්න ද පහත බැස ඇත.

(උ) ඉහත සඳහන්කළ ආකාරයටම පොහොර මිල කීප ගුණයකින් ඉහළ යෑම හේතු කොට ගෙන 2022 සහ 2023 වර්ෂයේ නව වගාවන් සඳහා පොහොර යෙදීම ඉතාම අවම මට්ටමකට පත්විය.

මෙහිදී කොටගඟ සහ රංගල වතුයායන්ට පිළිවලින් පැළ සඳහා පොහෙර අවශ්‍යතාවයෙන් 39% ක් සහ රංගල වතුයායේ පැළ සඳහා 6.28%ක පමණ අවම පොහොර ප්‍රමාණයක් සංස්ථාවේ මුදල් ප්‍රවාහය මත මිලදී ගෙන යෙදීම සිදු කරන ලදි.

(එ) 2022 වරෂයේ තේ කරමාන්තශාලාවේ ලිප කොටස අධික ලෙස අබලන්වීම සිදුවිය. එය තුලින් කරමාන්තශාලාව ගින්නෙන් විනාශ වීම වලක්වා ගැනීම වස් කරමාන්තශාලාවේ වැඩ වහාම නතර කෙරිණි. මෙම කරමාන්තශාලාව 1984 වරෂයේ සිට 2022 වරෂය දක්වාම නවිකරණය කිරීමක් සිදුකර නොතිබිණි. ඒ අනුව නවින වෙළඳපලට අනුව ගුණාත්මක තේ නිෂ්පාදණය කිරීමට නම්, මීට සමගාමීව කරමාන්තශාලාව නවිකරණය කලයුතු බවට තේ පරීක්ෂණ මණ්ඩලයෙන්ද යෝජනා විය. ඒ අනුව කරමාන්තශාලාවේ වල ඇති දළු මැලවුම් ද්‍රෝණිවල වැඩ කටයුතු 80% ප්‍රමාණයක නිම කොට ඇත. නමුත් මෙම නවිකරණය කිරීම සහ අබන්වූ ලිප කොටස සඳහා නව ලිපක් ලබා ගැනීම සහ අනිකුත් නවින යන්ත්‍රෝපකරොණ සවිකිරීම සඳහා විශාල මුදල් අවශයව ඇත. මෙම කරමාන්තශාලාව නවීකරණය කර නිෂ්පාදනය සඳහා යෙදවීම අත්‍යවශ්‍ය කරුණක් උවත් තේ වගාවන් සඳහා පොහොර යෙදීම සහ අනෙකුත් කෘෂිකාරමික කටයුතු සිදුකර අස්වැන්න වැඩි කර ගැනීම ප්‍රමුකතම කරුණ වේ. ඒබැවින් සංස්ථාව සතු සීමිත මුදල් භාවිතා කොට ආයතනයේ අත්‍යවශ්‍ය වියදම් පියවීම සිදුකරන බැවින් කරමාන්තශාලාවේ නවීකරණ කටයුතු ප්‍රමුඛතාවයේ දෙවැනි කොටස ලෙස සිදුකිරීමට නියමිතය.

තවද මේවනවිට රංගල වතුයායේ තේ දළු අස්වැන්න අප සංස්ථාවේ ගෝමර වතුයාය මඟින් මිලදී ගෙන ගෝමර තේ කර්මාන්තශාලාවේ නිමි තේ නිෂ්පාදනය සඳහා යොදාගනී. එබැවින් රංගල වතුයායේ දළු අස්වැන්න බාහිර ගැනුම්කරුවන්ට විකිණීමක් සිදු නොවේ. රංගල තේ කර්මාන්තශාලාවේ ඉතිරි නවීකරණ වැඩ කටයුතු ඉදිරියේදී සංස්ථාවේ මූල්‍ය ශක්‍යතාවය අනුව හැකි ඉක්මනින් නිමකර නිමිතේ නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

(ඒ) රංගල වතුයායේ තේ කර්මාන්තශාලාවේ වහලය මත සූර්ය පැනල සවිකිරීමේ නියමු ව්‍යාපෘතිය සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කොට සුදුසු ලංසුකරුවකු තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාගනු ලැබිණි. මෙම ව්‍යාපෘතිය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් 2024.10.24 දින අනුමැතිය ලබා ගන්නා ලද අතර, එය මාස 6 ක කාලයක් සඳහා වලංගු විය. (2025.04.24 තෙක්)

එසේ වුවත් මෙම නියමු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2025 ජනවාරි මාසයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. එහිදී රංගල වතුයාය තුල ජලවිදුලි බලය (Hydro Power) ජනනය කිරීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳව පර්යේෂණ සිදු කිරීම සුදුසු බව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ඒ අනුව ඒ සම්බන්ධයෙන් අධ්‍යනය කොට වාර්තාවක් සකසා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව එහිදී ගනුලබන තීරණ අනුව මේ සම්බන්ධව සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ.

(ඔ) විගණන වාර්තාවේ සඳහන් වන්නේ රංගල වතුයායේ කල්දූරියා කොටසේ 2020 සහ2021 වර්ෂයන්හිදී ගම් පැල 2 600, යුකැලිප්ටස් පැල 1732, කැසියා පැල 250 න් සහ කුඹුක් පැල 10 ක් සිටුවීම සඳහා රු. 1,065,150 ක මුදලක් වැයකර ඇති බවත්, විගණනයේදී එම පැල සිටුවා නොතිබුනු බව තහවුරු වී ඇති බවත්ය. මෙම කරුණ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා අපහට දුෂ්කර වීමට හේතුව වී ඇත්තේ එම වතුයායේ එවකට වතු අධිකාරී ලෙස සේවය කල වතු අධිකාරී ඒ.සී. අබේවර්ණ මහතා මේ වනවිට ජීවතුන් අතර, නොසිටීමටත්, සහකාර වතු අධිකාරී ලෙස කටයුතු කල සී.ජේ. මාපා මහතා මේ වනවිට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා සේවයේ නොමැති වීමත්ය. නමුත් මේ වනවිට අප විසින් තොරතුරු සොයා බලමින් සිටින අතර, එම තොරතුරු ලබාගත් වහාම ජාතික විගණන කාර්යාලය වෙත යොමු කිරීමට අපේක්ෂා කෙරේ**.**

(ඕ) වලහන්දුව වතුයායේ පොල්වගා කටයුතු 2022 වසරේ ආරම්භ වූ අතර ඒම වත.ුයායේ පවතින කම්කරු හිගතාවය මත කොන්ත්‍රාත් ක්‍රමය යටකේ සියළුම වගා කටයුතු සිදු කෙරිනි. විගණන විමසුමේ සඳහන් පරිදි සිටුවන

ලද පොල් පැල සංඛ්‍යාවෙන් 72% ක පමණ ප්‍රමාණයක් විගණන දිනය වනවිට නොපැවතීමට හේතුවූ කරුණු වනුයේ ,

- වලහන්දුව රාජ්‍ය වතුයායේ පිහිටා ඇත්තේ ගාල්ල නගරය ආසන්නයේ වන අතර වතුයායට යාබදව සුනාමි ගම්මානයක්ද පිහිටා ඇත. එබැවින් මෙම වතුයායට අනවසර පදිංචිකරුවන්ගෙන් සහ ගම්වාසීන්ගෙන් ඇති බලපෑම ඉතා ඉහළය. මෙම හේතුව මත සිටුවන ලද පොල් පැල වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් බාහිර පුද්ගලයන් විසින් ගලවා ගෙන ගොස් ඇති බව වාර්තා වී ඇත.

- මෙම පොල් වගා කටයුතු සිදුකල 2022 සහ 2023 වර්ෂයන් වල රට තුල පැවති දරුණු ආර්ථික අර්බුධය මත එම පැල සඳහා ආරක්ෂක ආවරණ සපයා ගැනීමේ දුෂ්කරතාවයක් මතුවීම තුල නිසි ලෙස (බැරල්) පැල ආරක්ෂිතව ආවරණය කිරීමට නොහැකිවීම නිසාද සතුන්ගෙන් පැල වලට හානි සිදුවී පැල මිය යාමට හේතුවී ඇත

- මෙම පොල් වගා කටයුතු ආරම්භ කරන ලද 2022 වසරේදී රට තුලට ඇතැම් රසායනික පොහොර සහ වල්නාශක ආනයනය කිරීමේ තහනමක් පැවති අතර, අනෙකුත් රසායනික පෙහොර වල හිහතාවයක් සහ අධික මිලක් පැවතිනි. එබැවින් නව පොල් වගාවට අවශ්‍ය කරන පොහොර සහ වල්නාශක සපයා ගැනීමේ අසිරුතාවය මත පොල් පැල විනාශ විම

ඉහත සඳහන් කරුණු වලට අමතරව වලහන්දුව වතුයායේ ඉහත කාලයේ සේවයේ නියුතුව සිටි වැඩබලන වතු අධිකාරීවරයා සහ ක්ෂේත්‍ර නිළධාරීන් මෙම ව්‍යාපෘතිය නිසි ලෙස අධීක්ෂණය නොකිරීම හේතුවෙන් වැඩබලන වතු අධිකාරීවරයාගේ එම තනතුර ඉවත් කොට ඔහුගේ නිත්‍ය තනතුර වන සහකාර වතු අධිකාරී ලෙස කැලෑබොක්ක රාජ්‍ය වතුයාය වෙත ස්ථානමාරුවක් ලබාදී ඇත. ක්ෂේත්‍ර නිළධාරීන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ සේවය දැනට අත්හිටුවා ඇති අතර, අනෙක් ක්ෂේත්‍ර නිළධාරියා දැනට වතුයායේ සේවය කරනු ලබයි. ඔවුන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණකගේ පරීක්ෂණ වාර්තාව අනුව සුදුසු කටයුතු කරනු ඇත. තවද පොල් වගා කල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නොමැති අතර, රු. 4,650,000 ක මුදලක් රඳවාගෙන ඇත.

වලහන්දුව වතුයායේ කුරුඳු වගාව සම්බන්ධයෙන් විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි සිටවන ලද කුරුඳු පැල වලින් 75% මියයාමට ප්‍රධාන වශයෙන්ම බලපා ඇති සාධක වනුයේ එම කාලයේ රට තුලට ඇතැම් රසායනික පොහොර සහ වල්නාශක ආනයනය කිරීමේ තහනමක් පැවතිමත් අනෙකුත් රසායනික පෙහොර වල හිහතාවයක් සහ අධික මිලක් පැවතීමත්ය. පසුව ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් නව පැල සඳහා අවශ්‍ය වන පොහොර සපයා ගැනීමට නොහැකිවිය. තවද පැල සිටුවන ලද වගා ක්ෂේත්‍රයන්හි වල්පැල ගලවා නියමිත ආකාරයට පැල නඩත්තු කිරීමට අවශ්‍ය කම්කරුවන්ගේ හිඟයක් පැවතීමද ප්‍රමාණවත් වල්නාශක ලබාගැනීමට පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් නොහැකි වීමද යන කරුණුය. කොන්ත්‍රාත්කරු සමඟ එළඹී ගිවිසුම අනුව භූමිය නිසි අයුරින් සකස්කර නියමිත ප්‍රමිතියට කුරුඳු පැල සිටුවීම නිරීක්ෂණය නොකිරීම සම්බන්ධයෙන් එවකට වලහන්දුව වතුයායේ සේවයේ නියුතුව සිටි වැඩබලන වතු අධිකාරීවරයා ඉහත සඳහන් කල පරිදි මේවනවිට මෙම වතුයායෙන් මාරු කොට යවා ඇත. තවද කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුමේ සඳහන් ආකාරයට කාණු දැමීම වලවල් කැපීම, පැල සිටුවීම ආදී කටයුතු නිසි පරිදි සිදු නොකිරීම නිසා ඔහුට ගෙවිය යුතු මුදලින් රු. 1,750,000 ක් නොගෙවා අත්හිටුවා ඇත. මේ සම්බන්ධයෙන් සංස්ථාවේ අභ්‍යන්තර විගණක විසින් පූර්ණ විමර්ශණයක් සිදු කරගෙන යමින් පවතින අතර, ඒ අනුව ඉදිරියේදී අවශ්‍ය සුදුසු කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

පැල කරන ලද තේ පැල වලින් 51% ක්ම භූමියේ නොතිබුනු බව විගණන වාර්තාවේ සඳහන් වන අතර, මේ ආකාරයට තේපැල මිය යෑමට ප්‍රධානතම හේතු ලෙස දැක්විය හැක්කේ නව තේ වගාව සඳහා අවශ්‍ය පොහොර සහ වල් නාශක සපයා ගැනීමට එවකට රටතුල පැවති රසායනික පොහොර තහනම සහ හිහතාවය මත නොහැකිවීමත් සංස්ථාව තුල පැවතින මූල්‍ය දුෂ්කරතා හමුවේ නිසි කලට පොහොර සපයාගැනීමට නොහැකි විමත්ය. එලෙසම නිසි ලෙස වල් ඉවත් කොට වගා ක්ෂේත්‍රය නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය වල් නාශක ලබාදීමටද නොහැකි විය. වලහන්දුව වතුයායේ පවතින උග්‍ර කම්කරු හිඟය නිසා මිනිස් ශ්‍රමය යොදා ක්‍රමවත්ව වල් නෙලීමට බාධාඇතිවී ඇත. තවද මෙම නව පැල සිටුවන ලද 2022 සහ 2023 වසරවල බොහෝ කාලයක් පැවති අඩු වර්ෂාපතනයක් සහිත වියලි කාලගුණික තත්වයද නව තේ වගාව සඳහා අහිතකර ලෙස බලපා ඇත. තේ වගාවේදී අනුගමනය කලයුතු නියමිත ආකාරයට පැල සිටුවීම, කානු හා ගල්වැටි දැමීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලින් කොටසක් නොගෙවා අත්හිටුවා ඇත. ඒ අනුව රු. 457,000 ක මුදලක්ද ආපසු ගෙවනු ලබන තැන්පතුවෙන් (Refundable deposit) රු. 355,200 ක්ද නොගෙවා ඇත. තවද එවකට වලහන්දුව වතුයායේ වැඩබලන වතු අධිකාරීවරයාට මේ වනවිට සේවා ස්ථාන මාරුවීමක් ලබාදී මෙම වතුයාය සඳහා නව වැඩ බලන වතු අධිකාරීවරයෙකු පත්කොට ඇත. තවද ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් නිසි කලට පොහොර සපයා ගැනීමට නොහැකි වීමද තේ වගාව අසාර්ථක වීමට බලපා ඇත.

(ක) අඩුවෙන් සටහන් වී ඇති වතු 05 නැවත මැණුම් කර වඩාත් නිවැරදි මැනුමක් ලබාදෙන ලෙසට අප විසින් අප අමාත්‍යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇත. එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී.

ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩිපුර ප්‍රමාණයක් වාර්තා වී ඇති හුන්නස්ගිරිය වතුයායේ ඉඩම් ප්‍රමාණය ගැසට් පත්‍රයට ඇතුලත් කිරීමේ දී මැනුමක් සිදු කර නොමැති කාරණය නිසා එසේ අඩු අගයක් සටහන් වී ඇති බවට විශ්වාස කරමු.



ස්තුතියි